# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# දසවැනි පාර්ලිමේන්තුව
**(පළමුවැනි සභාවාරය)**

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 390

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ
ස්ථාවර නියෝග 125(5) යටතේ ඉදිරිපත් කරනු ලබන
2025.06.01 දින සිට 2025.08.31 දින දක්වා වූ කාල සීමාව සඳහා

# මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ
# දෙවැනි වාර්තාව

**ඉදිරිපත් කරන ලද්දේ**
**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති**

**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා විසිනි**

2025 දෙසැම්බර් මස 05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියම කළේ**
**2025 දෙසැම්බර් මස 05 දින**

# වාර්තාව

**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 (1) ප්‍රකාරව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවක් වන්නේය.

**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්**

1 ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා, පා.ම., (සභාපති)
2 ගරු උපාලි සමරසිංහ මහතා, පා.ම.
3 ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
4 ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම. (2025.09.10 දින පත් කර ඇත)
5 ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම.
6 ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.
7 ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
8 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
9 ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.
10 ගරු අජිත් අගලකඩ මහතා, පා.ම.
11 ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම.
12 ගරු උපුල් කිත්සිරි මහතා, පා.ම.
13 ගරු චමින්ද ලලිත් කුමාර මහතා, පා.ම.
14 ගරු අජිත් ගිහාන් මහතා, පා.ම.
15 ගරු අශෝක ගුණසේන මහතා, පා.ම.
16 ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.
17 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම.
18 ගරු නන්දන පත්මකුමාර මහතා, පා.ම.
19 ගරු නිශාන්ත පෙරේරා මහතා, පා.ම.
20 ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා, පා.ම.
21 ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.
22 ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
23 ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
24 ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය, පා.ම.
25 ගරු මනෝජ් රාජපක්ෂ මහතා, පා.ම.
26 ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය, පා.ම.
27 ගරු ජගත් විතාන මහතා, පා.ම.
28 ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය, පා.ම.
29 ගරු මුහම්මද් ෆයිසාල් මහතා, පා.ම.

දසවන පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය සඳහා වූ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, 2025 අගෝස්තු මස 07 වන දින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ පළමු වන වාර්තාව (පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 250) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125(5) ප්‍රකාරව කාරක සභාවේ දෙවන වාර්තාව 2025.12.05 වන දින මෙසේ ඉදිරිපත් කර සිටියි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125(5) ප්‍රකාරව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාවට 2025 ජූනි මස 01 වැනි දින සිට 2025 අගෝස්තු මස 31 වැනි දින දක්වා විභාග කරන ලද මහජන පෙත්සම්වලට අදාළව කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශයන් සහ කාරක සභා විභාග කිරීම් අතර නිරීක්ෂණය වූ විශේෂ කරුණු ඇතුළත් කර ඇත.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, එහි පළමු වාර්තාව මඟින් මහජන පෙත්සම් විභාග කිරීම සඳහා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය, කාරක සභාවේ වර්තමාන ක්‍රියාකාරිත්වය, කාරක සභාව වෙත යොමු කර ඇති පෙත්සම් සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන පිළිවෙළ, කාරක සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ, කාරක සභාවට නිරීක්ෂණය වූ විශේෂ කරුණු සහ වෙනත් නිරීක්ෂණ පිළිබඳ විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කරන ලදී.

කාරක සභාවේ පළමුවැනි වාර්තාව පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර, එය https://www.parliament.lk/uploads/comreports/1759903869089793.pdf#page=1 ඔස්සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් භාගත කළ හැකිය.

ස්ථාවර නියෝග 125(6) සහ 125(7) අනුව පළමු වාර්තාවේ නිර්දේශ ලබා දුන් පෙත්සම් 39ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම පිණිස අමාත්‍යාංශ නවයක් වෙත යොමු කර ඇත.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් 2025 ජූනි මස 01 වැනි දින සිට 2025 අගෝස්තු මස 31 වැනි දින දක්වා  පෙත්සම් විභාග කිරීම සඳහා රැස්වීම් වාර 11 ක් පවත්වා ඇති අතර විභාග කරන ලද පෙත්සම් සංඛ්‍යාව 65 ක් වේ. ඒ අතුරෙන් නිර්දේශ ලබා දී ඇති පෙත්සම් සංඛ්‍යාව 25ක්ද, සහන නිර්දේශ නොකරන ලද පෙත්සම් සංඛ්‍යාව 26ක්ද, නිර්දේශ ලබා දීම කල් තබන ලද පෙත්සම් සංඛ්‍යාව 14ක්ද වේ.

විභාග කරන ලද එම පෙත්සම් 65 සම්බන්ධයෙන් වූ තොරතුරු, අපේක්ෂිත සහන, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු සහ කාරක සභාවේ නිර්දේශ - ඇමුණුම I හි දක්වා ඇත.

**<u>මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 30 ප්‍රකාරව, මන්ත්‍රීවරයකු විසින් මහජන පෙත්සමක් පාර්ලිමේන්තුවට පිළිගැන්වීමෙන් පසු එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලැබේ.අනතුරුව, ස්ථාවර නියෝග අංක 125(3) ප්‍රකාරව පෙත්සමෙහි ඉදිරි කටයුතු කාරක සභාව විසින් සිදු කරනු ලැබේ.

**ස්ථාවර නියෝග 125(3)** “ රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මගින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන අවස්ථාවක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම පෙත්සම විභාග කරනු ලැබීම හෝ විභාගකොට වාර්තා කරනු ලැබීම සඳහා එය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලැබිය හැකිය.”

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් **ස්ථාවර නියෝග 125 (3)** අනුව විභාග කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව සිය අවසාන මතය ද අදාළ විභාග කිරීම් අතරතුර නිරීක්ෂණය කරන ලද කරුණු ද **මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇති අතර, ස්ථාවර නියෝග 125(6) හා 125(7) අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ගරු කථානායකතුමා වෙත මෙම වාර්තාව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කර සිටියි.**

**ස්ථාවර නියෝග 125(6)** *“ වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය.”*

**ස්ථාවර නියෝග 125(7)** *“ අදාළ යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ ලැබීමෙන් අනතුරුව, එම නිරීක්ෂණවල පිටපතක් කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයාට සහ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ මන්ත්‍රීවරයාට යොමු කරනු ලැබිය යුත්තේ ය. ඒ අනුව ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත් නොවන්නේ නම්, සුදුසු ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අමාත්‍යවරයා මාසයක් ඇතුළත අවශ්‍ය පරිදි කටයුතු කළ යුතු අතර, එම කාර්ය ඉටු නොකිරීමට කරුණු ලිඛිතව ඉදිරිපත් කර සලකා බලනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කළ යුත්තේ ය. ”*

**<u>පෙත්සම් විභාග කිරීමේදී කාරක සභාව විසින් සම්මත කර ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ</u>**

(i) රජයේ පාසැල්වල කිසිදු ශ්‍රේණියක් සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් වන පෙත්සම් පිළිබඳව සලකා නොබැලීම.

(ii) යම්කිසි පෙත්සමක ඇතුළත් කරුණු සම්බන්ධව පෙත්සම ඉදිරිපත් කරන අවස්ථාවේ හෝ පසුව අධිකරණමය ක්‍රියාමාර්ගවලට එළඹ ඇත්නම්, එම අධිකරණමය ක්‍රියාමාර්ග අවසන් වන තෙක් එම පෙත්සම් විභාගයට නොගැනීම

(iii) කාරක සභාව විසින් විභාග කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප/නිශ්ප්‍රභා කරන ලද පෙත්සම් කාරක සභාව විසින් නැවත සලකා බැලිය යුතු යැයි තීරණය කළහොත් හැර සලකා නොබැලීම.

(iv) රාජ්‍ය ප්‍රතිපත්තිවලට පටහැනි කරුණු සම්බන්ධයෙන් වන පෙත්සම් පෙත්සම්කරු කැඳවීමකින් තොරව විමර්ශනය කිරීම.

(v) පෙත්සම භාර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කාරක සභාවේ සාමාජිකයෙකු නොවන අවස්ථාවක දී එම පෙත්සම සලකා බැලීමට නියමිත දිනය අදාළ මන්ත්‍රීවරයාට දැනුම් දීම සහ විමර්ශන අවස්ථාවේදී සහභාගීවීමට අවසර ලබා දීම

(vi) වසර පහළොවකට (15) පෙර සිදු වූ සිදුවීමක් සම්බන්ධයෙන් ප්‍රථම වතාවට කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම් පිළිබඳව කටයුතු නොකිරීම.

(vii) පෙත්සම ඉදිරියට ගෙන යාමට පෙත්සම්කරු උනන්දුවක් නොදක්වන්නේ නම් එම පෙත්සමේ කටයුතු අවසන් කිරීම.

(viii) යම් පෙත්සමක් පිළිබඳව අදාළ අමාත්‍යාංශය වෙතින් කැඳවන වාර්තාව මාස තුනක් ඇතුළත නොලදහොත්, එම පෙත්සම අමාත්‍යාංශ වාර්තාවක් නොමැතිව සලකා බැලීම.

**<u>කාරක සභාවට නිරීක්ෂණය වූ විශේෂ කරුණු</u>**

(i) විවිධ අවස්ථාවන්හිදී චක්‍රලේඛ මගින් රාජ්‍ය සේවයට ප්‍රතිපත්තිමය තීරණයන් පදනම් කර ගනිමින් හෝ වෙනත් කරුණු මත රාජ්‍ය සේවක පත්වීම් ලබා දීම හේතුවෙන් සේවය ස්ථිර කිරීම, විශ්‍රාම වැටුප් ලබා දීම හා සක්‍රිය සේවා කාලය ගණනය කිරීම වැනි කරුණුවලට අදාළ ගැටලු සඳහා සහනය අපේක්ෂාවෙන් පෙත්සම්කරුවන් ලෙස පැමිණි රාජ්‍ය සේවකයන් මෙන්ම රාජ්‍ය නිලධාරින්ද අදාළ ගැටලු නිරාකරණයේදී විවිධ දුෂ්කරතාවයන්ට/විවිධ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පා ඇති බවත් වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබා දීම සම්බන්ධ ගැටලු ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවය වැඩි වී ඇති බැවින් ඒ සම්බන්ධව අදාළ සියලු පාර්ශ්වයන්ගේ මැදිහත්වීමෙන් ප්‍රතිපත්තිමය තීරණයන්ට එළඹිය යුතු බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

(ii) විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන රු.50,000/- කරුණා සහගත දීමනාව ඉහළ නැංවිය යුතු බවත් ඒ සඳහා මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු බව

(iii) රජයේ සේවයේ නියුතු නිලධරයන් (පෙත්සම්කරුවන්) සම්බන්ධයෙන් විවිධ ගැටලුකාරී තත්ත්වයන් මතුවූ විට එම ගැටලු සඳහා විසඳුම් ලබා දීමට කඩිනම් පියවර නොගැනීමත්, වැටුප් වර්ධක සම්බන්ධයෙන් ගනු ලබන තීරණ නිසි කලට ක්‍රියාත්මක නොකිරීමත් හේතුවෙන් දීර්ඝකාලීනව පෙත්සම්කරුවන් (රාජ්‍ය සේවකයන්) අගතියට පත්වීම

(iv) එසේ කඩිනමින් නිවැරදි කිරීම්/විසඳුම් ලබා නොදීම හේතුවෙන් පෙත්සම්කරුවන් අගතියට පත්වන අතර කාරක සභාව විසින් පෙත්සම විභාග කරන අවස්ථාවේදී අදාළ පෙත්සම්කරුවන්හට සහන ලබා දීමේ නෛතික ප්‍රතිපාදන නොමැති බැවින් පෙත්සම්කරුවන් ඉල්ලා සිටින සහන හිමිකම් නිර්දේශ ලබා දීමට නොහැකි වුවද, එහිදී පෙත්සම්කරුවන් සැබැවින්ම අසාධාරණයට ලක්වී ඇති බව

(v) විනය පරීක්ෂණ/ විනය නියෝග නිකුත් කිරීම බොහෝ අවස්ථාවන්හිදී කඩිනමින් සිදු නොවන බවත් එමගින් පෙත්සම්කරුවන් (රාජ්‍ය සේවයේ යෙදුනු) අගතියට පත්ව ඇති බව

(vi) දේශපාලන පළිගැනීම් කමිටු පිහිටුවීම/ස්ථාපනය කිරීම හා ඒවා මගින් නිර්දේශ ලබා දීමේදී ගැටලු මතු වන බව

(vii) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා විමර්ශනයට ලක් කළ යුතු කරුණු පෙත්සම්කරුවන්ගේ පෙත්සම් මගින් අනාවරණය වීම සහ ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතු බව

(viii) ව්‍යවස්ථාපිත ආයතනයන් මඟින් පත් කිරීම්/ උසස් කිරීම්/ සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමේදී පාරදෘෂ්‍යභාවයකින් යුතුව කටයුතු කිරීම මඟින් බොහෝ ප්‍රශ්නකාරී/ගැටලුකාරී තත්ත්වයන් නිරාකරණය කරගත හැකි බව

(ix) පරිපාලන චක්‍රලේඛ නිකුත් කිරීමේදී ද්වි අරුත් ගැන්වෙන වචන/ අපැහැදිලි හෝ එබඳු අරුත් ඇති නොවන පරිදි විධිමත්ව නිකුත් කිරීම

ඇමුණුම I

## 1) නිර්දේශ ලබා දී ඇති පෙත්සම්

### 1. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | එස්.එල්. ෆාතිමා රියානා මහත්මිය COM/PP/2025/182 ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.03 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/2/29/3/2/255 දිනය : 2016.12.19 | 1992 වර්ෂයේ සිට ස්වේච්ඡා ගුරුවරියක ලෙස මප/ගම්/නාවලපිටිය කනිෂ්ඨ බාලිකා විද්‍යාලයේ සේවය කළ අතර 1996 වර්ෂයේදී අභ්‍යාසලාභී ගුරුවරුන් බඳවාගැනීමේ තරග විභාගයට පෙනී සිට ලකුණු 110ක් ලබාගත් බවත්, ඊට අඩු ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ට පවා පත්වීම් ලැබුණද පෙත්සම්කාරිය හට පත්වීමක් නොලැබුණු බවත්, 2015 වර්ෂයේදී තාවකාලික ගුරු සහායක පත්වීමක් ලද බවත්, මේ සම්බන්ධයෙන් විභාග කර සහනයක් සලසා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) ගුරු සහායක පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසියක් වන වසර 05ක් තුළ ගුරු පුහුණුව සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය පෙත්සම්කාරිය විසින් සම්පූර්ණ කර නොමැති බැවින් එම තනතුරෙහි ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව<br><br>(ආ) 1996 වර්ෂයේදී පැවති ගුරු ආධුනිකයින් බඳවා ගැනීමේ විභාගයේදී ලකුණු 110ක් ලැබුවද, සම්මුඛ පරීක්ෂණයේදී පෙත්සම්කාරිය ලකුණු ලබා ගත් ආකාරය නිසි පරිදි තහවුරු කර නොමැති බැවින්, 1998 වර්ෂයේදී ගුරු පත්වීම ලබා නොදීමට නිශ්චිත හේතුව පැහැදිලි කර ගත නොහැකි බව හා අදාළ ලිපිලේඛන හා ප්‍රමාණවත් තොරතුරු නොමැතිව අභ්‍යාසලාභී ගුරු පත්වීමක් නිර්දේශ කළ නොහැකි බව<br>(ඇ) අභ්‍යාසලාභී ගුරුපත්වීම ලබා දෙන ලෙස 08 වන සහ 09 | එක් වරක් පමණක් ගෙවනු ලබන සානුකම්පිත දීමනාවක් හිමි ගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බව නිර්දේශ කරන ලදී.<br><br>අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමේදී පෙත්සම්කාරියට පෞද්ගලික වන පරිදි එය ඉදිරිපත් කළ යුතු බවටත්, එහිදී පෙත්සම්කාරියගේ අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) අධ්‍යාපන සුදුසුකම් ආදිය පරීක්ෂා කර බැලිය යුතු බවටත් දැනුම් දෙන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | වන පාර්ලිමේන්තු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මඟින් ලබා දුන් නිර්දේශයන් මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැති බව | |
| 02 | ඩබ්.කේ.එස්. රුක්ෂාන් මහතා COM/PP/2025/204 ගරු ටී.කේ.ජයසුන්දර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.03 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : ED/04/60/04/02/SP/ 15/2024 දිනය : 2024.12.31 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකු වන පෙත්සම්කරුහට ගා/ රිච්ඩ් පතිරණ විද්‍යාලයේ සිට ගා/ මහින්ද විද්‍යාලය වෙත ස්ථාන මාරුවක් ලැබුණු නමුත්, පෙත්සම්කරුගේ ශ්‍රේණියේම නිලධාරියකු එම තනතුර සඳහා නිර්දේශ කර තම ස්ථාන මාරුව අවලංගු කළ බවත් සඳහන් කරන පෙත්සම්කරු ස්ථාන මාරුව නැවතත් ගාල්ල මහින්ද විද්‍යාලය වෙත ලබා දීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුණි. | (අ) ගා/මහින්ද විද්‍යාලයට ස්ථාන මාරුවක් ලබා දී ඇතත්, සේවා අවශ්‍යතාවය අනුව විදුහල්පති III ශ්‍රේණියේ නිලධරයකු වූ පෙත්සම්කරුගේ සේවය, ඒ සඳහා ගලපා ගත නොහැකි බැවින් විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නැතහොත් අධ්‍යාපන පරිපාලන සේවයේ II / III ශ්‍රේණියේ නිලධරයකු පත් කර දෙන ලෙස ගා/මහින්ද විද්‍යාලයේ එවකට සිටි විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති බැවින් පෙත්සම්කරුගේ ස්ථාන මාරුව අවලංගු කළ බව හා නැවත ගා/මහින්ද විද්‍යාලයට ස්ථාන මාරුවක් සඳහා ඉල්ලීමක් කර තිබුණද ඒ වන විට එම පාසලේ විදුහල්පති සේවයේ පුරප්පාඩු නොතිබූ බැවින් එම ඉල්ලීමද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර ඇති | 2025 වර්ෂයේ ඔක්තෝබර් මස නිලධාරියකු විශ්‍රාම යාම හේතුවෙන් ගා/මහින්ද විද්‍යාලයේ ඇති වන ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියේ පුරප්පාඩුව සඳහා දැනට විදුහල්පති II ශ්‍රේණියේ නිලධරයකු වන පෙත්සම්කරු පත් කළ යුතු බවට නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | බව<br>(ආ) විධිමත් ස්ථාන මාරුවක් ලබා නව සේවා ස්ථානයකට වාර්තා කිරීමේදී රාජකාරි භාර නොදීම නීතියට පටහැනි ක්‍රියාවක් බව හා පෙත්සම්කරු හට අසමාන ලෙස සලකා ඇති බව නිරීක්ෂණය වන බව | |
| 03 | ජී.එම්.ලයනල් මහතා COM/PP/2025/155 ගරු තනුර දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.17 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/02/29/03/02/413 දිනය : 2022.01.19 | විශ්‍රාමලත් විදුහල්පතිවරයෙකු වන පෙත්සම්කරු, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති 2007.09.07 දින දක්වා වන සේවා දිගුව ලබාදී විශ්‍රාම ගිය දිනය 2007.09.07 ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා 09 වන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලද පෙත්සම විභාග කොට, 2007.09.07 දින දක්වා කාල සීමාව විශ්‍රාම වැටුප ගණනය සඳහා අදාළ කර ගන්නා ලෙස ලබා දුන් තීන්දුව මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැති බව සඳහන් කර සාධාරණය ඉටු කර දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) වත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පෙත්සම්කරු විසින් ඉල්ලුම් කරන ලද සේවා දිගුවට අදාළ ලිපිලේඛන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2007.04.30 දින විශ්‍රාම ගැනීමට සිදුව ඇති බව<br>(ආ)එම සේවා දිගුව නිසි කලට අනුමත වූයේ නම් 2007.09.07 දක්වා සේවයේ නිරත වීමට අවස්ථාව තිබූ බව<br>(ඇ) සේවා දිගුව අහිමි වීම හේතුවෙන් විදුහල්පති දීමනාව ඇතුලු අනෙකුත් දීමනා අහිමි වීම හේතුවෙන් මූල්‍යමය පාඩුවක් සිදුව ඇති බව<br>(ඈ) පෙත්සම්කරුගේ සේවා කාලය, විශ්‍රාම වැටුප් ගණනයට අදාළ කර ගත හැකි උපරිම සේවා කාලය වන වසර 30 ඉක්මවා ඇති | 2007.04.30 සිට සේවා දිගුව ලැබූ 2007.09.07 දක්වා වූ කාලසීමාව ඇතුළත හිමි විය යුතුව තිබූ වැටුප (දීමනාද ඇතුළත්ව) ගණනය කර, 2007.04.30 සිට 2007.09.07 දක්වා ලබාගත් විශ්‍රාම වැටුපෙහි වෙනසෙහි මූල්‍යමය අගය පෙත්සම්කරු වෙත ගෙවන ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | බැවින් සේවා දිගුව හේතුවෙන් විශ්‍රාම වැටුපෙහි කිසිදු වෙනසක් සිදු නොවන බව<br>(ඉ) ආයතනික ප්‍රමාදවීම් මගින් පෙත්සම්කරු මූල්‍යමය අගතියකට පත්ව ඇති බව | |
| 04 | එස්.ඒ.එස්.ප්‍රදීපිකා සුරේන්ද්‍රා මහත්මිය COM/PP/2025/237 ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.25 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/05/152/03/01 /2017-29<br>දිනය : 2017.05.31 | සෞන්දර්ය කලා උපාධිධාරිනියක බවත් 1997 වසරේ සිට මේ දක්වා කිසිදු ගෙවීමක් නොමැතිව ස්වේච්ඡා ගුරුවරියක වශයෙන් මාර/විජිත මධ්‍ය විද්‍යාලයේ සේවය කරන බවත්, 2012.01.18 දින අමාත්‍යාංශය විසින් ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ නමුත් සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා තිබුණද පත්වීම නොලැබුණු බවත් සඳහන් කර ඇති පෙත්සම්කාරිය, ස්ථිර පත්වීමක් ලබාදෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල ප්‍රමාණවත් නොවීම මත ගුරු සහායක තනතුරට තෝරා ගෙන නොමැති බව<br>(ආ) 1997 සිට 2014 දක්වා වසර 17ක පමණ කාලයක් නර්තන ගුරුවරියක ලෙස ප්‍රශංසාත්මක සේවයක් පෙත්සම්කාරිය විසින් මාර/විජිත මධ්‍ය විද්‍යාලය වෙත ස්වේච්ඡා පදනම මත ලබා දී ඇති බව<br>(ඇ) නර්තන විෂය සම්බන්ධව අමතර සුදුසකම් රැසක් හිමි පෙත්සම්කාරිය මේ වන විට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රාසාංගික කලාවේදී (බාහිර) සාමාන්‍ය උපාධි පාඨමාලාවේ අවසන් වසර උපාධිය හදාරා ඇති බව | පෙත්සම්කාරියගේ අධ්‍යාපන සුදුසුකම් විධිමත් පරිදි පරීක්ෂා කොට උපාධිධාරී පදනම මත ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I ශ්‍රේණියට පත්වීමක් ලබා දීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා පෙත්සම්කාරියට පමණක් සීමාවන සේ සහ පූර්වාදර්ශයක් නොවන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ I ශ්‍රේණියට පත්වීමක් ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 05 | ජී. ජයතිස්ස මහතා COM/PP/2025/319 ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.25 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : HE/AD/03/ම.පෙ.කා. ස.(2021/515) දිනය : 2021.08.17 | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර අධ්‍යයන මධ්‍යස්ථානයේ කටයුතු භාර නියෝජ්‍ය ලේඛකාධිකාරී වශයෙන් සේවය කළ බවත්, 2012.09.28 දින සිට අසත්‍ය චෝදනා මත වැඩ තහනම් කළ බවත්, පසුව වයස 60 න් විශ්‍රාම ගන්වා හිඟ වැටුප් ගෙවන ලද බවත්, අදාළ සියලු දීමනා නිවැරදිව ගෙවා නොමැති බවත් සඳහන් කර ඇති පෙත්සම්කරු, අර්ථසාධක අරමුදල්, ව්‍යවස්ථාපිත දීමනා ඇතුළු අනෙකුත් දීමනා, වැටුප් සහ වරප්‍රසාද ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුනි. | (අ) 2024.01.24 දින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දී එළැඹි තීරණයක් අනුව පෙත්සම්කරුගේ අර්ථසාධක අරමුදල ගණනය කර ඇති ආකාරය පිළිබඳව කම්කරු කොමසාරිස් ජනරාල්ගෙන් ඒ පිළිබඳව වාර්තාවක් කැඳවීමට කටයුතු කර ඇති බව<br><br>(ආ) කම්කරු කොමසාරිස් විසින් යොමු කර තිබූ වාර්තාව අනුව පෙත්සම්කරුගේ අර්ථසාධක අරමුදල පිළිබඳව සිදු කර ඇති ගණනය කිරීම් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ බලධාරීන් විසින් නිත්‍යානුකූලව සිදු කර ඇති බව<br><br>(ඇ)අර්ථසාධක අරමුදල් වෙනුවෙන් ලබා දුන් 2015.12.31 දිනැති චෙක්පත පෙත්සම්කරු විසින් ප්‍රතික්ෂේප කර ඇති බව | අදාළ අර්ථසාධක අරමුදල මසක කාලයක් තුළ පෙත්සම්කරු වෙත ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස නිර්දේශ කරන ලදී.<br><br>තවද මෙම නිර්දේශය කාරක සභාවේ අවසන් තීරණය බවද, පෙත්සම්කරු යථෝක්ත මුදල භාර ගැනීමට එකඟ නොවේ නම් ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වීමේ හැකියාව පෙත්සම්කරුට ඇති බවද දන්වා සිටින ලදී. |
| 06 | වයි.ආර්. වජිර ප්‍රේමවර්ධන මහතා COM/PP/2025/153 ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.17 දින විභාග කරන ලදි. | කැළණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නියාමකවරයෙකු ලෙස සේවය කළ බවත්, ආරක්ෂක නියාමක ඉහළ ශ්‍රේණිය තනතුර සඳහා උසස්වීම සහ ආරක්ෂක නියාමක අධිශ්‍රේණිය තනතුර සඳහා උසස්වීම යන උසස්වීම් ද්විත්වයම අහිමි කළ බවත් සඳහන් කරන පෙත්සම්කරු එම උසස්වීම් | (අ) දුර්වල පැමිණීම සහ නොදන්වා සේවයට නොපැමිණීම මත 1997 සහ 1998 වර්ෂවල හිමිවිය යුතුව තිබූ උසස්වීම් අහිමි වී ඇති බව සහ පසු අවස්ථා වලදී උසස්වීම් සඳහා ඉල්ලුම් කරන ලෙස විශ්වවිද්‍යාලයීය | පෙත්සම්කරුගේ වසර 34 ක සේවා කාලය පිළිබඳව සලකා බලා, දේශපාලන හේතූන් මත විවිධ ගැටලුවලට මුහුණ දුන් අයට සහන සැලසීම සඳහා ස්ථාපිත විමර්ශන කමිටුව විසින් දෙන ලද තීරණ පදනම් කර පෙත්සම්කරුට යම් |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශ යොමුව : HE/AD/03/ම.පෙ.කා.ස. (2024/1447)<br>දිනය : 2024.09.11 | ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | පරිපාලන අධිකාරිය විසින් පෙත්සම්කරු වෙත දැනුම් දුන්නද ඔහු විසින් උසස්වීම් සඳහා අයදුම් කර නොමැති බවත් 2003 වසරේ උසස්වීම සඳහා අයදුම් කර අංශ ප්‍රධාන නිර්දේශය ලබා තිබියදීත් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්වී නොමැති බව<br><br>(ආ) දේශපාලන පළිගැනීම් හා විමර්ශන කමිටුව විසින් 2002 කමිටුවේ නිරීක්ෂණ අනුව පෙත්සම්කරුට උසස්වීම් ලබා දිය යුතු බව දැනුම් දී ඇතත්, ඒ අනුව අදාළ උසස්වීම ලබා දී නොමැති බව | සහනයක් ලබා දීමට කැළණිය විශ්ව විද්‍යාල පාලක සභාව වෙත නිර්දේශ කරන ලදී. |
| **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 07 | ටී.කේ.එම්. මද්දුම බණ්ඩාර මහතා COM/PP/2025/214 ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/02/20/EXC/02/PPC-01<br>දිනය : 2017.06.06 | සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ ලිපි පැවරීමේ ක්‍රමවේද අනුව අංක ර.බී. 04 සුරාබදු බලපත්‍රය පවරාගෙන 2002.01.01 දින සිට මත්පැන් විකිණීමේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය බවත්, පසුව පැවරුම්කරු මියගිය පසු මධ්‍යම පළාත භාර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2005.08.03 දින සිය ව්‍යාපාරික ස්ථානය මුද්‍රා තැබූ බවත්, ඒ සම්බන්ධයෙන් පෙත්සම්කරු අභියාචනාධිකරණයේ පැවරු අංක CA 1491-2005 (රිට්) නඩුවෙන් 2005.12.31 දක්වා ව්‍යාපාර කටයුත්ත කරගෙන යාමට තීන්දු වූ බවත්, එහෙත් මියගිය පැවරුම්කරුගේ අභාවයෙන් මාස තුනකට පසු වෙනත් | (අ) 2005.06.21 දින බලපත්‍රයේ මුල් හිමිකරු විසින් පෙත්සම්කරුට බලපත්‍රය පවරා දී ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇති බවත් 2005.07.10 දිනැතිව මුල් හිමිකරු ඔහුගේ ඥාති පුත්‍රයකු බව කියන තැනැත්තකුට බලපත්‍රය පවරා ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇති බවත්, 2005. 07.17 දින මුල් හිමිකරු මිය ගොස් ඇති බව<br><br>(ආ) සුරාබදු දෙපාර්තමේන්තුව භාරයේ තිබූ දිවුරුම් ප්‍රකාශවල මුල් පිටපත්, කූඨ ලේඛන ඉදිරිපත් | බලපත්‍රය මිලදී ගත් නව පාර්ශ්වයට අගතියක් නොවන පරිදි පෙත්සම්කරු හට බලපත්‍රය නැවත පැවරීමට ක්‍රමවේදයක් සකසන ලෙසට 2022.12.01 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ නිර්දේශය බල රහිත කරන ලද අතර මෙම සිද්ධිය පොලිස්පතිතුමා වෙත යොමු කර ඒ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා පරීක්ෂණයක් සිදු කළ යුතු බව නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | අයෙකු පෙත්සම්කරුගේ සුරාබදු බලපත්‍රයට හිමිකම් දක්වමින් අංක CA 1491-2005 දරන නඩුවට ඇතුළත් වූ බවත්, එම බලපත්‍රයට හිමිකරුවන් දෙදෙනෙකු සිටීම සම්බන්ධයෙන් විධිමත් පරීක්‍ෂණයක් පවත්වන ලෙස අභියාචනාධිකරණය විසින් සුරාබදු කොමසාරිස් ජෙනරාල් වෙත නියෝග නිකුත් කළ ද සාධාරණ පරීක්ෂණයක් සිදු නොවූ බැවින් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අදාළ බලපත්‍රය පෙත්සම්කරුට හිමි නොවන බව හා පසුව ඉදිරිපත් වූ තැනැත්තාට හිමි බවට ලිපි නිකුත් කිරීම නිසා නැවත වරක් නඩු අංක CA 1049-2007 යටතේ රිට් නඩුවක් පැවරූ බවත්, එම නඩුව 2009.07.07 දින විමර්ශනය කර, සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අදාළ බලපත්‍රය පෙත්සම්කරුට හිමි නොවන බවට හා අනෙක් තැනැත්තාට හිමි බවට නිකුත් කළ ලිපි බල රහිත හා ශුන්‍ය කළ බවත්, 2022.12.01 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය පරිදි මෙම බලපත්‍රය පෙත්සම්කරු වෙත පවරා දීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | කළ බවට පෙත්සම්කරුට විරුද්ධව පවරා තිබූ නඩුව සඳහා අවශ්‍ය බව සඳහන් කරමින් නුවරඑළිය පොලිසිය විසින් අත්සන් කර රැගෙන ගොස් ඇති බව හා එම ලේඛන අස්ථානගත වී ඇති බව දන්වා ඇති බව<br><br>(ඇ) මෙම බලපත්‍රය පැවරීමේ ක්‍රියාවලියේදී බරපතල වංචා සිදුවී ඇති බව නිරීක්ෂණය වන බව | |
| 08 | රසිකා ක්‍රිෂාන්ති මහත්මිය COM/PP/2025/151 ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදි. | පෙත්සම්කාරියගේ ස්වාමිපුරුෂයා විසින් 2017.07.21 දින පෞද්ගලික බැංකුවකින් ණය මුදලක් ලබා ගත් බවත්, පසුව පෙත්සම්කාරියගේ ස්වාමිපුරුෂයා මිය ගිය බවත්, ඒ වන විට එම ණය මුදලින් කොටසක් ගෙවා තිබූ බවත්, ඉතිරි මුදල රක්ෂණ | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද කරුණු | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරන ලෙස පෙත්සම්කාරිය වෙත දැනුම් දෙන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් බලපත්‍රලාභී විශේෂිත |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශ යොමුව : MF1/11/01/03/2022/ Vol-1<br>දිනය : 2023.07.17 | ආයතනයෙන් අය කර ගන්නා බව බැංකුව දැනුම් දුන් බවත්, කෙසේ වෙතත් තවත් මුදලක් ගෙවිය යුතු බව බැංකුව විසින් දැනුම් දී ඇති බවත්, එම මුදල ගෙවීමට කිසිදු ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බවත් සඳහන් කරන පෙත්සම්කාරිය, සහනයක් සලසන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | | බැංකුවල ක්‍රියාකාරීත්වය සම්බන්ධව විධිමත්ව නියාමනය කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නියෝගයක් නිකුත් කරන ලෙස මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ කරන ලදී. |
| **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** | | | | |
| 09 | ඒ. එදිරිසිංහ මහතා COM/PP/2025/97<br>ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදී.<br>අමාත්‍යාංශ යොමුව : MIWRM/AD/05/04/ ම.පෙ..(05-2021)<br>දිනය : 2021.10.28 | මහවැලි අධිකාරිය විසින් ලබා දී තිබූ ඉඩම නැවත පවරාගත් බවත්, ඒ වෙනුවට විකල්ප ඉඩමක් ලබා දෙන ලෙස මහවැලි අධිකාරියේ අදාළ නිලධාරීන්ගෙන් වසර ගණනාවක සිට ඉල්ලීම් කළත් මේ වනතුරුත් සහනයක් ලැබී නොමැති බැවින් සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු විසින් පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) මයුරපුර කොට්ඨාසයෙන් පර්චස් 20ක විකල්ප ඉඩම් කොටසක් ලබා දීමට හැකියාවක් පවතින බව තීරණය කර තිබූ නමුත් 2019 ජනවාරි මාසයට පෙර කරන ලද සියළුම තෝරා ගැනීම් අවලංගු කරන මෙන් මහවැලි අධිකාරිය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින් පෙත්සම්කරුට ඉඩම් කොටසක් ලබා දීමේ කටයුත්ත මේ වන විට නවතා ඇති බව<br><br>(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දෝෂ සහගතව කටයුතු කිරීම හේතුවෙන් පෙත්සම්කරු දීර්ඝ කාලයක් තිස්සේ අගතියට පත්වී ඇති බව | පෙත්සම්කරුගේ වයස්ගතභාවයද සලකා බලා අනුප්‍රාප්තිකයකු සිටී නම් එම අනුප්‍රාප්තිකයාට මතු අයිතිය හිමිවන පරිදි 1992 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව පෙත්සම්කරු වෙත ඉඩමක් ලබා දෙන ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 10 | එම්.ජී. කාන්තිලතා මහත්මිය COM/PP/2025/173 ගරු නිශාන්ත පෙරේරා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MAO/AD/E11/1/34 දිනය : 2024.10.18 | 1994 වර්ෂයේ සිට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටියදී 2014 වර්ෂයේදී ලිපිකරු III ශ්‍රේණියට ස්ථිර පත්වීමක් ලද බවත්, වසර 09 ක ස්ථිර සේවා කාලයක් සහිතව 2023 වර්ෂයේදී විශ්‍රාම ලද නමුත් ස්ථිර සේවා කාලය වසර 10 ට අඩු වීම හේතුවෙන් විශ්‍රාම වැටුපක් නොලැබෙන බවත් සඳහන් කර ඇති පෙත්සම්කාරිය තමාගේ සම්පූර්ණ සේවා කාලයම සැලකිල්ලට ගෙන හෝ විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් පෙත්සමෙන් ඉල්ලා ඇත. | (අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප් හිමිකම සඳහා මාස 120 ක කාලයක් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය කර තිබිය යුතු බව<br><br>(ආ) පෙත්සම්කාරිය සේවයේ ස්ථිර කර නොමැති බවත් ඒ සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සමත්විය යුතුව ඇති බවත්, බඳවාගැනීමේ දී වයස අවු 45 ට වඩා වැඩි ස්ථිර පත්වීම් ලාභීන් අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමට ප්‍රතිපාදන පවතින බව | කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්බන්ධයෙන් වූ ගැටලුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉන් පෙත්සම්කාරිය නිදහස් කිරීමට අනුමැතිය ලබා ගෙන ඇයගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන ලෙසත් අනතුරුව පෙත්සම්කාරිය හා සමාන තත්ත්ව යටතේ විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින කළමනාකරණ සහායක, කම්කරු සහ මුරකරු තනතුරුවල සේවය කළ සෙසු නිලධාරීන් ද ඇතුළත් කර විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඉදිරිපත් කරන ලෙසත් නිර්දේශ කරන ලදී. |
| **සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය** | | | | |
| 11 | පී. ලොකුහෙට්ටි මහතා COM/PP/2025/127 ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : | විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට ඇති හැකියාව, 1988.01.01 දිනට පෙරදාතම කර පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බැලීම හා 2006 සහ 2007 වසරවල වැටුප් වර්ධක හිමිකම් ලබාදීම යන කරුණු ඉටු නොවීම හේතුවෙන් මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පියෙකු වූ | (අ) පළාත් සභාවන්හි පරිපාලන කටයුතු ආරම්භ කර ඇත්තේ 1990.01.01 වැනි දින සිට බැවින් පෙත්සම්කරු අන්වීක්ෂක සේවයේ I වැනි පන්තියට උසස් වූ දිනය 1988.01.01 දිනට පෙරදාතම | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මෙතෙක් ලැබී ඇති ජ්‍යෙෂ්ඨතා ලේඛන හා සෙසු තොරතුරු පාදක කර ගනිමින්, පෙත්සම්කරුට පමණක් පෞද්ගලික වන සේ හා පූර්වාදර්ශයක් නොවන පරිදි ඔහු |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | MH/AD/I/C/COPP/ 04/2013<br>දිනය : 2018.03.16 | පෙත්සම්කරුට අසාධාරණයක් වී ඇති බවත්, විශ්‍රාම යන විට අනුමත විශේෂ ශ්‍රේණියේ තනතුරක් පුරප්පාඩුව තිබීම, "විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය-2003" දී වැඩිම ලකුණුලාභියා වීම සහ 2009 වසරේ දී ඉහත විභාගය අවලංගු කිරීම පළාත් සභාවලට අදාළ නොවන බව පැහැදිලිවම සනාථ කර තිබීම යන කරුණු මත පදනම්ව ඉහත හිමිකම් සහ ප්‍රතිලාභ ලබා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | කිරීමේ හැකියාවක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නොමැති බව<br><br>(ආ) මේ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර උපදෙස් විමසා ඇති අතර අවසන් ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකසන ලෙසට වූ උපදෙස අනුව සියලු පළාත් සභාවලින් ජ්‍යෙෂ්ඨතා ලේඛන කැඳවූව ද ලබා ගත නොහැකි වූ බැවින් 1988 වසරට අදාළව නිවැරදි ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකසා ගත නොහැකි වී ඇති බව<br><br>(ඇ) වසර 35කට අධික සේවා කාලයක් ඇති බව හා විශේෂ ශ්‍රේණියට උසස්වීමේ විභාගය -2003 සමත් වුවද පසුව එම විභාගය අවලංගු කර ඇති බව<br><br>(ඈ) මීට පෙර 7 වැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෙත්සම විභාග කළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම හිමිකම් ලබා දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කළ 2015.05.27 දිනැති නියෝගය | අන්වීක්ෂක සේවයේ I වැනි පන්තියට උසස් වූ දිනය 1988.01.01 වැනි දිනට පෙරදාතම කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ක්‍රියාත්මක වී නොමැති බවත්, 8 වැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෙත්සම විභාග කර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කළ 2019.06.27 දිනැති ලිපියෙන් පෙත්සම්කරුගේ ඉල්ලීම ඉටුකරදීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන මෙන් කළ නියෝගය ක්‍රියාත්මක කර නොමැති බව | |
| 12 | ඩී.ජී. සුමනසේකර මහතා COM/PP/2025/28 ගරු රත්න ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MH/AD/01/03/PP/ 04/2024 දිනය : 2024.05.27 | 1985.07.01 වැනි දින සිට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අන්වීක්ෂක තනතුරට පත්වූ බවත්, සෞඛ්‍ය හේතු මත නිසි පරිදි සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බැවින් 1987.04.16 වැනි දින සිට සේවය හැර ගියා සේ සලකා කටයුතු කර ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු, 2007.02.05 වැනි දින සිට සේවයේ ස්ථිර කරන ලද බව ද දැනුම් දී ඇති බව සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) නොදන්වා සේවයට නොපැමිණීම හේතුවෙන් පෙත්සම්කරුට සේවය අත්හැර යාමේ ලිපිය නිකුත් කර ඇත්තේ 1987.04.16 වැනි දින වන බවටත්, ආයතන සංග්‍රහයේ 48 වැනි පරිච්ඡේදයේ 37:1 වැනි උප වගන්තිය අනුව මාස 3ක කාලයක් තුළ මේ සම්බන්ධ අභියාචනයක් පත්වීම් බලධරයා වෙත සිදු කළ හැකි වුව ද එසේ සිදු කර නොමැති බවටත්, තව ද එහි 37:3 උප වගන්තිය අනුව මේ සම්බන්ධ අභියාචනයක් මාස 6ක් තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ හැකි වුව ද එම අභියාචනය සිදු කර ඇත්තේ | පෙත්සම්කරු විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන බැවින් නැවත සේවයේ පිහිටුවන ලද 2007.02.05 වැනි දින සිට 2020.06.12 දින විශ්‍රාම ලබන තෙක් වැටුපෙන් අය කර ගනු ලැබූ වැන්දඹු අනත්දරු දායක මුදල් පෙත්සම්කරු වෙත ලබා දෙන ලෙසට නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | 1988.07.25 වැනි දින වන අතර එම කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුගේ අභියාචනය ප්‍රතික්ෂේප කර ඇති බව (ආ)පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙසට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මගින් 2006.11.07 දිනැති නිර්දේශය ලබා දී ඇත්තේ ඔහුට සේවය හැර යාමේ ලිපිය නිකුත් කර වසර 19 මාස 9 දින 29කට පසුව වන බවටත්, එසේ කල් පසු වී නැවත සේවයේ පිහිටුවීම පවතින නීතිමය විධි විධානයන්ට අනුකූල නොවන බව (ඇ) මේ අනුව 2007 වසරේ නැවත සේවයට වාර්තා කර ඇති පෙත්සම්කරු 2020 වසර දක්වා අඛණ්ඩව සේවය කර ඇති නමුත් ඔහුට විශ්‍රාම වැටුපක් ලබා දීමේ හැකියාවක් නොමැති බව | |
| 13 | ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී නානායක්කාර මහතා COM/PP/2025/107 ගරු නන්දන පත්මකුමාර මහතා, | 1971 දී අනියම් නුපුහුණු කම්කරුවෙකු ලෙස සේවයට බැඳුණු බවත්, සේවය ස්ථිර කිරීමෙන් පසු 1986 වසර තෙක් සේවය කරන ලද බවත්, අවසන් වරට කළුබෝවිල රෝහලේ | (අ)දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ විසින් පෙත්සම්කරුගේ 1984 හා 1985 වසරවල වැටුප් | පෙත්සම්කරුගේ සේවා කාලය වසර 14ක් ලෙස සැලකිල්ලට ගෙන ඔහුට විශ්‍රාම වැටුප හිමිගැන්වීමට පිණිස අවශ්‍ය ලේඛන නිසි |

| **අනු අංකය** | **පෙත්සම සම්බන්ධ තොරතුරු** | **අපේක්ෂිත සහනය** | **කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු** | **කාරක සභාවේ නිර්දේශය** |
|---|---|---|---|---|
| | පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MH/AD/01/06/01/ 23/2017 දිනය : 2018.01.29 | සේවයේ යෙදී සිටියදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121, 5.4 ඡේදය අනුව විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන ලද බවත්, විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් කියන අවස්ථාවේ දී සේවා කාලය මාස 105 ක් ලෙස වැරදි ලෙස ගණනය කර තිබූ බැවින් බැංකු ගිණුමට පාරිතෝෂිකය වශයෙන් රු. 5000/- ක් පමණක් බැර කිරීමට තීරණය කර තිබූ අතර එම මුදල ලබා නොගැනීමට පෙත්සම්කරු තීරණය කළ බවත්, පෞද්ගලික ලිපි ගොනුව අස්ථානගත වී ඇති බැවින් ලිපිගොනුවේ පැවති ලිපිවල පිටපත් ද විශ්‍රාම වැටුප සකසා ගැනීමේ කටයුතුවලට විවිධ ආයතනවලට සහ පුද්ගලයන්ට භාර දී ඇති බවත් ප්‍රකාශ කරන අතර රා.ප.ච. 121 ට අනුව පත් කරන ලද කමිටුවට මෙම ලේඛන ඉදිරිපත් නොකිරීමට කළුබෝවිල රෝහලේ බලධාරීන් විසින් හිතා මතා කටයුතු කරන ලද බව විශ්වාස කරන බැවින් වසර 14ක සේවා කාලය නිවැරදිව ගණනය කර ඊට අනුරූපව විශ්‍රාම වැටුප සකසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | ලේඛන සොයා ගත නොහැකි වූ බව හා පෙත්සම්කරුට වැඩ තහනමක් පනවා තිබූ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා එවා තිබූ බැවින් එම කරුණු ද සැලකිල්ලට ගෙන 1971 සිට 1985 තෙක් වන පෙත්සම්කරුගේ මුළු සේවා කාලයෙන් 2/3ක් ගණනය කර ඔහුට සේවා පාරිතෝෂිකයක් පමණක් හිමි ගැන්වීමට කටයුතු කර ඇති බව<br><br>(ආ) දකුණු කොළඹ රෝහලේ හිටපු සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ 2011.07.15 දිනැති ලිපියෙන් 1971.05.02 දින සිට 1985.05.24 වැනි දින තෙක් සම්පූර්ණ සේවා කාලය පෙත්සම්කරු සේවයේ නිරතව සිටි බව සනාථ කර ඇති බව | පරිදි සකස් කර, මාස දෙකක කාලයක් තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙසට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කරන ලදී. |
| 14 | ඩී.එච්. ගමගේ මහතා COM/PP/2025/330 ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : Pns/P5/01/33 දිනය : 2019.08.21 | 2017.12.20 වැනි දින මියගිය පෙත්සම්කරුගේ භාර්යාව මාණ්ඩලික හෙදියක ලෙස 1985.04.01 වැනි දින දක්වා වසර 24ක කාලයක් රිජ්වේ ආර්යා ළමා රෝහලේ සේවය කර විශ්‍රාම ලබාගත් බවත්, පසුව වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය ලබා ගැනීමට අදාළ අයදුම්පත්‍රය 2012.12.18 වැනි දින | අ) විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙසට වූ 2024.04.25 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැති බව<br>(ආ) 2012.12.18 වැනි දින පෙත්සම්කරුගේ | පෙත්සම්කරුගේ භාර්යාව සේවයට බැඳුනු දින සිට වැන්දඹු පුරුෂ අරමුදල සඳහා අය විය යුතු 6%ක දායක මුදල ගණනය කර, එය ඉදිරියට ගෙවිය යුතු විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසට වූ පූර්ව කාරක සභා නිර්දේශය ද |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | රෝහල වෙත ලබා දුන් බවත්, එම ලියවිලි ලද බවට පිළිගෙන තිබියදීත් ඇයගේ අභාවයෙන් අනතුරුව එකී ලියකියවිලි අස්ථානගත වී ඇති බව සඳහන් කරමින් විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති බවත්, 90 වැනි වියේ පසුවන පෙත්සම්කරුහට හිඟ මුදල් ද සමග සිය භාර්යාවගේ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | භාර්යාව ජීවත්ව සිටියදී රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත භාරදුන් ලියකියවිලි අස්ථානගතවී ඇති බව<br><br>(ඈ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2012 අදාළ වනුයේ, 1983.08.01 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලැබූ එදිනට සේවයේ නියුක්තව සිටි එහෙත් වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය පළ කිරීම සඳහා ලබා දී තිබූ නියමිත කාලය තුළ තම මනාපය පළ කිරීමට නොහැකි වූ නිලධාරිනියන් හට ඒ සඳහා මනාපය පළ කිරීම සඳහා පමණක් වන අතර මීට පෙර මනාපය/අමනාපය පළ කර ඇත්නම් එය වෙනස් කිරීම සඳහා නොවන බව<br><br>(ඇ) රෝහල් පරිපාලනයේ දුර්වලතා හේතුවෙන් පෙත්සම්කරු අගතියට පත්ව ඇති බව<br><br>(ඉ) මේ සම්බන්ධයෙන් 2024.04.25 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් | සැලකිල්ලට ගෙන මෙය පූර්වාදර්ශයක් කර නොගෙන පෙත්සම්කරුට සහනයක් සැලසීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් ඊට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවත් නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | විශ්‍රාම වැටුපෙන් අදාළ අයකර ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගෙන, ගෙවීම් සිදු කරන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර ඇතත් එය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බව | |
| **නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය** | | | | |
| 15 | එච්.එම්.සී.ජී.බී. හේරත් මහතා COM/PP/2025/136 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MUDH/GA/PP/P3/ PPC-Vol III දිනය : 2025.04.30 | කුරුණෑගල යටිවැහැර නිවාස යෝජනා ක්‍රමය පිහිටි ඉඩම 1996 වසරේදී නියමිත තක්සේරු වටිනාකම ඉඩම් ලාභීන්ගෙන් අය කරගෙන නිවාස සංවර්ධන අධිකාරියේ පූර්ණ මැදිහත්වීම මත ඉඩම් ලාභීන් 102ක් වෙත බෙදා දුන්නද මේ වන තෙක් ඔප්පු ලබා දී නොමැති බවත්, වසර 10ක් ගතවූ පසු නැවත තක්සේරු කර වැඩිපුර මුදලක් ගෙවිය යුතු බවත්, එතෙක් ඔප්පු ලබා දිය නොහැකි බවත් දැනුම් දුන් බවත්, ඔප්පු නොමැති වීම මත දරුවන් පාසලට ඇතුළත් කර ගැනීම ආදී ගැටලු රාශියකට මුහුණ පෑමට සිදුවී ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු නිවාස සංවර්ධන අධිකාරිය මෙම ගැටලුව ව්‍යාකූල කර ඇති තත්ත්වයක, ප්‍රාදේශීය ලේකම්වරයා හෝ මුල් කරගෙන මෙම ඉඩම් ගැටලුව විසඳා දැනට ගෙවා ඇති මුදලට ඉඩම්ලාභීන්හට ඔප්පු ලබා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම | (අ)ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන මත රු. 8,500,000/-ක (රු. ලක්ෂ 85) මුදලක් කුරුණෑගල යටිවැහැරවත්ත නමැති ඉඩමේ තක්සේරු වටිනාකම ලෙස ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත 2007 වර්ෂයේදී ගෙවා ඇති බවත් සංවර්ධන වියදම් ලෙස රු.40,000/- බැගින් ඉඩම්ලාභීන්ගෙන් අය කරගෙන ඇති මුදල, ඉහත සඳහන් තක්සේරු වටිනාකමෙන් අඩු කර ඉතිරි මුදල ගෙවන ලෙස ඉඩම්ලාභීන් වෙත දැනුම් දී ඇති බව<br><br>(ආ) තක්සේරු මුදල ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවීම ප්‍රමාද වීම | අධිභාර වටිනාකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දෙන ලෙස ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙතත්, එම අධිභාර වටිනාකම නියමිත පරිදි ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දුන් අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දෙනු ලබන තක්සේරු මුදල ගෙවනු ලබන ඉඩම්ලාභීන් වෙත ඉඩම් ඔප්පු ලබා දීමේ ක්‍රියාවලියේ මූලික පියවර හැකි ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ඉදිරිපත් කර ඇත. | හේතුවෙන් 2001-2007 දක්වා කාලසීමාව සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අධිභාරයක් පනවා ඇති බව හා අධිභාරය සඳහා පෙත්සම්කරුවන්ගෙන් අය කිරීමක් සිදු නොකරන බව | |
| 16 | පී.වී.රත්නපාල මහතා COM/PP/2025/228 ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MUDH/GA/PP/P3/ PPC-Vol III දිනය : 2024.08.28 | මාතර හිත්තැටිය මැදගෙදරවත්ත පිහිටි අංක 18 දරන ඉඩමෙහි අයිතිය පෙත්සම්කරු වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ)අක්කර 01 රූඩ් 02 පර්චස් 26.5 සමන්විත මැදගෙදරවත්ත නිවාස ව්‍යාපෘතියේ ඉඩම් කැබලි 23ක් නිවාස සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹෙමින් ප්‍රතිලාභීන් 23 දෙනෙකු සඳහා ලබා දී ඇති අතර මෙම ඉඩම පවරා ගන්නා අවස්ථාවේ ඉඩමේ තක්සේරු වටිනාකමින් කොටසක් විමධ්‍යගත අරමුදලින් පියවා ඉතිරි මුදල එක් ඉඩම්ලාභියෙකුගෙන් රු.5000/- බැගින් අය කරගෙන ඇති බව<br>(ආ) උක්ත පිඹුරේ පෙත්සම්කරු පදිංචිව සිටි කැබලි අංක 10 යන ඉඩම වෙනත් අයෙකු වෙත විකුණුම් ගිවිසුමක් මගින් භුක්තිය ලබා දී රු.5000/- ද ගෙවා පවරාගන්නා ලද ඉඩමක් වන නමුත් එම තැනැත්තා විසින්ම එම ඉඩම නිවාස | පෙත්සම්කරු වෙත යෝජිත විකල්ප ඉඩම ලබා දෙන ලෙසත් එහිදී ඔහු මැදගෙදරවත්ත නිවාස ව්‍යාපෘතියේ කැබලි අංක 10 ඉඩමේ අවසානවරට පදිංචි වී සිටි වර්ෂයේ තක්සේරු වටිනාකමට තක්සේරු කර, එම ඉඩමේ ප්‍රමාණයට සමාන භූමි ප්‍රමාණයක් ලබා දීමට කටයුතු සිදු කරන ලෙසත් නිර්දේශ කළ අතර අදාළ ගෙවීම් සිදු කොට ඉඩමේ භුක්තිය තමා සතු කරගන්නා ලෙසට පෙත්සම්කරු වෙතට ද දන්වා සිටින ලදි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අධිකාරියේ අනුමැතියකින් තොරව නීතිඥ මහතෙකු ඉදිරිපිට අත්සන් කරන ලද කුවිතාන්සියක් මගින් පෙත්සම්කරු වෙත පවරා ඇති අතර නිවාස සංවර්ධන අධිකාරිය විසින් පෙත්සම්කරුට අනවසර නියමානුකූල කිරීම යටතේ එහි භුක්තිය භාරගන්නා ලෙසට ලිපි මගින් දැනුම් දුන්නද ඔහු ඒ සඳහා ඉදිරිපත් වී නොමැති බවත්, පසුව ඉහත පැවරුම සිදු කළ අය ඉදිරිපත් වී නිවාස සංවර්ධන අධිකාරිය වෙත අදාළ ගෙවීම් සිදු කර උක්ත ඉඩමෙහි හිමිකම පවරා ගෙන ඇති බවත්, ඒ අනුව ඉඩමේ භුක්තිය පෙත්සම්කරු වෙත තිබුණද, අයිතිය හිමිව නොතිබූ බවත්, පසුව ඉඩමේ හිමිකම පවරාගෙන තිබූ තැනැත්තා මිය ගිය බැවින් ඔහුගේ භාර්යාව හා දරුවන් විසින් ගොනු කළ නඩුවේ තීන්දුව අනුව ඉඩමෙහි හිමිකම ඔවුන් වෙත ලද බව<br><br>(ඇ) කැබලි අංක 18 ඉඩම පෙත්සම්කරුගේ මව වෙත විකුණුම් ගිවිසුමක් මගින් භුක්තිය ලබා දී රු.5000/-ක්ද ගෙවා පවරාගන්නා ලද ඉඩමක් වන අතර එයද ඉහත පරිදිම නිවාස | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අධිකාරියේ අනුමැතියකින් තොරව නීතිඥ මහතෙකු ඉදිරිපිට අත්සන් කරන ලද කුවිතාන්සියක් මගින් වෙනත් අයෙකු වෙත පවරා ඇති බවත්, මෙම ඉඩම් ප්‍රතිලාභීන් වෙත පිරිනැමීමේ දී නිවාස සංවර්ධන අධිකාරිය සමඟ එළඹෙනු ලබන ගිවිසුමෙහි 9 වැනි කොන්දේසිය අනුව නිවාස සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව ඉඩම වෙනත් අයෙකුට පැවරීමෙන් එම ඉඩමෙහි අයිතිය අහිමි වන බවට සඳහන් කර ඇති බවත්, ඉඩම පවරන ලද කුවිතාන්සිය මත පදනම් වී නිවාස සංවර්ධන අධිකාරිය සංවර්ධන අධිකාරිය මගින් ණය මුදලක් ද අනුමත කර ඇති අතර එහි නිවාසයක් ද තනා පදිංචි වී සිටින බවත්, මේ වන විට එම ඉඩම අනවසර නියමානුකූල කිරීම ක්‍රියාවලිය යටතේ භුක්තිය ලබාදීමට කටයුතු සිදු කරමින් සිටින බව<br><br>(ඇ) නිවාස සංවර්ධන අධිකාරිය විසින් කැබලි අංක 10 සඳහා භුක්තිය මුල් අයිතිකරු වෙත ලබා දීමත්, කැබලි අංක 18 සඳහා අනවසර නියමානුකූල කිරීම යටතේ භුක්තිය | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ලබා දීමත් සහ කුවිතාන්සියක් මත පදනම්ව ඔහුට ණය මුදල් ලබා දීමත් යන අවස්ථාවන්වලදී පදනම් කර ගන්නා ලද ස්ථාවරයන් ගැටලුකාරී බවත්, ඉඩමෙහි භුක්තිය ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ දී පෙත්සම්කරු විසින් ද යම් යම් අඩුපාඩු සිදු කර ඇති නමුත් සියලු කාරණා සැලකීමේදී පෙත්සම්කරු යම් අසාධාරණයකට ලක්ව ඇති බව | |
| **විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය** | | | | |
| 17 | ජී. සමන්ති ද සිල්වා මහත්මිය COM/PP/2025/340 ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : FE/ADM/06/01/01/04/2023 දිනය : 2025.06.23 | පෙත්සම්කාරිය සේවය කරන ලද සවුදි අරාබියේ ආයතනයක් විසින් සිවු මසක හිඟ වැටුප නොගෙවීම සහ මෙරට විදේශ රැකියා ආයතනයක් විසින් ඒ සම්බන්ධයෙන් සිදු කළ අසාධාරණ මැදිහත්වීම සම්බන්ධයෙන් 2024.01.29 වැනි දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, 2024.02.13 වැනි දින එම පැමිණිල්ල විභාග කිරීමට නියමිත වුව ද එසේ නොකොට එය වෙනත් දිනකට කල් දැමූ බවත්, පසුව පැමිණිල්ලේ කටයුතු අවසන් කරන බවට දැනුම් දුන් බවත්, ඉහත අසාධාරණය කෙරෙහි අවධානය යොමු කර හිඟ වැටුප් ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කාරියට හිමි හිඟ වැටුපේ පළමු වාරිකය 2025.09.11 වැනි දිනටත්, දෙවන වාරිකය 2025.10.11 වැනි දිනටත් ගෙවන ලෙස රැකියා නියෝජිත ආයතනය වෙත දැනුම් දී ඇති බව<br><br>(ආ) පළමු වාරිකය නියමිත දිනට නොගෙවුවහොත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පවතින, රැකියා නියෝජිත ආයතනයට අයත් මුදල් තැන්පතුව මගින් එම මුදල අය කර ගැනීමට බලතල පවතින බව | විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකඟ වී ඇති පරිදි පෙත්සම්කාරියගේ හිඟ වැටුප මාස දෙකක් ඇතුළත ගෙවා නිම කරන ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **පරිසර අමාත්‍යාංශය** | | | | |
| 18 | පී.එම්.මුතුමැණිකා මෙනවිය COM/PP/2025/160 ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MWFRC/ADM/18/6 දිනය : 2022.12.22 | අඩවි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිසාවේ අඩවි වන කාර්යාලයට අනුබද්ධව අවසන් වරට සේවය කර 2018.07.11 වන දින සේවයෙන් විශ්‍රාම ගත් බවත්, විශ්‍රාම ගොස් වසර 4ක් ගත වුවද විශ්‍රාම වැටුප හා රජය මගින් ලබා දෙන කිසිදු දීමනාවක් මේ දක්වා නොලද බවත් සඳහන් කරන පෙත්සම්කාරිය, විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) සේවය ස්ථිර කිරීමේදී, රා.ප.ච. 13/2005 අනුව සේවය ස්ථිර කිරීමට සපුරාලිය යුතු කොන්දේසි යටතේ දැක්වෙන iii සහ v හි සඳහන් කොන්දේසි පෙත්සම්කාරිය විසින් සපුරා නොමැති බව;<br><br>(ආ) විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අය කරගෙන ඇති බව හා වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ප්‍රේශණය කර ඇති බව<br><br>(ඇ) වන ව්‍යාප්ති නිලධාරී තනතුරට පත්වූ මේ වනවිට විශ්‍රාම ලැබ සිටින සියලුම නිලධාරීන් හට විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති බව | පෙත්සම්කාරියට පමණක් බලපාන පරිදි විශ්‍රාම වැටුප හිමිගැන්වීමට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරන ලදී. |
| **වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 19 | එච්. ඒ. අනුර ප්‍රියශාන්ත මහතා COM/PP/2025/148 ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MT/ADM/03/PP/1) දිනය : 2025.05.30 | 2008.11.01 දින සිට මේ දක්වා වසර දහසයක් (16) ක් සී./ස. ගම්පහ විවිධ සේවා සමුපකාර සමිතියේ, ක්ෂේත්‍ර නිලධාරී තනතුරේ නොකඩවා සේවය කරන බවත්, තනතුරෙහි මෙතෙක් ස්ථිර කර නොමැති බවත්, මෙයට හේතුව ලෙස බඳවාගැනීමේ දී සම්මුඛ පරීක්ෂණ ලිපිගොනුව සමුපකාර සමිතිය විසින් සමුපකාර කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් නොකිරීම බව | (අ)2009.12.13 දින සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්ගේ මූලිකත්වයෙන් ක්ෂේත්‍ර නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ විධිමත් සම්මුඛ පරීක්ෂණයේ තොරතුරු, සමිතිය විසින් සමුපකාර සේවක කොමිෂන් | 2009.12.13 දින සිට බලපැවැත්වෙන පරිදි පෙත්සම්කරුගේ සේවය ස්ථිර කිරීමටත්, විලම්භනය කළ වැටුප නැවත ගෙවීමටත්, මූලික වැටුපෙන් කොටසක් කප්පාදු කිරීම නිසා සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | දැනගැනීමට ලැබී ඇති බවත්, අදාළ ආයතන වෙතින් රැකියාව ස්ථිර කර සුදුසු වැටුපක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | සභාවට යොමුකර නොමැති බව<br>(ආ) කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව සේවයේ යොදවා ඇති සේවකයන් සම්බන්ධව බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් 2024.08.21 දින ගම්පහ විවිධ සේවා සමූපකාර සමිතියෙහි පැවැත්වූ විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු සහ 2024.09. 04 දින කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද අභියාචනා පරීක්ෂණයේදී ස්ථිර නොකරන ලද සේවකයන් බඳවාගැනීම් හා සුදුසුකම් සපුරා නොමැති සේවකයන් පිළිබඳ විස්තර වාර්තාවක් 2024. 09.25 දිනට ලබා දීමට සභාපති විසින් එකඟ වුවද එය ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව<br><br>(ඇ) සී./ස. ගම්පහ විවිධ සේවා සමූපකාර සමිතියේ පාලන අධිකාරියේ දුර්වල පාලනය හේතුවෙන් ස්ථිර කිරීමක් නොමැතිව මෙම සේවකයා වර්ෂ | දායක වීමේදී සිදුවූ පාඩුව නැවත ඔහුට ලබා දීමටත් කටයුතු කළ යුතු බවට නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | දහසයකට (16) අධික කාලයක් සේවයේ නියුක්තව සිට ඇති බව | |
| 20 | ඩී.දුලිත් අසෝක මහතා COM/PP/2025/187 ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MT/ADM/03/PP/1 දිනය : 2025.04.03 | මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක අධිශ්‍රේණි තනතුර සඳහා සියලුම සුදුසුකම් සපුරා තිබූ පෙත්සම්කරු ඇතුළු නිලධාරීන් හය දෙනෙකු එකී සම්මුඛ පරීක්ෂණයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේද අනුමැතිය සහිතව 2018.03.07 දින පෙනී සිටි බවත්, ප්‍රතිඵල ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා වසර 06 කට පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී සම්මුඛ පරීක්ෂණය අවලංගු කරනු ලැබූ හෙයින් එම තනතුරු අහිමි වූ බවත් එම අසාධාරණය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා සාධාරණය ඉටුකර දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුම්වත් බවත්, සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේ බලාත්මකව පැවතියේ 2013.10.29 දින අනුමත වූ තනතුරු නාමය සහ ඊට අදාල බඳවාගැනීමේ පටිපාටිය බව<br><br>(ආ) තනතුරු නාම සංශෝධනය කිරීම සහ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමේ ක්‍රියාවලියේදී ආයතන මඟින් සිදු වූ ප්‍රමාදය හේතුවෙන් මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) තනතුර සඳහා සුදුසුකම් සපුරා, 2018.03.07 දින සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට එම තනතුරෙහි පුරප්පාඩු සඳහා තේරීපත්වූ නිලධාරීන් හයදෙනාහට උසස්වීම ලබා නොදී සිටීම සාධාරණ නොවන බව | මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) තනතුරට බඳවාගැනීම සඳහා 2018.03.07 පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය බලාත්මක කිරීමටත්, පෙත්සම්කරු ඇතුළු සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නිලධාරීන් හයදෙනා (06) හට මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) තනතුර ලබා දීමටත්, 2025.03.24 දින අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරී බඳවා ගැනීමේ පටිපාටියට අදාලව 2025.05.27 දිනැතිව වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යොමු කර ඇති සංශෝධන අනුව අන්තර්කාලීන විධිවිධාන I, II, III අනුව කටයුතු කර මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | | (විශේෂ ශ්‍රේණිය) සුදුසුකම් සපුරාලන දින සිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරී තනතුරට උක්ත නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීමටත් කටයුතු කළ යුතු බවට නිර්දේශ කරන ලදී. |
| 21 | එස්.ආර්.පී. ගුණවර්ධන මහතා COM/PP/2025/238 ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MT/ADM/06/04 දිනය : 2022.01.06 | කහදූවේ අගතුඩුවත්ත නොහොත් මහගෙදරවත්ත නැමැති ඉඩමේ පිහිටි පෙත්සම්කරුගේ පියාට අයිති ඉඩම සහ ගොඩනැගිල්ල 1969 වර්ෂයේදී ප්‍රදේශවාසීන් සහ සමුපකාරිකයන් විසින් කරන ලද ඉල්ලීමක් අනුව ඇල්පිටිය සමූපාකාරයට බදු දෙන ලද බවත්, මෙම දේපළ පෙත්සම්කරුගේ පවුලේ සාමාජිකයන් වෙත මුදා හැරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට නියෝග කරන ලෙසත්, 1976 වසරේ සිට මේ වනතෙක් ලැබිය යුතු හිඟ මුදල් සහ සාධාරණ වන්දියක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) රජය විසින් මෙම ඉඩම පවරා ගැනීමේ ක්‍රියාදාමය විධිමත් ආකාරයට සිදු කර නොමැති බව සහ ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් රජයට මෙම ඉඩම් පවරා ගැනීමේදී ඉඩම පවරා ගැනීමේ අරමුණ වශයෙන් පොදු අරමුණක් ලෙස දක්වා තිබුණද පවරා ගැනීමෙන් පසු මෙම ඉඩම එවැනි පොදු අරමුණක් සඳහා යොදාගෙන නොමැති බැවින් ඒ පිළිබඳ පරස්පරතාවයක් පවතින බව<br><br>(ආ) මෙම ඉඩමෙහි මුල් අයිතිකරු වන පෙත්සම්කරුගේ පියාගේ ඉඩම රජය විසින් අත්පත් කර ගැනීමෙන් අනතුරුව අයිතිකරු වෙත රජය විසින් කිසිදු වන්දි මුදලක් ගෙවා නොමැති | පෙත්සම්කාර පාර්ශ්වයට රජය විසින් සාධාරණ වන්දි මුදලක් ගෙවිය යුතු බවත්, වන්දි මුදල නිර්ණය කිරීම සඳහා අදාළ ඉඩම සඳහා 1983 වසරෙහි රජය තක්සේරු කරන ලද වටිනාකම අදාළ කරගත යුතු බව සහ වන්දි මුදලට අදාළ කරගත් පොළිය (1976.04.23 දින සිට 1979.11.07 දින දක්වා 3% ක පොළිය සහ 1979.11.08 දින සිට මේ දක්වා 7% ක පොළිය) මෙම ඉඩම රජයට පවරාගත් දින සිට මේ දක්වා ගණනය කර වන්දි මුදලට එකතු කර සම්පූර්ණ මුදල පෙත්සම්කාර පාර්ශවය වෙත ලබා දිය යුතු බවට ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති වෙත |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | බව හා ඔහු සහ ඔහුගේ බිරිඳ මියගිය පසු ඔහුගේ දරුවන්හට ද කිසිදු වන්දි මුදලක් ගෙවා නොමැති බව | නිර්දේශ කරන ලදී. පෙත්සම්කරුගේ මවද මේ වන විට මියගොස් ඇති බැවින්, පියාගේ ඇවෑමෙන් මෙම දේපළ දරුවන්ට හිමි වන බැවින් ඉහත දැක්වෙන වන්දි මුදල පෙත්සම්කරු ඇතුළු සහෝදර පිරිස සාධාරණ ලෙස බෙදාගන්නා බවට සියලු පාර්ශවකරුවන්ගේ එකඟතාවය දැක්වෙන දිවුරුම් ප්‍රකාශයක් කාරක සභාව වෙත යොමු කිරීමට පෙත්සම්කරු වෙත නියම කරන ලදී. |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 22 | ජී.ඩී. නන්දන මහතා COM/PP/2025/29 ගරු රත්න ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.09 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/DEF/14/22/01/PPC/08 දිනය : 2016.10.04 | යුද්ධ හමුදා ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී සිදු වූ පිපිරීමකින් හා රාජකාරියේ යෙදී සිටියදී සැරයන්වරයකුගේ පහරදීමකින් ශ්‍රවණාබාධිත තත්ත්වයට පත්වූ බවත්, වෛද්‍ය හේතූන් මත 2005.08.16 දින සේවයෙන් නික්ම ගිය බවත්, සේවයේ යෙදී සිටියදී සිදු වූ ආබාධිත බව හේතුවෙන් වෙනත් රැකියාවක හෝ නියැලීමට නොහැකි වී ඇති බවත්, සඳහන් කරන පෙත්සම්කරු වැටුප් ලබා දෙන ලෙසත්, සේවයෙන් විශ්‍රාම ගැන්වීමට අදාළ කටයුතු සහ මේ සම්බන්ධයෙන් දිය හැකි වෙනත් සහන වේ නම් ඒවා ද සලසන ලෙසත් පෙත්සමෙන් ඉල්ලා ඇත. | (අ) පෙත්සම්කරු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බඳවාගැනීමේ දී ශ්‍රවණාබාධ තත්ත්වයක් හෝ මානසික රෝගයක් හෝ තිබූ බවට කරුණු තහවුරු නොවන බව<br><br>(ආ) වෛද්‍ය වාර්තාවන්හි පහර දීමක් බව සටහන් කර ඇති බවත්, එවැනි පහර දීමක් සිදු කළ නිලධාරියා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර නොමැති බවත්, අදාළ පහර දීමෙන් පසු ශ්‍රවණාබාධ තත්ත්වයක් පවතින බව ඔහුගේ අණදෙන නිලධාරියා විසින් | පෙත්සම්කරු අගතියට පත් වී ඇති බව පැහැදිලි වන බැවින් ඔහුට සහන සැලසීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | දන්වා ඇති බව එම අණදෙන නිලධාරීගේ අංක ශ්‍රීලපාහ/පා/47/02/ තාගෝ/40 සහ 2003.11.30 දිනැති ලිපියේ සඳහන් කර ඇති බව<br><br>(ඇ) පවතින නීතිමය ප්‍රතිපාදන යටතේ පෙත්සම්කරු හට උපරිම සහන සලසන ලෙස යුද්ධ හමුදාධිපති වෙත කාරක සභාව විසින් 2017.09.07 දින අටවැනි පාර්ලිමේන්තුවේ දී සිදු කළ පළමුවැනි විමසීමේ දී නිර්දේශ කර ඇති බව | |
| 23 | එම්. බී. ද එස්. ජයතිලක මහතා (පෙත්සම්කරු මියගිය බැවින් ඔහුගේ නෛතික නියෝජිත ලෙස ජී.ජේ.චමල්කා ද සිල්වා මහත්මිය පෙනී සිටින ලදී) COM/PP/2025/280 ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.09 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : MOD/PAC/05/PPC/ 2022/03 දිනය : 2022.04.01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කර්නල්වරයෙකු වශයෙන් සේවය කළ පෙත්සම්කාරියගේ ස්වාමිපුරුෂයා (මියගිය එම්. බී. ද. එස්. ජයතිලක මහතා), මිලේනියම් සිටි බුද්ධි ආරක්ෂක නිවස්නය සම්බන්ධ විමර්ශනයෙන් අනතුරුව නගා තිබූ චෝදනා හේතුවෙන් 2012.03.31 වැනි දින සිට අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද අතර දේශපාලනික හා පුද්ගලික පළිගැනීම් මත මෙම විශ්‍රාම ගැන්වීම සිදු කළ බව ද, සිය ස්වාමිපුරුෂයා 2023.12.31 වැනි දින මියගිය බවද සඳහන් කරන පෙත්සම්කාරිය සිය ස්වාමිපුරුෂයා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලය දක්වා උසස් කර ඊට අදාළ විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස පෙත්සමෙන් ඉල්ලා ඇත. | (අ) මෙම පෙත්සම නවවැනි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කිරීමෙන් අනතුරුව 2023.11.20 දිනැති ලිපියෙන් එවකට සිටි ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කර ඇති බව<br><br>(ආ) එකම චෝදනාව, එකම රාජ්‍ය ආයතනයක නිලධාරීන් දෙදෙනෙකුට යොමු කර ඇති අවස්ථාවක නිලයෙන් පහළ නිලධාරියා වරදකරු කර, නිලයෙන් ඉහළ නිලධාරියා එවකට සිටි | පෙත්සම්කරු සඳහා උසස්වීම් සහ උසස්වීම්වලට අදාළ විශ්‍රාම වැටුප ද ලබා දීම සුදුසු යැයි නිර්දේශ කරයි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ජනාධිපතිවරයාගේ අනුමැතිය මත නිදහස් කර ඇති බව<br><br>(ආ) වසර 7 ක සේවා කාලයක් ඉතිරිව තිබිය දී 2012.03.31 දිනට පෙත්සම්කරු විශ්‍රාම ගැන්වීම අයුක්ති සහගත තීරණයක් වන බව | |
| **බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 24 | ආර්.එච්.ඒ.එම්.ජේ.ජී. කරුණාරත්න මහතා COM/PP/2025/230 ගරු තනුර දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : CA/1/1/15/2/2 (i) දිනය : 2022.01.28 | 2009 වසරේ සිට 2014 වසර දක්වා දෛනික වැටුප් ලබන කම්කරුවකු වශයෙන් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව වසර 06 ක් සේවය කර ඇති බවත්, දැනට වාචිකව සේවය නතර කර ඇති බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 පරිදි සේවය ස්ථිර කිරීමටත්, හිඟ වැටුප් හා සේවා වරප්‍රසාද සහිතව නැවත සේවයේ පිහිටුවීමට අදාළ නියෝගය නිකුත් කරන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු ඇතුලු සේවකයන් 16 දෙනෙකු ස්ථිර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කර නොමැති බව<br>(ආ) 2009 වසරේදී අනියම්, ආදේශක හා තත්කාර්ය පදනම මත බඳවාගත් සේවකයන් ස්ථිර කරන අවස්ථාවේදී පෙත්සම්කරු නියමිත දිනට දින 180කට වඩා දින 03කට අඩු ගණනක් සේවයට වාර්තා කර ඇති බැවින් සේවය ස්ථිර කර නොමැති බව | පෙත්සම්කරු ස්ථිර සේවයේ පිහිටුවීමට සුදුසු බව තීරණය කළ කාරක සභාව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඉදිරිපත් කරන ලෙසත් එය පෙත්සම්කරුට අනන්‍ය විය යුතු බවත්, මෙම තීරණය පූර්වාදර්ශයක් කර නොගත යුතු බවත් නිර්දේශ කරන ලදී. |
| **අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය** | | | | |
| 25 | නුවන් සල්ගාදු මහතා COM/PP/2025/181 ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. | 2014 වසරේදී බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරට පත්ව සේවය කරන අතුරතුර ව්‍යාජ චෝදනා මත 2017 වර්ෂයේදී චෝදනා පත්‍ර නිකුත්කර 2022 වර්ෂයේදී විනය නියෝග ලබා දී ඇති බවත්, | (අ) 2025 වර්ෂයේ ජූලි මස වන විට ජේලර් තනතුර සඳහා බඳවාගැනීමක් සිදු කිරීමට නියමිත අතර බඳවාගැනීමේ පටිපාටිය අනුව, | බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානය සහ මැදිහත්වීම මේ සඳහා යොමු කර 2025 ජූලි මස බඳවාගැනීමට |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | 2025.06.03 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOJ/E14/ම.පෙ.කා. ස/2022 දිනය : 2024.06.25 | ඒ අතරතුර 08 වරක් ස්ථාන මාරුවීම් ලබා දුන් බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අභියාචනය ප්‍රතික්ෂේප වූ නමුත් පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය විසින් නිවැරදිකරු බවට තීන්දු කළ බවත්, 2017.02.18 දින II වන පෙළ ජේලර් තනතුරට උසස් කිරීමේ තරග විභාගයට ඉදිරිපත් වුවද විභාග ප්‍රතිඵල නොලද බවත්, විනය නියෝගය හේතුවෙන් 2022 වසරේදී අදාළ විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව නොලද බවත් සඳහන් කරන පෙත්සම්කරු, 2017.02.18 දිනට II වන පෙළ ජේලර් තනතුරට උසස් කර එදින සිට හිඟ වැටුප් හා කාරක සභාවට උචිත යැයි හැඟෙන වෙනත් සහන ලබා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | බඳවාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 25%ක් ජ්‍යෙෂ්ඨත්වය වෙනුවෙන් වෙන් කරන බවත්, බඳවාගැනීමේ පටිපාටිය අනුමැතිය පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව හා පෙත්සම්කරුට ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාවක් ඇති බව<br><br>(ආ) පෙත්සම්කරුට නිශ්චිත වශයෙන්ම අසාධාරණයක් සිදුවී ඇති බව, රාජ්‍ය නිලධාරියකු ලෙස අසමාන ආකාරයකට සැලකීමක් සිදුවී ඇති බව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරන ලද මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව | නියමිත ජේලර් තනතුර සඳහා පෙත්සම්කරු බඳවාගත යුතු බවට නිර්දේශ කරන ලදී. |
| **2) සහන හිමිකම නිර්දේශ නොකරන ලද පෙත්සම්** | | | | |
| **අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය** | | | | |
| 26 | සංජය හේවා බඹරැන්දගේ මහතා COM/PP/2025/83 ගරු ලසිත් භාෂණ ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.03 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOJ/E14/ම.පෙ.ක/ 2022 | 2009.10.12 දින බන්ධනාගාර නියාමකවරයෙකු වශයෙන් සේවයට බැඳුණු බවත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවට දෙවන පෙළ ජේලර්වරුන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට 2019 වසරේ පෙනී සිට එම විභාගයෙන් සමත් වූ බවත්, 2019.11.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියේ වසර 10කට වැඩි සේවා | (අ) සම්මුඛ පරීක්ෂණයේදී පෙත්සම්කරු ලකුණු ලබා ගත් ආකාරය පහත පරිදි වන බව<br>• ක්‍රීඩා කෞෂල්‍යා 5/5<br>• තාක්ෂණික දැනුම 0/5<br>• චරිත වර්ධනය හා නායකත්වය 2/5<br>• විෂයානුබද්ධ ක්‍රියාකාරකම් 3/5 | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | දිනය : 2023.01.26 | පළපුරුද්දක් සහ සමාජ විද්‍යාව හා ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රපති යන උපාධි දෙකක් හිමි අයදුම්කරුවෙකු ලෙසින් බවත්, 2021 වර්ෂයේ පත්වීම් ලබා දීමේදී පත්වීම හිමි නොවූ බවත් සඳහන් කරන පෙත්සම්කරු, එම පත්වීම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | • සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීම 5/5<br><br>ඒ අනුව පෙත්සම්කරු මුළු ලකුණු 25න් 15ක් ලබා ගෙන ඇති බව හා ලකුණු ලබා ගත් ආකාරය නිවැරදි බව<br>(ආ) ඉදිරියේදී සහකාර බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා බාහිර බඳවාගැනීමක් සිදු කිරීමට නියමිත අතර ඒ සඳහා මූලික සුදුසුකම ලෙස උපාධියක් ලබා තිබීම සලකන බව හා පෙත්සම්කරුට ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව පවතින බව<br>(ඇ) පෙත්සම්කරුට සම්මුඛ පරීක්ෂණයේදී දිය හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලබා දී ඇති බවත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කළ වාර්තා අනුව ඒ බව සනාථ වන බව හා පෙත්සම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බව නිරීක්ෂණය නොවන බව | |
| 27 | කේ.ඒ. ලලිත් කුමාර මහතා COM/PP/2025/103 ගරු නන්දන පත්මකුමාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.03 දින | 1996.10.15 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අනියම් නියාමක නිලධාරියෙකු ලෙස ඇතුළත්ව මූලික පුහුණුවෙන් පසු ස්ථිර නියාමක තනතුරට පත්වීම් ලබා, 2015 වර්ෂයේ කළුතර | (අ) පත්වීම් බලධරයා මෙන්ම විනය බලධරයාද වන බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින්, 2019.01.30 දින සිට වෛද්‍ය සහතික ඉදිරිපත් | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ඩී7/10316 දිනය : 2023.01.31 | බන්ධනාගාරයට ස්ථාන මාරුවී එහි සේවය කළ බවත්, 2019.02.23 දින පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා විදේශගත ගත වූ බවත්, එහිදී පෙත්සම්කරු ඇතුළු කිහිපදෙනෙක් අත්අඩංගුවට ගෙන නැවත මෙරටට පැමිණීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, මාස පහක පමණ කාලයකට පසුව නිදහස් වී සේවයට වාර්තා කිරීම සඳහා ආයතනයට ගිය අවස්ථාවේදී සේවය අතහැර යාමේ නිවේදනයක් නිකුත් කර ඇති බව දැනගන්නට ලැබුණු බවත් සඳහන් කරන පෙත්සම්කරු, නැවත සේවයේ පිහිටුවීමට හෝ විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | කිරීමක් හෝ විධිමත් පරිදි දැනුම්දීමක් හෝ සිදු කර නොමැතිව සේවයට වාර්තා කර නොමැති බැවින් වහාම සේවයට වාර්තා කරන ලෙස 2019.02.08 දිනැතිව පෙත්සම්කරු වෙත දන්වා ඇති බව<br>(ආ) පෙත්සම්කරු විසින් නැවත සේවයේ පිහිටුවීම සඳහා 2019.08.25 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනය, ඉහත හේතු හා විධිමත් නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව නොදන්වා විදේශ ගතවීම යන හේතුව මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයද නිශ්ප්‍රභ කර ඇති බව<br><br>(ඇ) පෙත්සම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බව නිරීක්ෂණය නොවන බව | |
| **නාගරික සංවර්ධන, ඉදි කිරීම් සහ නිවාස අමාත්‍යාංශය** | | | | |
| 28 | ඩබ්.ජී.පී.ඇපා මහතා COM/PP/2025/49 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.05 දින | රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යටතේ තාක්ෂණ සේවා නිලධාරියෙකු වශයෙන් රුහුණු විශ්වවිද්‍යාලයීය කෘෂි විද්‍යා පීඨයේ ඉදි වූ ගොඩනැගිලි වැඩබිමෙහි කාර්යභාර නිලධාරී | (අ) ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් පෙත්සම්කරු වෙත කරාපිටිය නව රෝහල් වැඩ බිමේ සේවය සඳහා 1983.03.02 දිනැතිව | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 2/1/14/115(1) දිනය : 2016.06.07 | වශයෙන් සේවය කළ බවත්, එහි සිදුවන මූල්‍ය ගනුදෙනුවල අවිධිමත්භාවය පිළිබඳ නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කිරීම හේතුවෙන් කරාපිටිය නව රෝහල් වැඩ බිමේ සේවය සඳහා ස්ථාන මාරුවක් ලබා දුන් බවත්, සිය මූල්‍යාමය වගකීමෙන් නිදහස් කරන තෙක් රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨ වැඩබිමෙහි සේවය කළ බවත්, පසුව පොලිස් නියෝගයක් මගින් සේවය නතර කර, සේවය අතහැර යාමේ නියෝග නිකුත් කර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලද බවත්, අදාළ නඩුවෙන් නිදහස් වූ බවත්, මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළද, කිසිදු පරීක්ෂණයක් සිදු නොකළ බවත් සඳහන් කරන පෙත්සම්කරු, සේවා අයිතිවාසිකම් හා විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | ස්ථාන මාරුවක් ලබා දී ඇති අතර එම ලිපියට අවධානය යොමු කරමින් රුහුණු විශ්ව විද්‍යාල විද්‍යායතනයේ වැඩබිම් නිර්මාණ ඉංජිනේරු විසින් 1983.03.07 දිනැතිව පෙත්සම්කරු වෙත මුදා හැරීමේ ලිපිය ද නිකුත් කර ඇති බව<br><br>(ආ) පෙත්සම්කරු නව සේවා ස්ථානයේ සේවය සඳහා වාර්තා නොකරමින් පෙර සේවා ස්ථානයටම සේවයට වාර්තා කිරීමට යෑමේදී අනවසරයෙන් වැඩබිමට ඇතුළු වී යැයි මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ නඩුව නිෂ්ප්‍රභ කරන ලද බව<br><br>(ඇ)1983.11.22 දිනැතිව 1983.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුර හැර යාමේ ලිපිය නිකුත් කර ඇති බව<br><br>(ඈ) සේවය අතහැර යාමේ නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කර ඇති බව<br>(ඉ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව සේවය අතහැර | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | යැමේ නියෝගයක් නිකුත් කර ඇති අයකුට විශ්‍රාම වැටුප් හිමිගැන්විය නොහැකි බව<br>(ඊ) වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට මනාපය පළ කර ඇති බව නිශ්චය නොවන බව හා ඒ සඳහා මනාපය පළකළද, 1983.07.01 දින සිට සේවය හැර ගිය බවට සලකා ඇති හෙයින් ප්‍රමාණවත් තරම් කාලයක් දායක මුදල් අය කරගැනීම ද සිදු වී නොමැති බව | |
| 29 | පද්මා මාලනී මහගමාරච්චි මහත්මිය<br>COM/PP/2025/301<br>ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.05 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : MMWD/EST8/ Public Petition<br>දිනය : 2017.03.30 | කොළඹ 13, බලුමැන්ඩල් පෙදෙස, අංක 204/16 දරණ ස්ථානයේ පිහිටා තිබූ එවකට රු. ලක්ෂ 35ක් පමණ වටිනාකමින් යුත්, පෙත්සම්කාරියට අයත් එකම නිවස කොළඹ මහ නගර සභාව විසින් රජයට පවරා ගෙන කඩා ඉවත් කළ බවත්, එහි තිබූ විදුලි උපකරණ, ගෘහ උපකරණ ආදී කිසිවක් හෝ පෙත්සම්කාරියට නොලැබුන බවත්, එම නිවස පිහිටා තිබූ ඉඩමට පමණක් රු. 61,784.74 වන්දි මුදලක් හිමිවූ නමුත් කඩා දැමූ නිවස වෙනුවෙන් වන්දියක් හෝ විකල්ප නිවසක් හිමි නොවූ බවත් සඳහන් කරන පෙත්සම්කාරිය තමන්ට නිවසක් හෝ සාධාරණ වන්දි මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) ඉඩම් කොටස වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වන්දි තීරණය පරිදි රු. 61,794.72 ක වන්දි මුදලක් හා ඊට අදාළ පොලිය ලෙස රු. 17,602.67 ක මුදලක් ද ගෙවා ඇති බව<br><br>(ආ) මෙම ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ දී නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රතිපත්තිය වී ඇත්තේ අත්පත් කරගන්නා අවස්ථාවේ එම නිවසේ පදිංචිව සිටි පුද්ගලයන්ට වාසස්ථානය අහිමි වීම වෙනුවෙන් වාසස්ථානයක් ලබා දීම වන බවත්, පෙත්සම්කාරිය වෙත නිවසක් ලැබී නොමැත්තේ ඇය එම | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | කාල වකවානුවේදී එහි පදිංචිව නොසිටි හෙයින් වන බව<br><br>(ඇ) තක්සේරුකරු විසින් ඉදිරිපත් කරන ලද තක්සේරුව අනුව පෙත්සම්කාරිය හිමිකම් කියූ කැබලි අංක 37 සඳහා ඇය වෙත ලබාදී ඇති රු. 61,794.72 ක වන්දි මුදල සහ ඊට අදාළ පොලී මුදල වන රු. 17,602.60 ක මුදල ලබා දී ඇත්තේ එම ඉඩම සඳහා පමණක් නොවන අතර ඉඩම සහ නිවාසය යන දෙකම සඳහා වන බවට නිරීක්ෂණය වන බැවින් පෙත්සම්කාරිය වෙත නිවසක් ලබාදිය නොහැකි බව | |
| 30 | පී.යූ.ඩී. පෙරේරා මහතා<br>COM/PP/2025/144<br>ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.05 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : MUD&H/ADM/02/05<br>දිනය : 2021.03.18 | 1983.05.02 දින කොළොන්නාව රජයේ කර්මාන්තශාලාවේ සේවයට බැඳුනු බවත්, එහි නිලධාරීන්ගෙන් සිදු වූ විවිධ අසාධාරණ ක්‍රියා හේතුවෙන් නියමිත කාලයට වසර 3කට පෙර විශ්‍රාම ලබා ගැනීමට සිදු වූ බවත්, එහෙයින් පදිංචිව සිටි රජයේ නිවාසය ද ආපසු භාරදීමට සිදු වූ බැවින් කුලී නිවාසයක පදිංචි වීමෙන් මූල්‍යමය පාඩුවක් ද සිදු වූ බවත් සඳහන් කරන පෙත්සම්කරු කලින් විශ්‍රාම ලබා ගැනීම නිසා වසර 3ක් සඳහා අහිමි වූ වැටුප්, උසස් වීම්වලට අදාළ හිඟ වැටුප් හා වැටුප් වර්ධක ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු සිය කැමැත්තෙන් වයස අවුරුදු 57 දී විශ්‍රාම ගන්වන ලෙස ඉල්ලා විශ්‍රාම ලබා ඇති බව<br><br>(ආ) විශ්‍රාම ලැබූ අයෙක් මාස 03ක කාලයක් තුළ රජයේ නිවාස නැවත භාරදිය යුතු හෙයින් පෙත්සම්කරු තමා පදිංචි වී සිටි නිවාසය භාර දිය යුතු බව<br><br>(ඇ) පෙත්සම්කරු ඉල්ලා සිටින පරිදි සේවය නොකළ කාල පරිච්ඡේදයක් සඳහා වැටුප් සහ වැටුප් වර්ධක ගෙවීමට | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | නොහැකි බව | |
| **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** | | | | |
| 31 | ආර්.එම්. හේමචන්ද්‍ර බණ්ඩාර මහතා COM/PP/2025/74 ගරු කේ.වී.සමන්ත විද්‍යාරත්න මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 2/15/27/195 දිනය : 2024.01.18 | 1975 වර්ෂයේ සිට වසර 36ක් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවය කර ඌව පළාත් සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) ලෙස උසස් වීම ලබා 2011.07.01 දින වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගිය නමුත් ඌව පළාත් සභාවේ ඉල්ලීම මත එම තනතුරේම වසර 05 කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව, SL 01 වැටුප් පරිමාණය අදාළ වුවද තම වැටුප හා විශ්‍රාම වැටුප සකස් කර ඇත්තේ MN 07 වැටුප් පරිමාණයට බවත් සඳහන් කර ඇති පෙත්සම්කරු තනතුරට නියමිත වැටුප් පරිමාණය වන SL 01 ට අනුව වැටුප ද, විශ්‍රාම වැටුප ද අනෙකුත් වරප්‍රසාද ද ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු 2011.07.01 දින සිට විශ්‍රාම ලබා ඇති බවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඌව පළාත් සභාව සඳහා අදාළ තනතුර සඳහා 2013.01.01 දින සිට SL-1-2006 වැටුප් පරිමාණය අනුමත කර තිබීමත් හේතුවෙන් පෙත්සම්කරුගේ වැටුප හා විශ්‍රාම වැටුප SL-1-2006 අනුව සැකසීමට විධිවිධානයක් නොමැති බව<br><br>(ආ) පෙත්සම්කරු විසින් කොන්ත්‍රාත් පදනමින් සේවය කරන ලද 2013.01.01 දිනෙන් පසු කාල සීමාව සඳහා SL-1 - 2006 වැටුප් පරිමාණය අනුව වැටුප් ගෙවීම සිදු කර ඇති බව<br><br>(ඇ) පෙත්සම්කරු වෙත සහකාර පළාත් ඉඩම් කොමසාරිස් තනතුර 2010 වර්ෂයේදී පිරිනැමුවද තනතුර 1994 වර්ෂය දක්වා පෙරදාතම් කර ලබා දී ඇති බව<br>(ඈ) පෙත්සම්කරු වෙත 2009 වර්ෂය දක්වා අදාළ හිඟ වැටුප් ගෙවා ඇති බව හා | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ආයතනික වශයෙන් බොහෝ දුරට සාධාරණයන් ඉෂ්ඨ වී ඇති බව | |
| 32 | කේ.ජී. රාජසිංහ මහතා COM/PP/2025/138 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : IWRM/AD/DO/02/ ම.පෙ./09/2016 දිනය : 2017.02.27 | 1969.02.10 දින සිට 1980.09.25 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු පරිශීලන අංශයේ පර්යේෂණ සහායකයෙකු ලෙස සේවය කල බවත්, පඩි රහිත නිවාඩු ලබා විදේශ ගත වී සිට නැවත පැමිණ 1990.02.26 සිට 1990.08.01 දින දක්වා සේවය කල බවත්, පසුව අසනීප වීම නිසා සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 1990.11.22 දිනැති ලිපියෙන් සේවය හැර ගියා සේ සලකා කටයුතු කොට ඇති බවත්, වසර 10ට වැඩි සේවා කාලයක් ඇති අයට විශ්‍රාම ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන් 1990.10.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම යාමට අයදුම් කළ බවත් සඳහන් කරන පෙත්සම්කරු උක්ත චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) 1980.09.22 දින සිට 1983.09.22 දින දක්වා වසර 03ක් වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගෙන වැටුප් රහිත නිවාඩු කාලය අවසන් වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 1983.09.23 දින සිට සේවය අත් හැර ගියා සේ සලකා කටයුතු කර ඇති අතර ඒ පිළිබඳව පෙත්සම්කරු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කරනු ලදුව සේවයේ නොසිටි කාලය වැටුප් රහිත නිවාඩු සේ සලකා 1990.01.22 දින සිට නැවත සේවයේ පිහිටුවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් නිර්දේශය ප්‍රකාරව සේවයේ පිහිටුවන ලද බව<br>(ආ) 1990.08.12 දින සිට නැවත සේවයට වාර්තා කර නොමැති බැවින් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇති බව හා එම අවස්ථාවේ පෙත්සම්කරු විසින් රාජ්‍ය සේවා | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප වී ඇති බව<br><br>(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සහභාගීත්වයෙන් යුතු කමිටු නිර්දේශ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 44 වගන්තියෙහි සඳහන් කරුණා සහගත දීමනාව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 20 (1) වගන්තිය සමඟම එක්ව අර්ථ ගැන්විය යුතු බවට නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කරනු ලදුව, සේවය අතහැර යාම, ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම යන කරුණු මත සේවය අවසන් කල තැනැත්තෙකුට කරුණා සහගත දීමනාව හිමිගැන්විය නොහැකි බවත්, එම තීරණය 2009.01.06 දින සිට ක්‍රියාත්මක විය යුතු වන බවත් 2022.10.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලබා දී ඇති බව<br><br>(ඇ) ඒ අනුව තනතුර | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අතහැර යාමේ නිවේදනයක් මත සේවය අවසන් කර ඇති පෙත්සම්කරු වෙත කරුණා සහගත පාරිතෝෂිකය හිමිගැන්වීමට නොහැකි බව | |
| 33 | ඩී.සමන්ත පෙරමුණුගම මහතා COM/PP/2025/147 ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOI/AD/05/04/ ම.පෙ.(02-2023) දිනය : 2023.11.07 | 1988.06.15 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලේඛන භාරකරු II ශ්‍රේණියේ තනතුරකට පත් වී 1995.05.23 දින ලේඛන භාරකරු I ශ්‍රේණියට උසස් වූ බවත්, 2008 වසරේ දී අයුක්ති සහගත ලෙස නේවාසික කළමනාකරණ තඹුත්තේගම කාර්යාලයට ස්ථාන මාරුවක් ලබා දුන් බවත්, එහි සේවයේ යෙදී සිටිය දී ස්නායු රෝගයකට ගොදුරු වී එයට වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටිය දී පාලන අධිකාරිය විසින් සේවය හැරගිය බවට ලිපියක් නිකුත් කළ බවත්, ඒ සම්බන්ධව වාචිකව හා ලිඛිතව කරුණු දැක්වූ නමුත් සාධාරණයක් ඉටු නොවූ බැවින් අධිකරණමය ක්‍රියාමාර්ගයක් සඳහා යොමු වූ බවත්, නඩු අංක 35/2012 යටතේ 2014.06.11 දින මහාධිකරණය විසින් 2008.11.16 දින සිට 2012.05.15 දින දක්වා මාස 42 ක කාලයක් සඳහා රු. 362,040/- ක ගෙවීමක් ද සහිතව පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවීමට නියෝගයක් ලබා දුන් නමුත්, නැවත සේවයේ පිහිටුවීමට අධිකරණය විසින් නියම කරන ලද රු. 362,040/- ක මුදල | (අ) 2008 වර්ෂයේ සේවයට නොපැමිණීම හා රාජකාරි පැහැරහැරීම යන කරුණු මත පදනම්ව 2008.11.06 දිනැතිව සේවය හැර ගියා සේ සලකා ලිපියක් නිකුත් කර ඇති අතර ඊට විරුද්ධව පෙත්සම්කරු අනුරාධපුර කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොනුකර, අනතුරුව අනුරාධපුර මහාධිකරණය වෙත හිඟ වැටුප් ද ලබා දෙන ලෙස ඉල්ලා අභියාචනයක්ද ගොනු කර ඇති අතර එහි තීන්දුව මඟින් පෙත්සම්කරුට නැවත සේවය සමග රු. 362,040.00 ක මුදලක් හිඟ වැටුප් ලෙස ගෙවීමට තීරණය ලබා දී ඇති බව හා එම තීන්දුවට එරෙහිව 2014.07.23 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නීති අංශය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ගොනු කරන ලද බව | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | අවශ්‍ය නොවන බවට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් බලපෑම් කළ බවත්, රැකියාව නොමැතිව සිටි බැවින් එයට අත්සන් කර රැකියාව ලබා ගැනීමට සිදු වූ බවත්, වැටුප් වර්ධක සහ උසස් වීම් ලබා ගැනීමට ඇති අවස්ථා අහිමි කර ඇති බවත්, මහාධිකරණය විසින් ගෙවීමට නියම කරන ලද රු. 362,040/- ක මුදල ගෙවන ලෙසත්, අහිමි කර ඇති වසර 5ක වැටුප් වර්ධක ලබාදෙන ලෙසත්, වසර 34 ක තම සේවා කාලයට ලැබිය යුතු උසස් වීම් ද ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (ආ) එවකට විෂය භාර අමාත්‍යතුමා හමුවී කරන ලද සාකච්ඡාවකින් අනතුරුව පෙත්සම්කරු විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් හිඟ වැටුප් ලෙස ආයතනය විසින් ගෙවිය යුතු රු. 362,040.00 ක මුදල ස්වේච්ඡාවෙන් අත්හරින බව හා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලීමක් කරමින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇති අතර, ඒ් අනුව පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවා ඇති බව<br>(ආ) පෙත්සම්කරු සමඟ වූ එකඟතාවය මත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කරන ලද අභියාචනය මහවැලි අධිකාරිය මගින් ඉවත් කර ගත් බව<br>(ඇ) උක්ත විෂය භාර අමාත්‍යවරයා වෙනස් වූවද, පසුකාලීනව සිටි විෂය භාර අමාත්‍යවරයන් ගෙන් හෝ පෙත්සම්කරු විසින් සහනයක් ඉල්ලා නොසිටි බව<br>(ඈ) විශ්‍රාම ලබන විට පෙත්සම්කරු වෙත ප්‍රවාහන නිලධාරී II වන ශ්‍රේණියේ තනතුර දක්වා උසස්වීම් ද ලබා දී ඇති බව | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | | |
| 34 | ඩබ්.ඒ. ජයසේන මහතා COM/PP/2025/180 ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOI/AD/05/04/ ම.පෙ.(02-2024) දිනය : 2024.07.04 | පෙත්සම්කරුගේ භාර්යාවගේ නමින් චන්ද්‍රිකා වැව කොට්ඨාශයේ අවසාන ගම් පිඹුරු අංක 778/08 හි කැබලි අංක 1002 සඳහා අවසර පත්‍රයක් ලබා 2014 වසරේ සිට නිවසක් සාදාගෙන පදිංචිව සිටි බවත්, පසුව බිරිඳ හා දරුවා මිය යාම හේතුවෙන් මානසික ව්‍යාකූලතාවයෙන් මිදීම සඳහා වෙනත් අයකු වෙත වාචිකව අදාළ දේපළ භාර දී කොළඹ ප්‍රදේශයේ සේවයට ගොස් කොරෝනා වසංගතය හේතුවෙන් නිවසට යාමට නොහැකි වූ අතර පසුව නැවත යන අවස්ථාවේ, පෙත්සම්කරුගේ නිවස, එය භාරගත් පුද්ගලයාගේ පුත්‍රයාගේ නමට හරවා ඇති බවත්, මේ වනවිට අවසර පත්‍රය අවලංගු කර රජය සතුව පවතින බවත්, මේ පිළිබඳ අදාළ ආයතනවලට හා පොලීසියට පැමිණිලි කළද නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නමුත් අයිතිය තහවුරු කිරීමට සාක්ෂි පවතින බැවින් අදාළ නිවස සහිත ඉඩම ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩමක් පුද්ගයන් අතර අවිධිමත්ව බැහැර කිරීම නීත්‍යානුකූල නොවන හෙයින් ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි නියමිත ක්‍රියා පටිපාටිය සම්පූර්ණයෙන් සිදු කිරීමෙන් අනතුරුව එම ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ බව<br>(ආ) ප්‍රස්තුත ඉඩම පෙත්සම්කරු විසින් පොරොන්දු ඔප්පුවක් මඟින් අන්සතු කර ඇති බවට කාරක සභාවට අනාවරණය වූ අතර එවැනි පොරොන්දු පත්‍රයකට අත්සන් නොකළ බව හා එහි පවතින අත්සන තමාගේ නොවන බවට වන පෙත්සම්කරුගේ ප්‍රකාශය<br>(ඇ) අදාළ පොරොන්දු පත්‍රයේ සඳහන් අත්සන පෙත්සම්කරුගේද නැතහොත් ව්‍යාජ අත්සනක් ද යන්න සනාථ කර ගැනීම පිළිබඳ ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශය විසින් අධිකරණය හරහා 2022.05.06 දින රස පරීක්ෂක වාර්තාවක් ලබා ගෙන ඇති බව හා | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | එම වාර්තාවෙන් පොරොන්දු පත්‍රයෙහි සඳහන් අත්සන පෙත්සම්කරුගේ අත්සන බවට සනාථ කර ඇති බව | |
| 35 | එස්.ඒ.සෝලිත සුභසිංහ මහතා COM/PP/2025/70 ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : Agri/AD/E11/1/53 දිනය : 2025.04.28 | 2009 වර්ෂයේදී ව්‍යාජ අධ්‍යාපන සහතිකයක් ඉදිරිපත් කළ බවට චෝදනා කරමින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් පෙත්සම්කරු බන්ධනාගාර ගත කළ බවත්, අධිකරණය ඉල්ලා සිටි ව්‍යාජ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත නොමැති බව කොමසාරිස්තුමා විසින් අධිකරණයට දැන්වූ බවත්, වසර 08කට පසුව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් නඩුව ඉල්ලා අස් කරගත් බවත්, වගකීම් විරහිතව මෙම විමර්ශනය කරන ලද බව ගරු මහේස්ත්‍රාත්තුමාගේ තීරණය වූ බවත්, මේ සම්බන්ධව මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ද තීන්දුවක් ලබා දී ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) සමෘද්ධි නියාමක තනතුරේ මුල් පත්වීම් ලැබ 1996.03.01 දින සිට ගොවි සේවන නියාමකයෙකු වශයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට බැඳී ඇති අතර 1998.09.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත 1999.05.03 සිට එම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන ලද ගොවි සේවන නියාමකවරුන් 3500 දෙනෙක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරට පත් කරන ලද බවත්, ඒ අනුව පෙත්සම්කරු ද කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරට පත්ව ඇති බව<br>(ආ) එම තනතුරට පත්වීමේ සුදුසුකම් පරීක්ෂා කිරීමේදී ඉහත පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති 1980 වර්ෂයේ අ.පො.ස. (සා/පෙළ) විභාග අංක 3143872 දරන ප්‍රතිඵල ලේඛනය | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | හා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ප්‍රතිඵල සනාථ කිරීමේ ලේඛනය එකිනෙක පරස්පර වී ඇති බැවින් සේවය අවසන් කර ඇති බව<br><br>(ඇ) පෙත්සම්කරු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයට අදාළ විර්මශන කටයුතු සඳහා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ 3 වැනි පරිශිෂ්ඨය අනුව සකස් කරන ලද වාර්තාව සහ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බවත්, ඒ අනුව පෙත්සම්කරු ඉහත තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ව්‍යාජ සහතිකයක් ඉදිරිපත් කිරීමත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් එය ව්‍යාජ සහතිකයක් බවට සහතික කර තිබීමත් සහ ඔහු තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොතිබීමත් යන කරුණු මත ඔහුගේ අභියාචනය ප්‍රතික්ෂේප කළ බව<br>(ඇ) පෙත්සම්කරු | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ඇතුළු පිරිසක් අභියාචනාධිකරණය වෙත යොමු කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කරන බවට තීන්දුව ලබා දී ඇති බව<br>(ඉ) පෙත්සම්කරු ඇතුළු පැමිණිලිකරුවන් 85 දෙනෙකු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට පරීක්ෂණ නිලධාරී විසින් "පැමිණිලිකරුවන් එකී එක් එක් අයගේ විභාග සහතික කෙරෙහි කොතෙක් වගකීමෙන් බැඳෙන්නේද" යන්න පිළිබඳව පරීක්ෂණයක් කොට ඒ අනුව වරදට යටත් නොවන පිරිස නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කර ඇති බව<br>(ඊ) මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය ක්‍රියාත්මක කරවා ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරු ජනාධිපති කාර්යාලයට යොමු කර ඇති ලිපියට පිළිතුරු ලෙස, සහනයක් ලබා දිය නොහැකි බව දන්වා යවා ඇති බව<br>(උ) පෙත්සම්කරු විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අභියාචනයක් ඉදිරිපත් කරන ලදුව එය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කර ඇති බව<br>(ඟ) ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීමේ හේතුව මත සේවය අවසන් කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් හට සහන සැලසීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා රාජ්‍ය සේවයට අහිතකර පූර්වාදර්ශයක් බිහිවන නිසාත්, රාජ්‍ය සේවයට පිවිසීම සඳහා අයථා ක්‍රියාමාර්ගවලට පුද්ගලයින් පෙළඹවීමට දිරිගැන්වීමක් ඇති වන නිසාත් මීට එකඟ විය නොහැකි බව දක්වා සංදේශය ප්‍රතික්ෂේප කරන බව හා එවැනි වරදවල් කරන අයට එරෙහිව නීත්‍යානුකූලව හා විනයානුකූලව කටයුතු කළ යුතු බව දක්වා ඇති බව<br>(එ) අධ්‍යාපන සහතික නිකුත් කිරීමේදී පාසල්වලින් නිකුත් කර ඇති අධ්‍යාපන සහතික වල දෝෂ ඇත්නම් ඒ සම්බන්ධව ඒවා සකස් කළ පුද්ගලයන් වගකිව යුතු බවත්, සමෘද්ධි නියාමක මූලික සුදුසුකම් සාමාන්‍ය | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | පෙළ විෂයයන් 5 ක් සමත් වීම බවත්, ජනාධිපති ලේකම්ගේ 2006.09,16 දිනැති ලිපියෙන් පෙන්වා දී ඇති අතර මේ සම්බන්ධව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ තමාට විරුද්ධව නඩුවක් ගොනු කර වසර 09 ක් නඩුව පවත්වාගෙන ගොස් අවසානයේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් නඩුව ඉල්ලා අස්කර ගත් බවත් පෙත්සම්කරු විසින් සඳහන් කරන ලද බව (ඒ) පෙත්සම්කරුගේ අධ්‍යාපන සහතිකය දෝෂ සහගත වීම මත ඔහුගේ සේවය අවසන් කර ඇති බවත්, පෙත්සම්කරු තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බවත්, මෙම සහතිකය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් ඔහු විසින් වරදක් කර නොමැති බව මෙහි දී සනාථ නොවන බව | |
| 36 | ඩබ්ලිව්.ජී. අනුලාවතී මහත්මිය COM/PP/2025/193 ගරු කේ.වී.සමන්ත විද්‍යාරත්න මහතා, | බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පරිපාලන අධිකාරිය විසින් 1980 වර්ෂයේ සිට 1994 | (අ) පෙත්සම්කාරිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම | පෙත්සම්කාරිය හට පාරිතෝෂික මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙස |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : Agri/AD/E11/1/56 දිනය : 2025.04.16 | වර්ෂය දක්වා කාලයට පෙත්සම්කාරියගෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් අය නොකිරීම හේතුවෙන් එම කාලය විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා ගණනය කර නොමැති බව සඳහන් කරන පෙත්සම්කාරිය අදාළ කාලයට දායක මුදල් අය කරගෙන හෝ අනියම් හා කොන්ත්‍රාත් සේවා කාල ඒකාබද්ධ කර විශ්‍රාම වැටුප සකස් කර දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අනියම් කම්කරුවෙකු ලෙස 1980 - 1984 දක්වා සේවය කර වසර 24 ක දීර්ඝ සේවා කඩවීමකින් පසුව නැවත 2008.09.12 දින කොන්ත්‍රාත් පදනම මත කම්කරු සේවයට පැමිණ ඇති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (i) හි විධිවිධාන යටතේ 2014.12.30 දින ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත් කර ඇති බවත්, ස්ථිර පත්වීම ලබන විට වයස අවුරුදු 54ක් වන බවත්, පෙත්සම්කාරිය වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2020.07.04 දින විශ්‍රාම ගන්වා ඇති බව<br>(ආ) කොන්ත්‍රාත් කම්කරුවන් ලෙස සේවයේ යෙදී සිටිය දී වයස අවුරුදු 45 ඉක්මවන ලද කම්කරුවන් වෙත ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හා 25/2014(i) අනුව ස්ථිර පත්වීම පිරිනමා ඇති බව<br>(ඇ) එවැනි සේවකයන් හට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි ගැන්වීමට අමාත්‍ය මණ්ඩල සංදේශ 02 ක් | නිර්දේශ කළ අතර ඉල්ලා සිටින සහනය වන විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ඉදිරිපත් කර ඇති බව<br>(ඈ) ඒ සඳහා 2018.06.20 දිනැති අමප/18/0495/728/016 හා 2021.08.03 දිනැති අමප/21/1269/315/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇති බව<br>(ඉ) එකී අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විශ්‍රාම ගණනයට අදාළ පෙත්සම්කාරියගේ මුළු සේවා කාලය අවුරුදු 08 මාස 05 දින 09 ක් වන බව<br>(ඊ) ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පෙත්සම්කාරියගේ විශ්‍රාම වැටුප් ගණනයට අදාළ සේවා කාලයට හිමි වන්නේ සේවා පාරිතෝෂිකයක් පමණක් වන බව<br>(උ)ඊට අදාළ අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව<br>(ඌ) පෙත්සම්කාරිය විසින් සමස්ත වශයෙන් රජයේ සේවයේ යෙදී සිටි කාලය වසර 14 මාස 09 දින 22 ක් වන බැවින් ඒ සඳහා විශ්‍රාම වැටුපක් අපේක්ෂා කරන බවත්, පාරිතෝෂිකය පමණක් ලබා ගැනීමට | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අපේක්ෂා නොකරන බවත් සඳහන් කරන ලද බව | |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 37 | ඊ.ජේ.ඒ.පී. දයානන්ද මහතා<br>COM/PP/2025/202<br>ගරු ටී.කේ.ජයසුන්දර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.09 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : MOD/DEF/GS-5/PPC/GENERAL (157)<br>දිනය : 2021.02.25 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය සේවයේ වසර 15 මාස 02 දින 26 ක සේවා කාලයක් සපුරා ඇති අතර එයට අමතරව ස්වේච්ඡා සේවා කාලය වසර 04 මාස 08 දින 16 ක් වන නමුත් විශ්‍රාම වැටුප සකස් කිරීමේදී යුද්ධ හමුදා වැටුප් හා ලේඛන කාර්යාලයෙහි ප්‍රමාද දෝෂයකින් ස්වේච්ඡා හමුදා සේවා කාලය නිවැරදිව ගණනය කර නොමැති බවත්, 1989.06.15 වැනි දින අංක 562/11 යන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග පරිදි 1983 වර්ෂයට පෙර හමුදා සෙබළෙකු යුද්ධ හමුදා සේවයෙන් ඉවත් වූ පසු ඔහුට වසර 03 ක කාලයක් ගණන් ගනු ලබන සේවා කාලයට එකතු කළ යුතු බවත්, එසේ එකතු කළ විට සිය සේවා කාලය අවුරුදු 22 මාස 09 හා දින 26ක් සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු අනුමත විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු යුද හමුදාවෙන් අස්කරන ලද දිනය වන 1991.07.30 දිනට අදාළව ස්වේච්ඡා හමුදා සේවා කාලය වසර 04 මාස 06 දින 28 ක් හා නිත්‍ය හමුදා සේවා කාලය වසර 12 මාස 06 දින 21 ක් වී ඇති බවත්, ඒ අනුව සමස්ත හමුදා සේවා කාලය වසර 17 මාස 01 දින 19 ක් වන බව<br><br>(ආ) 2007.08.31 දින අංක 1512/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වසර 20 කට අඩු නොවන සේවා කාලයක් ඇත්නම් විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති ලෙස සංශෝධනය කර ඇතත් 1989.06.15 දිනැති අංක 562/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 34 වගන්තිය අනුව 1983.12.31 දිනට පසු නොවන දිනයක සේවය තවදුරටත් අනවශ්‍ය වීමේ පදනම මත සේවයෙන් ඉවත් කරන ලද සෙබළෙකු හට විශ්‍රාම වැටුපට හා පාරිතෝෂික කාර්යයන් සඳහා වසර 03 ක කාලයක් එකතු | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | කළ යුතු බව සඳහන් කර ඇති බැවින් පෙත්සම්කරු වසර 20 ක සේවා කාලයකට හිමිකම් නොමැති බව | |
| 38 | එස්.එච්.එන්.ආර්. සමරතුංග මහතා COM/PP/2025/208 ගරු වසන්ත පියතිස්ස මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.09 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/PAC/05/PPC/ 2024/12 දිනය : 2024.08.08 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කළ බවත්, රිය අනතුරකට ලක්ව විධිමත් පරිදි වෛද්‍ය සහතික ඉදිරිපත් කර නිවාඩු ලබා සිටි බවත්, පසුව 2012.09.21 දින නැවත සේවයට වාර්තා කිරීමට අවස්ථාවක් ලබා නොදුන් බවත් සඳහන් කර ඇති පෙත්සම්කරු නැවත රැකියාව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු දීර්ඝ කාලීනව සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ඔහුගේ සේවය අත්හිටුවීමට තීරණය කර ඇති බව<br><br>(ආ) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් මේ වනවිට අත්හිටුවා ඇති බව හා එම දෙපාර්තමේන්තුව මේ වන විට වසා දැමීමට පියවර ගනිමින් පවතින බව<br><br>(ඇ) සේවය අවසන් කරන විට පෙත්සම්කරු අනියම් පදනමින් දෛනික වැටුප් ලබමින් සේවය කරමින් සිට ඇති බවත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඔහුගේ සේවා කාලය දළ වශයෙන් වසර දෙකක් පමණ වන බව<br><br>(ඈ) පෙත්සම්කරු විසින් නැවත සේවයේ පිහිටුවීමට තරම් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොමැති බව | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 39 | ඩබ්ලිව්.එම්.අයි.ආර්. චන්ද්‍ර මහතා COM/PP/2025/141 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.09 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/PAC/05/PPC/ 2025/02 දිනය : 2025.04.07 | ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටියදී රෝගී තත්ත්වයක් හේතුවෙන් නාවික හමුදා රෝහල වෙත යොමු වූ බවත්, පසුව සැත්කමද සිදු කළ අතර අසනීප තත්ත්වයන් හේතුවෙන් ත්‍රිවිධ හමුදා වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලදුව 2020.08.18 දින සේවා විශ්‍රාම වැටුපක් සහිතව විශ්‍රාම ගන්වන ලද නමුත්, වෙනත් රැකියාවක් හෝ සිදු කිරීමට නොහැකි තරම් දුබල වී ඇති අතර, තම දුබලතාවය සලකා වයස අවුරුදු 55 වන තෙක් වැටුප් සහ දීමනා ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) වෛද්‍ය මණ්ඩල 04 ක් පවත්වා දුබලතා ප්‍රතිශතය 90% ක් ලෙස සඳහන් කර ඇති බවත්, ඒ අනුව 2020.08.18 දින වසර 12 ක සේවය අවසන් කිරීමෙන් අනතුරුව පෙත්සම්කරු හට විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති බව<br><br>(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 ප්‍රකාරව සහන හිමි ගැන්වීම සඳහා පත් කර ඇති කමිටුව විසින් "මෙම නාවික පුද්ගලයාගේ රෝගී තත්ත්වය සේවයේ යෙදී සිටිය දී හෝ සේවයට වාර්තා කිරීමේ දී සිදු වූවක් බවට තහවුරු නොවන බැවින් රා.ප.ච. 22/93 විෂය පථය අනුව සහන හිමිගැන්විය නොහැක" ලෙස තීරණය ලබා දී ඇති බව<br><br>(ඇ) දැනටමත් ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සැලකිය යුතු සහන ප්‍රමාණයක් සලසා දී ඇති බැවින් අමතර සහන ලබා දීමට හැකියාවක් නොපවතින බව | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 40 | එම්.කේ. බුද්ධදාස ජයසේකර මහතා<br>COM/PP/2025/41<br>ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : MFI/01/22/PB/Ap.& Peti.<br>දිනය : 2019.07.29 | මහජන බැංකුවේ විශ්‍රාමික සේවකයකු වන පෙත්සම්කරුගේ විශ්‍රාම වැටුප, "වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප" යන මැයෙන් යුතු ලිපියෙන් ප්‍රකාශිත පරිදි කප්පාදු කිරීමට මහජන බැංකු බලධාරීන් කටයුතු කර ඇති බවත්, විශ්‍රාම වැටුප සැකසූ පරිමාණය තහවුරු කර දී නොමැති බවත්, ගණනය කළ ආකාරය සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බවත්, විශ්‍රාම වැටුප් කප්පාදුව නතර කර දෙන ලෙසත්, හිමිකම් සාක්ෂාත් කරදෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු මහජන බැංකුවේ ආරක්ෂක නිලධාරියකු ලෙස සේවයේ නිරතව සිටියදී 1984 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා මුදල් අමාත්‍යාංශයේ ආරක්ෂක ඒකකයේ සේවය කිරීම සඳහා කැඳවා ඇති අතර, එහිදී සේවයෙන් පැය 04කට අධික කාලයක් බැහැරව සිටීම යන චෝදනාව අනුව පෙත්සම්කරු සම්බන්ධයෙන් වැඩිමනත් ක්‍රියාමාර්ග ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශය විසින් මහජන බැංකුව වෙත දැනුම් දී ඇති බව<br><br>(ආ) ඒ අනුව මූලික විමර්ශනය සහ විධිමත් විමර්ශනය සිදු කළ බවටත්, ගිනි අවිය අනාරක්ෂිතව තබා ඌරුබොක්ක ශාඛාවෙන් බැහැරව යාම, වෙඩි පුහුණුව සඳහා සහභාගි නොවීම, තමා භාරයේ වූ ගිනි අවිය නොසැලකිලිමත් ලෙස පරිහරණය කිරීම/ක්‍රියාත්මක වීම ආදී පෙර වැරදිද සලකා බලා 2001.10.22 වැනි දින සිට සේවයෙන් පහ කිරීම සිදු කර ඇති බව<br><br>(ඇ) පෙත්සම්කරු විසින් පාර්ලිමේන්තු | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | උපදේශක කාරක සභාව වෙත යොමු කර තිබූ පැමිණිල්ල සඳහා ලබා දුන් තීන්දුව අනුව මහජන බැංකු සභාපතිතුමා සමග සාකච්ඡා කොට පූර්ණ හා අවසන් දීමනාවක් වශයෙන් රු. ලක්ෂ තිහක මුදලක් ලබා ගැනීමට එකඟ වී සමථයකට පත්වූ බව<br>(ඇ) පෙත්සම්කරුට වයස අවුරුදු 55 සම්පූර්ණ වන 2010.09.25 වැනි දින හෙවත් වෛකල්පිත විශ්‍රාම දිනය දක්වා වන සම්පූර්ණ වැටුප ගණනය කර එ් අනුව ඉහත සඳහන් රු. ලක්ෂ 30ක මුදල ගණනය කළ බව<br>(ඉ) එම රු. ලක්ෂ 30ක මුදලට අමතරව සම්පූර්ණ විශ්‍රාම වැටුප හා වෛද්‍ය පහසුකම් ඇතුළු මහජන බැංකු විශ්‍රාමිකයන්ට හිමි වන සියලු පහසුකම් මේ දක්වාම භුක්ති විඳීමට සලස්වා ඇති බව<br>(ඊ) විශ්‍රාම වැටුප් පිළිබඳ තොරතුරු පද්ධතිගත කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් වැඩිපුර ගෙවා ඇති රු. 802,066.76ක මුදල පෙත්සම්කරුගෙන් මාසිකව රු. 10,000/- බැගින් 2017 අගෝස්තු මස සිට අය කර ගැනීමට පියවර ගන්නා ලද බව හා | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ප්‍රමාද දෝෂයකින් ගිණුමට අයත් නොවන යම් මුදලක් බැර කර තිබේ නම්, ගිණුම හර කර එම මුදල අය කර ගැනීමට පෙත්සම්කරු විසින් වාර්ෂික පොරොන්දු වීමේ/ බලය දීමේ ලියවිල්ල මගින් බැංකුව වෙත බලය පවරා ඇති බව | |
| 41 | එස්.එස්. මහින්ද අබේසේකර මහතා COM/PP/2025/46 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : MIP/1/6/3 දිනය : 2023.06.09 | 2017.11.01 දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කලාප කළමනාකරණ) ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට බැඳී මීරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ කලාප ප්‍රධානියා වශයෙන් සේවය කරමින් සිටින බවත්, බියගම අපනයන සැකසුම් කලාපයේ අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුස්සෙක් තෝරා ගැනීම පිණිස 2021.03.30 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට අභ්‍යන්තර අයදුම්කරුවෙකු වශයෙන් ඉදිරිපත් වූ බවත්, එහිදී දැඩි අසාධාරණයක් සිදු වූ බවත් සඳහන් කරන පෙත්සම්කරු, මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කර සාධාරණ හා නිවැරදි අවසන් තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ බියගම අපනයන සැකසුම් කලාපයේ අධ්‍යක්ෂ තනතුර සඳහා 2021.03.08 දිනැතිව අයදුම්පත් කැඳවූ බව හා පෙත්සම්කරු ඇතුළු අභ්‍යන්තර අයදුම්කරුවන් 05 දෙනකු ඒ සඳහා අයදුම් කරන ලද බව<br>(ආ) මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ බඳවාගැනීමේ පටිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් දරන සහ අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අභ්‍යන්තර | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අයදුම්කරුවන්, අධ්‍යක්ෂ තනතුරට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන බව<br><br>(ඈ) අධ්‍යාපන සුදුසුකම්, අධ්‍යක්ෂ තනතුරට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකමක් ලෙස සලකා නොබලන බවත්, කෙසේ වෙතත් අධ්‍යාපන සුදුසුකම් සඳහා සම්මුඛ පරීක්ෂණයේදී අමතර ලකුණු ලබා දීමක් සිදු කරන බව<br><br>(ඇ) ඒ අනුව සුදුසුකම් ලැබූ අභ්‍යන්තර අයදුම්කරුවන් 05 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අතර එයින් අයදුම්කරුවන් 04 දෙෙනකු සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ බව<br>(ඉ) පෙත්සම්කරුට එම සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් පරිදි ලකුණු හිමි වූ බව | |

<table>
<tr><th>අනු අංකය</th><th>පෙත්සම සම්බන්ධ තොරතුරු</th><th>අපේක්ෂිත සහනය</th><th>කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු</th><th>කාරක සභාවේ නිර්දේශය</th></tr>
<tr><td></td><td></td><td></td><td>
<table>
<tr><td>අධ්‍යාපන සුදුසුකම්</td><td>12</td></tr>
<tr><td>සේවා පළපුරුද්ද</td><td>0</td></tr>
<tr><td>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය</td><td>14</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td>26</td></tr>
</table>
<br>(ඊ) අදාළ තනතුරට තේරී පත්වූ නිලධාරියාට පහත පරිදි ලකුණු හිමිවූ බව
<table>
<tr><td>අධ්‍යාපන සුදුසුකම්</td><td>03</td></tr>
<tr><td>සේවා පළපුරුද්ද</td><td>10</td></tr>
<tr><td>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය</td><td>28</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td>41</td></tr>
</table>
<br>(උ) ඒ අනුව අදාළ තනතුරට තෝරා පත් කරගත් නිලධාරියා මුළු ලකුණු 41ක් ලබා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රථම ස්ථානය ලබා ඇති බව හා පෙත්සම්කරු මුළු ලකුණු 26ක් ලබා සිව්වන ස්ථානයේ පසුවන බව
<br><br>(ඌ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය, ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ
</td><td></td></tr>
</table>

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ජනරාල්, උපදේශක, විධායක අධ්‍යක්ෂ (කලාප), විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගෙන් යුක්ත වූ බව<br>(එ) බියගම අපනයන සැකසුම් කලාපය සේවකයින් 30,000කගෙන් පමණ සමන්විත මෙරට දෙවන විශාලතම අපනයන සැකසුම් කලාපය බවත් පෙත්සම්කරු දැනට සේවය කරන සේවකයන් 1400කගෙන් පමණ සමන්විත මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය හා සැසඳීමේදී එවැනි විශාල කලාපයක් පාලනය කිරීම සඳහා අවශ්‍ය නායකත්ව ගුණාංග ආදිය ඉහත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සලකා බලන ලද බව | |
| 42 | ඒ.පී. රාජසූරිය මහතා COM/PP/2025/73 ගරු කේ.වී.සමන්ත විද්‍යාරත්න මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/02/BOC | 2010.05.03 දින පුහුණු මාණ්ඩලික සහකාරවරයෙකු ලෙස ලංකා බැංකුවට බැඳුණු බවත්, 2018 වසරේදී පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා තැන්පතු මුදල් පෙන්වීම සඳහා බැංකුවේ උසස් නිලධාරියෙකුගේ මගපෙන්වීම යටතේ පෙත්සම්කරුගේ නමින් ස්ථිර තැන්පතුවක් විවෘත කර ඊට එරෙහිව අයිරා | (අ) පෙත්සම්කරු විසින් තම ඉඩමක් විකුණා මුදලක් ලැබීමට ඇති බව පවසා බැංකුවේ නිලධාරියකු ලවා රු. 8,115,000/-ක ස්ථාවර තැන්පතුවක් විවෘත කරවා ගෙන, ඊට අවශ්‍ය මුදල වෙනුවෙන් තම ජංගම ගිණුමට අදාළ චෙක්පතක | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | /COPP<br>දිනය : 2025.03.28 | පහසුකමක් ලබා ගත් බවත්, එය බැංකුවේ නිලධාරීන්ගේ උපදෙස් මත සිදු කරන ලද්දක් වන අතර ඉන් බැංකුවට කිසිදු පාඩුවක් හෝ හානියක් සිදු නොවූ බවත්, මේ හේතුවෙන් 2019.08.09 දින සේවය අත්හිටුවන ලදුව 2022.09.13 දින සේවයෙන් ඉවත් කරන ලද බවත් සඳහන් කරන පෙත්සම්කරු, නැවත සේවයේ පිහිටුවා හිඟ වැටුප් සහ අහිමි කළ වරප්‍රසාද නැවත ලබා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | රු. 8,115,000ක වටිනාකම සඳහන් කර ණය පත්‍රයක්ද (credit slip) සමග අදාළ කවුන්ටරය වෙත ලබා දී, ඒ සඳහා ණය වවුචරයක්ද (credit voucher) ලබා ගෙන ඇති බව<br><br>(ආ) ඒ අනුව ස්ථාවර තැන්පතුව ඇපයට තබා ලබා ගත හැකි ණය මුදලක් (Cash back facility) ලබා දෙන ලෙස ඉල්ලා ඇති බව හා මෙම කටයුතු සඳහා වෙනත් නිලධාරීන්ගේ රහස්‍ය මුර පද භාවිතා කර ඇති බව<br><br>(ඇ) මෙය තමා විසින් හිතාමතා කළ කටයුත්තක් බැවින් වෙනත් නිලධාරීන් මෙයට වගකිවයුතු නොවන බවට පෙත්සම්කරු විසින් විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දී ඇති බව<br><br>(ඈ) වංචනික ලෙස ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කිරීම, වංචනික ලෙස තාවකාලික අයිරා සීමාවක් (TOD limit) ලකුණු කිරීම, බැංකුවේ වත්කම් අවභාවිතා කිරීම සහ වංකභාවය (dishonesty) ආදී කරුණු මත තවදුරටත් පෙත්සම්කරු බැංකු සේවයේ තබා ගැනීම බැංකු පරිචයට අනුව කළ නොහැකි බව | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය** | | | | |
| 43 | පී.යූ.පී.කුමාර ද සිල්වා මහතා COM/PP/2025/338 ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ES/DIR/J/9(II) දිනය : 2023.01.11 | 2000.10.13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ (විදුලි) II/II පන්තියට අදාළ ස්ථිර පත්වීමක් ලබා දී හිඟ වැටුප්, දීමනා සහ තනතුරට අදාළ අනෙකුත් වරප්‍රසාද ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) විදුලි ඉංජිනේරු තනතුරෙහි වැඩ බැලීම සිදු කළ බවට හා ඒ සඳහා වැඩ බැලීමේ දීමනා ගෙවා ඇති බවට වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ IX වැනි පරිච්ඡේදයේ 141 වගන්තිය ප්‍රකාරව, යම් රජයේ නිලධාරියකු යම් තනතුරක රාජකාරි ඉටු කළ පමණින්ම එම තනතුරට ස්ථිරව බඳවාගැනීම සඳහා එය සුදුසුකමක් නොවන හෙයින් පෙත්සම්කරු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II/II තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට පත්කර තිබීම ස්ථිර පත්වීමක් ලබා දීමට අදාළ වන සුදුසුකමක් නොවන බව<br><br>(ආ) අංක 2027 හා 2017.07.07 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට සීමිත පදනමින් නිලධාරීන් බඳවාගැනීමට අයදුම්පත් කැඳවා ඇති | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අතර පෙත්සම්කරු ඒ සඳහා විදුලි 03 කාණ්ඩය යටතේ අයදුම් කර ඇතත් ඒ සඳහා වන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව<br><br>(ඇ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරීන් (කලින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය) උසස් කිරීම මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත් කිරීම සඳහා අදාළ 1997.08.05 දිනැති ඉංජිනේරු සේවා චක්‍රලේඛ අංක 31ට අනුව තිබිය යුතු අවම සුදුසුකම් පෙත්සම්කරු විසින් සපුරා නොමැති බව<br><br>(ඇ) අංක 1836/6 හා 2013.11.11 දිනැති ගැසට් පත්‍රය මගින් ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කිරීමට පෙර, දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ (විදුලි) ලෙස සේවය කළ නිලධාරීන් හට පමණක් සේවා අවශ්‍යතාවය මත ඉංජිනේරු සේවයට ඇතුළත් වීමට අවස්ථාව ලැබී තිබුණු බව | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 44 | කේ.පී.රංජිත් මහතා<br>COM/PP/2025/40<br>ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.08.05 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : 02/03/23/59/2021<br>දිනය : 2022.03.23 | 1986.11.22 දින ආධුනික පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලීසියට එක්ව බණ්ඩාරකුලම් පොලිස් මුරපොලේ සේවය කරමින් සිටියදී 2007.07.08 සිට දින 06ක නිවාඩුවක් ලබා ගත් බවත්, එහිදී හදිසියේ රෝගී වීම නිසා 2007.07.14 දින සිට 2007.09.25 දින දක්වා ප්‍රතිකාර ලබාගත් බවත්, 2007.07.15 දින වැල්ලවාය පොලීසිය මගින් හා තැපැල් මගින් සේවා ස්ථානයට වෛද්‍ය වාර්තා යවා දැනුම්වත් කළ බවත්, 2007.09.25 දින ඌරුබොක්ක පොලිස් ස්ථානය මගින් කිසිදු වරදක් නොමැතිව අත්අඩංගුවට ගෙන 2008.02.25 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකළ බවත්, පසුව 2009.09.29 දින ලිපියක් මගින් 2007.07.24 දින සිට සේවය හැර යාමේ නියෝග නිකුත් කර ඇති බවත්, මාතර මහාධිකරණයේ පෙත්සම්කරුට විරුද්ධව පැවති අංක 133/2014 දරන නඩුවෙන් නිදොස් කොට නිදහස් කළ බවත්, ජාතික පොලිස් කොමිෂන් සභාවට හා පොලිස්පතිතුමා වෙත අභියාචනා ඉදිරිපත් කළ බවත් සඳහන් කරන පෙත්සම්කරු, නැවත රැකියාව ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) සේවයට වාර්තා නොකරන ලද 2007.07.15 වැනි දින සිට 2007.09.25 වැනි දින තෙක් කාල සීමාව තුළ නොපැමිණීමට හේතු ලෙස පෙත්සම්කරු විසින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද සිය පෙත්සමෙහි සඳහන් කර ඇති කරුණු, ඔහු විසින් එකී කාල සීමාව තුළ සේවයට වාර්තා කිරීමට නොහැකි වූ හේතු ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනයෙහි ඇතුළත් කරුණු සමඟ සසඳා බලන විට පරස්පර ස්වභායක් පෙන්නුම් කරන බව<br><br>(ආ) 2007.09.29 වැනි දින පෙත්සම්කරුට තනතුර අත්හැර යාමේ නියෝගය නිකුත් කර ඇති බව<br><br>(ඇ) බෙලිඅත්ත පොලිස් ස්ථානාධිපති විසින් පෙත්සම්කරු සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ පසුබිම් වාර්තාවට අනුව 2007.09.25 දිනැතිව ගල්කටස් වර්ගයේ ගිනි අවියක් සමග ඔහු අත්අඩංගුවට ගෙන | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | මොරවක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමෙන් අනතුරුව නිදහස් කර ඇති බවද, නැවත මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් මොරවක මහේස්ත්‍රාත් අධිකරණයේ හා මාතර මහාධිකරණයේ නඩු පවරන ලදුව පැමිණිල්ලේ සාක්ෂි ප්‍රමාණවත් නොවීම යන හේතුව මත ඔහු නිදොස් කොට නිදහස් කර ඇති බව හා වෙනත් සේවය හැර යාමේ නියෝගයක් හා වැඩ තහනම් කොට තිබූ කාලයක් ද පෙත්සම්කරුගේ සේවා වාර්තාවේ ඇතුළත් වන බව | |
| 45 | එස්.එල්. හෙට්ටිආරච්චි මහත්මිය COM/PP/2025/55 ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 01/02/03/09/2024 දිනය : 2024.07.11 | 1986.09.08 දින ඉංග්‍රීසි යතුරු ලේඛිකාවක් ලෙස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව 1998. 11.19 දක්වා සේවය කළ බවත්, 1996 වසරේ කාන්තා පොලිස් සැරයන් තනතුරට උසස්වීමක් ලබා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පොලිස් කාර්යාලයේ පාලන අංශයේ රැකියාව කළ බවත්, 1997 වර්ෂයේ වරින් වර ඇතිවූ අසනීප තත්ත්වයක් හේතුවෙන් 1998.11.19 දින සේවයෙන් ඉවත් වීමට අනුමැතිය ලබා ගත් බවත්, 2010/13 සංශෝධිත විශ්‍රාම වැටුප් පනතට අනුව වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වෙනුවෙන් ලබා | (අ) පොලිස් උපසේවයට බැඳුණු පෙත්සම්කාරිය නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර නොමැති බවත්, ඇයගේ සේවා කාලයට අදාළ අර්ථ සාධක අරමුදල් ඇය විසින් ලබා ගෙන ඇති බවත්, අංක 2010/13 දරන චක්‍රලේඛය යටතේ වුව ද ඇයට විශ්‍රාම වැටුපක් ලබා දීමට ප්‍රතිපාදන නොමැති බව<br><br>(ආ) පෙත්සම්කාරියගේ නොදැනුවත්භාවය සහ ආයතනයේ මඟ | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ගැනීමට හැකි විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා පොලිස්පතිතුමා වෙත 2023.06.13 දින අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එයට පිළිතුරු වශයෙන් ආයතන සංග්‍රහයේ IV පරිච්ඡේදයේ 4:3 වගන්තියට අනුව නැවත සේවයට පත් කිරීමට ප්‍රතිපාදන නොමැති බව දන්වා ඇති බවත් සඳහන් කරන පෙත්සම්කාරිය, විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | පෙන්වීමක් නොලැබීම මත ඇය ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම භාර දී ඇති බව පෙනී යන බව හා ඒ හේතුවෙන් ඇයට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට තිබූ අවකාශය අහිමි වී ගොස් ඇති බව | |
| **වෙළෙඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 46 | එම්.ඩී.චන්ද්‍රලතා දයාවතී මහත්මිය COM/PP/2025/199 ගරු ජගත් විතාන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MIC/PAF/01/13 දිනය : 2019.07.30 | සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අවුරුදු 23 ක් සේවය කර ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වන්දි යෝජනා ක්‍රමය පැහැර හැරීම නිසා අසාධාරණයක් සිදු වී ඇති බවත් අංක පීඊඩී 10 සහ 2003.05.28 දින දරණ හා අංක පීඊඩී 10(1) සහ 2003.07.21 දින දරණ චක්‍රලේඛ අනුව වයස 55 විශ්‍රාම ගැනීමේදී දැඩි අසාධාරණයක් සිදු වූ බවත් සඳහන් කර ඇති පෙත්සම්කාරිය, අදාළ හිඟ මුදල ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | අ) පෙත්සම්කාරිය වෙත වන්දි ගෙවීමේදී, ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සතොස සේවකයින් විශ්‍රාම ගැන්වීමේදී භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති, 2003.05.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අංක පීඊඩී 10 සහ 2003.05.28 දින දරන හා පීඊඩී 10(1) සහ 2003.07.21 දින දරන චක්‍රලේඛවල ප්‍රතිපාදන සහ ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් සතොස ආයතනයේ සභාපතිවරයා විසින් නිකුත් කර ඇති අංක AB/2004/02 සහ 2004.02.12 දින දරන | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | අභ්‍යන්තර චක්‍රලේඛය අනුව පෙත්සම්කාරිය හට ඉදිරියට සේවය කිරීමට තිබූ සේවා කාලය සලකා ඇති බව<br><br>ආ) 2017.11.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නැවත සමාලෝචන කමිටු නිර්දේශය ප්‍රකාරව ඉදිරියට ඇති සේවා කාලය සලකා රු. 87,780/- ක මුදලක් පෙත්සම්කාරියට වන්දි වශයෙන් දැනටමත් ගෙවා ඇති බව<br>(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඩී 10 සහ 2003.05.28 දින දරණ චක්‍රලේඛය අනුව කටයුතු කරමින් පෙත්සම්කාරියට ඇයගේ අතීත සේවා කාලය වූ අවු. 23 කට ආසන්න කාලය වෙනුවෙන් හිමි විය යුතු වන්දි මුදල ගණනය කර ගෙවා ඇති වන්දි මුදල ඉන් අඩුකර ඉතිරි මුදල ඇය වෙත ගෙවීමට 2022.03.10 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කර ඇති බව<br><br>(ඈ) එසේ වුවද, පෙත්සම්කාරියගේ ඉදිරි සේවා කාලය සලකා වන්දි මුදලක් | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | දැනටමත් ගෙවා ඇති බැවින්, 2022.03.10 දිනැති කාරක සභා නිර්දේශය පරිදි ඇයගේ අතීත සේවා කාලය වෙනුවෙන් නැවත වරක් වන්දි ගෙවීමට හැකියාවක් නොමැති බව | |
| 47 | පී.සංජීව ප්‍රසාද් ප්‍රනාන්දු මහතා COM/PP/2025/87 ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MWCA&SE/ADM/ 05/02-2023 දිනය : 2023.07.18 | 2001 මාර්තු 01 වන දින සිට සමෘද්ධි සංවර්ධන නිලධාරියකු ලෙස සේවය කරමින් සිටියදී 2011.06.01 වන දින පෞද්ගලික කරුණක් හේතුවෙන් විධිමත්ව දන්වා එදින පමණක් සේවයට වාර්තා නොකිරීම පදනම් කරගෙන සේවය හැර ගිය අයෙකු සේ සලකා කටයුතු කළ බවත්, එහෙත් පෙත්සම්කරු එකී නිවාඩු දිනයට පෙර හා පසු යන දෙදින ම සේවයට වාර්තා කර තිබූ බවත්, බලධාරීන්ට සහ කම්කරු විනිශ්චය සභාවට සිදු කළ ඉල්ලීම්වලින් ද ඵලක් නොවූ බවත්, 2017.03.03 දින කම්කරු විනිශ්චය සභා විනිසුරු විසින් 2013 අංක 1 දරන දිවි නැගුම පනත යටතේ සමෘද්ධි අධිකාරියට එරෙහිව පැවති සියලු නඩු නිෂ්ප්‍රභ කළ බවත්, නැවත රාජ්‍ය සේවයේ පරිපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූවන්ට සහන සැලසීමේ කමිටුව වෙත කළ අභියාචනය සමෘද්ධි දෙපාර්තමේන්තුවටම යොමු කිරීමෙන් අනතුරුව සමෘද්ධි අධිකාරියක්ව පැවති සමයේ සිදුවූ සිදුවීමක් දෙපාර්තමේන්තුවක් වූ පසු සලකා බැලිය නොහැකි බව පැවසූ බවත් සඳහන් කරන පෙත්සම්කරු, මූලික | (අ) 2025.03.19 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා නිර්දේශය අනුව ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවූ අතර ඒ අනුව ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව පෙත්සම්කරු විසින් සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම, නොදන්වා සේවයට නොපැමිණීම සහ රාජකාරී ඉටුකිරීමේදී වගකීම් පැහැර හැරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සහ ලේඛන කාරක සභාවේ පරීක්ෂාවට ලක්වූ බව<br><br>(ආ) ඒ අනුව, පෙත්සම්කරුගේ පූර්ව සේවා කාලය තුළ අසතුටුදායක සේවා තත්ත්වය, | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව සලකා සේවය අතහැර ගියා සේ සලකන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සියලුම වරප්‍රසාද වැටුප් සහ දීමනා සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම, අනුමැතියෙන් තොරව සේවයෙන් පිටවීම සහ නොදන්වා සේවයට වාර්තා නොකිරීම පිළිබඳ අවවාදාත්මක ලිපි නිකුත් කිරීම නිරීක්ෂණය කරන ලද බව | |
| **බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 48 | බී.එස්. විජේකෝන් කුලතුංග මහතා COM/PP/2025/121 ගරු කංචන වැලිපිටිය මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : NH/AD/ARC/76 දිනය : 2023.08.08 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පෙදරේරුවෙකු වශයෙන් සේවය කරමින් සිටියදී සාමාන්‍ය පෙළ සහතිකය පිළිබඳව මතු වූ ගැටලුවක් හේතුවෙන් 2021.08.03 වන දින පෙත්සම්කරු ඇතුළු පිරිසකගේ සේවය අත්හිටවූ බවත්, නැවත සාමාන්‍ය පෙළ සුදුසුකම නොසලකා හැර ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ සහතිකය පදනම් කරගෙන ඉහත පිරිසගෙන් කොටසක් පමණක් නැවත සේවයේ පිහිටු වූ බවත්, එම සුදුසුකම සපුරා තිබුණ ද වයස අවුරුදු 45 සපුරා තිබීම හේතු කොට ගෙන අභියාචනය නිෂ්ප්‍රභ කරන ලද බවත්, වසර 09 මාස 06ක සේවා කාලයක් සපුරා ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු, නැවත සේවයේ පිහිටුවන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු විසින් ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර ඇති පාසලෙන් ලබාගත් අ.පො.ස. (සා/පෙළ) විභාග සහතිකය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රතිඵල සහතිකය සමඟ නොගැලපුන බැවින් ඔහුගේ පත්වීම ස්ථිර කිරීමට නොහැකි වී ඇති බව<br>(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අ.පො.ස. (සා/පෙළ) විභාග සහතිකයක් ඉදිරිපත් කරන ලෙස පෙත්සම්කරු දැනුවත් කළ ද මෙතෙක් ඔහු ඒ අනුව ද කටයුතු කර නොමැති බව<br>(ඇ) පෙත්සම්කරු ඉගෙනුම ලැබූ කෑ/ගලිගමුව මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් පෙත්සම්කරුගේ | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | නිවැරදි අ.පො.ස. (සා/පෙළ) විභාග සහතිකය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත එවා ඇති අතර ඒ අනුව පෙත්සම්කරු මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති බවත්, අවස්ථා දෙකක දී ව්‍යාජ සහතික ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වන බව<br>(ඈ) පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්වීම් ලිපියෙහි 20 වන ඡේදය අනුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි VI වැනි පරිච්ඡේදයේ 59 වගන්තිය අනුව පෙත්සම්කරුගේ පත්වීම අවසන් කර ඇති බව<br>(ඉ) පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති NVQ - Level 03 සහතිකය ලබා ගන්නා විට පෙත්සම්කරුගේ වයස අවුරුදු 52 මාස 03 ක් වන අතර ඒ වනවිට ඔහු රජයේ සේවයට බඳවාගැනීමේ වයස් සීමාව ඉක්මවා ඇති බැවින් නව පත්වීමක් ලබා දීම ද සිදු කර නොමැති බව | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | (ඊ) එම විභාග සහතික බාහිර පුද්ගලයෙකු විසින් ලබා දෙන ලද බවත්, ව්‍යාජ ඒවා වන බව නොදැන සිටි බවත්, නැවත සහතික ඉදිරිපත් කරන ලෙස අවස්ථා කීපයකදීම දැනුම් දුන්න ද තමා හට ඉදිරිපත් කිරීමට තිබුනේ එම සහතික පමණක් වන බැවින් නැවත ලබා දීමට නොහැකි වූ බවත් පෙත්සම්කරු විසින් සඳහන් කරන ලද බව<br>(උ)පෙත්සම්කරුගේ අධ්‍යාපන සහතිකය දෝෂ සහගත වීම මත සේවය අවසන් කර ඇති බවත්, තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති බවත්, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන විට රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ උපරිම වයස් සීමාව පසු කර ඇති බව | |
| 49 | ඩී.එම්. විජේසිංහ මහතා<br>COM/PP/2025/296<br>ගරු චන්දන තෙන්නකෝන් මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.19 දින විභාග කරන ලදී.<br>අමාත්‍යාංශ යොමුව : NH/AD/ARC/76<br>දිනය : 2024.06.14 | 2008 වසරේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනියම් සේවකයෙක් ලෙස ලැබූ පත්වීම අවුරුදු 46 දී ස්ථිර වූ බවත්, 2023 වසර දක්වා සේවය කර විශ්‍රාම ගිය ද විශ්‍රාම වැටුප නොලැබුණු බවත් සඳහන් කරන පෙත්සම්කරු විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) 2009.06.24 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කම්කරු III ශ්‍රේණියේ ස්ථිර තනතුරකට පත් වී ඇති අතර ස්ථිර පත්වීම ලබන අවස්ථාවේ පෙත්සම්කරුගේ වයස අවුරුදු 46 මාස 05 දින 08 ක් වන බව | ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | (ආ) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීමට අදාළ අයදුම්පත 2021.12.07 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කර ඇතත් ස්ථිර පත්වීම් ලබන අවස්ථාවේ පෙත්සම්කරුගේ වයස අවුරුදු 45 ඉක්මවා ඇති බව<br><br>(ඇ) පෙත්සම්කරුට අමතරව දෙපාර්තමේන්තුවේ මෙලෙස වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා ඇති සේවකයන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින බැවින් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් එවකට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බව<br>(ඈ) ඒ අනුව 2024 මාර්තු 11 දින පැවති අමාත්‍ය මණ්ඩලයේ දී | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ගනු ලැබූ තීරණයන් පරිදි මෙම පෙත්සම්කරු හට විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කළ නොහැකි බව දන්වා ඇති බැවින් මොහු වෙත විශ්‍රාම වැටුප් ලබා දී නොමැති බව (ඉ) මෙම පත්වීම අනියම් පත්වීමක් වන බැවින් අනියම් පත්වීම ලබන විට වයස 45 ඉක්මවා ගොස් ඇති බැවින් පත්වීම රජයේ රෙගුලාසි අනුව විධිමත් නොවන බවත්, ඒ අනුව විශ්‍රාම වැටුපකට හෝ විශ්‍රාම පාරිතෝෂිකයකට හිමිකම් නොමැති බව | |
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 50 | ජේ.කේ.එම්. දර්ශිණී මහත්මිය COM/PP/2025/279 ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.25 දින විභාග කරන ලදී. අමාත්‍යාංශ යොමුව : ED/05/152/05/2022/01-20 දිනය : 2022.10.12 | 1989 වසරේ සිට මේ දක්වා වසර 36ක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සේවය කරන බවත්, දැනට එහි සැපයුම් අංශයට අනුයුක්තව සේවයේ නියුතු බවත්, එහි සියලු ගිණුම් කටයුතු පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති බවත්, පශ්චාත් උපාධි මට්ටම දක්වාම අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති නමුත් ඊට සරිලන තනතුරක් ලබා නොදුන් බවත්, කණිෂ්ඨ කළමනාකාර තනතුරක් ලබා දෙනු ලැබුයේ ද වසර 35කට පමණ පසු වන බවත්, එමගින් විධායක ශ්‍රේණියේ තනතුරක් ලැබීමේ අවස්ථාව අහිමි වූ බවත්, මේ වනවිට සේවයෙන් විශ්‍රාම යාමට | (අ)පෙත්සම්කාරිය වසර 37කට ආසන්න දීර්ඝ සේවා කාලයක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සපුරා ඇති බව (ආ) පෙත්සම්කාරිය විසින් වරින් වර ඉදිරිපත් වී ඇති සම්මුඛ පරීක්ෂණවලදී ඇයගේ පළපුරුද්ද, අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් සඳහා නිසි පරිදි ලකුණු ලැබී තිබුනද, ඇය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන දක්ෂතා සඳහා ඇයට ලැබී ඇත්තේ අඩු ලකුණු ප්‍රමාණයක් බැවින් උසස්වීම්වලට | ඉල්ලා සිටින සහන හිමිකම නිර්දේශ නොකරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ආසන්න බවත්, ආයතනයේ පරිපාලනය විසින් සිදු කළ මෙම අසාධාරණය වෙනුවෙන් රුපියල් මිලියන පහක වන්දියක් ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | අදාළ කඩඉම් ලකුණු ඉක්මවීමට නොහැකි වී ඇති අතර අදාළ උසස් වීම් ඇයට නොලැබී ඇති බව<br><br>(ඇ)මේ සම්බන්ධව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල 2015 දී දෙපාර්ශ්වය සමථයකට පත්වීම නිසා එම විමර්ශනය අවසන් කොට ඇති බව<br><br>(ඈ) දීර්ඝ කාලයක් සේවය සපයන ආයතනයේ පරිපාලනය මගින් අසාධාරණයක් සිදු වූවා යැයි පෙත්සම්කාරිය විශ්වාස කළේ නම් ඒ සඳහා ඇයට අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමු විය හැකිව තිබුන ද ඇය එලෙස කටයුතු කර නොමැති බව | |
| 51 | එන්.එස්.රත්නවීර මහත්මිය<br>COM/PP/2025/126<br>ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.06.17 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : ED/4/58/1/8/173/ 66<br>දිනය : 2024.12.05 | 1979 සිට වසර 23 ගුරු සේවයේ යෙදී, 2002 වසරේ සිට වසර 5ක් විදුහල්පති සේවයේත්, 2007 සිට වසර 10ක් අධ්‍යාපන පරිපාලන සේවයෙත් යෙදී සිට, පිළි /ගල්කිස්ස බෞද්ධ බාලිකා විද්‍යාලයේ විදුහල්පති තනතුරෙන් 2017.06.15 දින විශ්‍රාම ලද බවත්, අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ | (අ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව 2 වන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම සඳහා දැක්වෙන සුදුසුකම් වන පශ්චාත් උපාධි සුදුසුකමට ඇතුළත් වන අධ්‍යාපන ඩිප්ලෝමාවට ගුරු පුහුණුව සමාන කළ | පෙත්සම්කරුගේ පළමු ඉල්ලීම වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ 2 වන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම නිර්දේශ නොකරන ලදී.<br><br>(ආ)පෙත්සම්කරුගේ දෙවන ඉල්ලීම වන 2002.01.01 දින සිට විදුහල්පති සේවයේ III |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | 2 වන කඩඉම නිදහස් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකමක් වන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවට සමාන වූ පුහුණු උපාධි සුදුසුකමක් හිමි අතර ඉන් නිදහස් නොකළ බවත්, විදුහල්පති සේවයේ සිට ගුරු සේවයට නිදහස් කිරීමට සිදු කරන ලද ඉල්ලීම ද ප්‍රතික්ෂේප කරන ලද බවත්, අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ 2 වන කඩඉමෙන් නිදහස් කර 2017.03.12 දිනට ලැබිය යුතු උසස්වීම ලබා දෙන ලෙසත්, 2002.01.01 දින සිට විදුහල්පති සේවයේ III වන පන්තියට කර ඇති පත්වීමෙන් ගුරු සේවයට නිදහස් කරන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | නොහැකි බව<br>(ආ) ගුරු පුහුණුව සමඟ උපාධි සුදුසුකම පැවතීම සලකා 2 වන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා දෙවන වරටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉල්ලීමක් යොමු කරන ලද බව<br>(ඇ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පවතින ප්‍රතිපාදනවලට පටහැනිව වෙනත් අර්ථකථනයක් ලබා දී පෙත්සම්කරු 2 වන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නිර්දේශ නිකුත් කළ නොහැකි බව | වන පන්තියට කර ඇති පත්වීමෙන් ගුරු සේවයට නිදහස් කරන ලෙස සිදු කර ඇති ඉල්ලීම විභාග කිරීම සඳහා වෙනත් දිනයක කැඳවීමට තීරණය කරන ලදී. |
| **නිර්දේශ ලබා දීම කල් තබන ලද පෙත්සම්** | | | | |
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 52 | ඩබ්.ඩී. සෙනෙවිරත්න මහතා<br>COM/PP/2025/197<br>ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.03 දින | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ අධ්‍යයන අංශයේ වසර 8ක්ද, කැලණිය විශ්වවිද්‍යාලයේ වසර 04ක්ද ලෙස වසර 12ක පමණ කාලයක් ජනසන්නිවේදනය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළ පෙත්සම්කරුගේ සේවය | (අ) පරිවාස කථිකාචාර්යවරයකු එම තනතුරෙහි ස්ථිර කිරීම සඳහා උපරිමව වසර 8ක් තුළ පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ යුතු බව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි සඳහන් බව, එය එක් දිනකින් හෝ | විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙතින් ඉහත කරුණු සම්බන්ධ වාර්තාවක් කැඳවිය යුතු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.<br>එකී වාර්තාව විභාගයෙන් පසු නිර්දේශ ලබා දෙනු |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : HE/AD/03/ම.පෙ.කා.ස.(2019/01) දිනය : 2019.02.28 | අත්හිටුවීම සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) ලබා දුන් නිර්දේශ විවෘත විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක නොකළ බවත්, ඒ අනුව ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඊළඟට බලය හිමි අධිකාරිය වන රාජ්‍ය නායකයා හෙවත් ජනාධිපතිවරයා වෙත සුදුසු ක්‍රියාමාර්ග පිණිස යොමු කලද ඊට ප්‍රතිචාරයක් නොලද බවත්, කිසිදු චෝදනාවකට ලක් නොවී සද්භාවයෙන් යුතුව සේවය කළ තමා හට උසස්වීමට අදාළ සරල තාක්ෂණික කරුණක් පදනම් කරගෙන සිදු කළ අසාධාරණය පිළිබඳව පරීක්ෂා කර, 2010.07.01 දින සිට සේවය ස්ථිර කර හිඟ වැටුප් හා උසස්වීම් සහිතව සේවයේ පිහිටුවන ලෙසත්, විශ්‍රාම වැටුපක් හෝ ලබා දෙන ලෙසත් නැතහොත් වෙනත් විශ්වවිද්‍යාලයකට නව පත්වීමක් ලෙස ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරක් ලබා දෙන ලෙස හෝ එසේත් නොහැකි නම් තම පළපුරුද්ද සලකා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියාවක් ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | ප්‍රමාද වුවහොත් සේවය ස්ථිර කිරීම සිදු කළ නොහැකි බව<br><br>(ආ) සේවය අවසන් කිරීමෙන් මාස 3ක් ඇතුළත විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයටද, මාස 6ක් තුළ කම්කරු විනිශ්චය සභාවටද අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතුනද පෙත්සම්කරු අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ සේවය අවසන් කිරීමෙන් වසර 2කට පසුව 2012.08.12 දිනැතිව ඔම්බුඩ්ස්මන්වරයා වෙත බව<br><br>(ඇ)ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලබාදුන් නිර්දේශය අනුව පෙත්සම්කරුගේ සේවය අවසන් කිරීම නීත්‍යානුකූල බව පිළිගෙන තිබූ අතර තාවකාලික පත්වීමක් ලබා දීමට නිර්දේශ කර තිබූ බවත්, එහෙත් ඒ වනවිට එම තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කර ඇති බැවින් සහ නියමිත සේවක සංඛ්‍යාව (cadre) සපුරා තිබූ බැවින් විවෘත විශ්වවිද්‍යාල පාලක සභාව විසින් ඉහත නිර්දේශය ක්‍රියාත්මක කළ නොහැකි බව 2013.02.05 දිනැති ලිපිය මගින් ඔම්බුඩ්ස්මන්වරයා වෙත දැනුම් දී ඇති බව<br><br>(ඈ) පත්වීම් දින සිට | ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | වසර 8ක් ඇතුළත පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා ගැනීම අවශ්‍ය බව පිළිගන්නා නමුත් වෙනත් අධ්‍යයන සේවකයනට ලබා දුන් සහන තමාට ලබා නොදුන් බවට වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය<br>(ඉ) ආධුනික කථිකාචාර්යවරයකු පත්වීම් දින සිට වසර 8ක් තුළ තම පශ්චාත් උපාධිය සම්පූර්ණ කර නොමැති අවස්ථාවකදී සේවයේ ස්ථිර කිරීම කිසිසේත්ම සිදු නොකරන බවත්, එසේ සේවයේ ස්ථිර කිරීමක් සිදු කර ඇති බව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බව<br><br>(ඊ) පෙත්සම්කරුගේ සේවය අවසන් කිරීමෙන් ඇතිවූ තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා වූ පුවත්පත් දැන්වීම අනුව 2011 වර්ෂයේදී විවෘත විශ්වවිද්‍යාලය වෙත අයදුම්පත් යොමු කළද ඒ වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් නොලද බවට වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය සහ එ් අනුව කථිකාචාර්ය තනතුරෙහි පුරප්පාඩුවක් සඳහා අයදුම්පත් කැඳවා තිබේද සහ පෙත්සම්කරු ඒ සඳහා අයදුම්පත් යොමු කර තිබේද යන්න පිළිබඳවත්, චක්‍රලේඛ නොසලකා විශ්වවිද්‍යාල | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | පරිපාලනය විසින් ආචාර්ය මණ්ඩලයට දෙයාකාරයකට සලකන බවත් නිරීක්ෂණය වන බවට පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු කෙරෙහිත් අවධානය යොමු කළ යුතු බව | |
| 53 | පී.ඒ. කරුණාසේන මහතා COM/PP/2025/44 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.17 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/4/58/1/8/173/67 දිනය : 2024.12.13 | අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් 1998.01.01 දිනැතිව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට පත්ව සියලු සුදුසුකම්ද සපුරා එහි රාජකාරි කටයුතු සිදු කළ ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුගේ පත්වීම 1998.01.01 දිනැති ව්‍යවස්ථාපිත සුදුසුකම් සපුරා නැති බව සඳහන් කර ප්‍රතික්ෂේප කර ඔවුන් විසින්ම 1993.01.01 දිනට පෙර දාතම් කර ලබා දීමෙන් බලවත් අසාධාරණයක් වූ බවත් සඳහන් කරන පෙත්සම්කරු, අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම 1998.01.01 දාතමින්ම සකස්කර දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) 2001.10.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සහනය ලබා දුන් නිලධාරී නාම ලේඛනයේ තම සුදුසුකම වන පුහුණු ගුරු සහතිකය හා සමාන සුදුසුකම ඇති වෙනත් නිලධාරීන් සිව් දෙනෙකුට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ පත්වීම ලබා දුන් බවත්, 2006.03.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, 1993.01.01 දින සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට අධිසේවක පදනම මත ලබා දුන් පත්වීමේ කොන්දේසි අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වන පන්තියට උසස්වීම අහිමි වූ බවටත් වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය | පෙත්සම්කරු විසින් නම් කරන ලද නිලධාරීන් සිව් දෙනාගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ විස්තර අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් පෙත්සම්කරු හට දැනුම් දෙන ලදී.<br><br>තවද, පෙත්සම්කරු වෙත 2001.10.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලබා දී ඇති සහනය අනුව, 1998.01.01 සිට හිමිවිය යුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තිය පත්වීම පෙත්සම්කරුහට අහිමිවීමට හේතුවූ කරුණු සහ එම සහනයම ලබා දුන් පෙත්සම්කරු විසින් නම් කරන ලද |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | | නිලධාරීන්ගේ සුදුසුකම් පරීක්ෂා කර ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හට නියම කරන ලදී. ඒ අනුව, එම වාර්තාව ලද පසු ඉදිරි දිනකදී නැවත විභාගයෙන් අනතුරුව නිර්දේශ ලබා දෙනු ඇත. |
| 54 | කේ.වී.අනුරකීර්ති මහතා<br>COM/PP/2025/81<br>ගරු ලසිත් භාෂණ ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.06.17 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : MSVRI/ADM/03/05-iv<br>දිනය : 2024.06.19 | 2016.12.05 දින විශ්‍රාම යන තුරු අඛණ්ඩව වසර 2 ½ක කාලයක් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක වැඩ බලන නිලධාරියා ලෙස යෙදවූ බවත්, තනතුරට අදාළ සියලු සුදුසුකම් සපුරා සිටි හෙයින් එම තනතුරට ස්ථිරව බඳවාගන්නා ලෙස අභියාචනා ඉදිරිපත් කළද, සේවා ව්‍යවස්ථා සංශෝධන නිසි පරිදි නොකිරීම ඇතුළු ආයතනික අකාර්යක්ෂමතා හේතුවෙන් අසාධාරණ ලෙස එම අවස්ථාව අහිමි වූ බවත් සඳහන් කරන පෙත්සම්කරු මේ සඳහා අදාළ සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කර තිබූ 2015.05.05 දින සිට එම සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමටත්, එදින සිට වැඩ බැලූ විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීමටත් කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා පෙත්සම්කරු විසින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ)පෙත්සම්කරු විසින් පරිපාලන විනිශ්චය අධිකාරය වෙත නඩුවක් ගොනුකර ඇති බව සහ 2025.09.17 දින මෙම නඩුව විභාගයට ගැනීමට නියමිත බව | පරිපාලන විනිශ්චය අධිකාරය විසින් පෙත්සම්කරුගේ පැමිණිල්ල විභාගයට ගෙන තීන්දුව ලබාදෙන තෙක් මෙම පෙත්සම විභාග කිරීම අත්හිටුවීමට තීරණය කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 55 | ඩබ්. ජයන්ත වීරසිරි මහතා<br>COM/PP/2025/91<br>ගරු කෝසල නුවන් ජයවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.06.17 දින විභාග කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : HE/AD/SA/ම.පෙ. කා.ස.<br>දිනය : 2016.03.31 | 2010.02.18 දින සිට III ශ්‍රේණියේ කම්කරු තනතුරක් ලැබ කැළණිය විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිටි බවත්, පරිවාස කාලයේ දී වැටුප් රහිත නිවාඩු ලබා ගත් බවට අසත්‍ය ලේඛන සකස් කර සේවයෙන් ඉවත් කළ බවත්, ඉන් අගතියක් සිදු වූ බවත්, සේවය ස්ථිර කර දී හිඟ වැටුප් හා උසස්වීම් ඇතුළු සියලු වරප්‍රසාද මෙන්ම වන්දි මුදලක් ද ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු විසින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) 2024.05.14 දින කාරක සභාවේ දී සානුකම්පිතව සලකා බලා විශ්වවිද්‍යාල පාලක සභාව වෙත මෙම ගැටලුව නැවත යොමු කර ඔහු වෙත යම් සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස නිර්දේශ කර ඇතත්, පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවිය නොහැකි බවට කාරක සභාව වෙත දැනුම් දී ඇති බව<br><br>(ආ) පරිවාස කාලයේ දී පෙත්සම්කරුගේ පැමිණීම සතුටුදායක නොවීම, වැටුප් රහිත නිවාඩු ලබා තිබීම නිසා පරිවාස කාලය වසරකින් දීර්ඝ කර ඇති අතර අවවාද කර තිබියදීත් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම යන කරුණු පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව පෙත්සම්කරුගේ සේවය අවසන් කර ඇති බව<br><br>(ඇ) සේවයට පැමිණි දිනද නොපැමිණි | පෙත්සම්කරු විසින් වසර 04ක සිය පරිවාස කාල සීමාවේ දී එක් එක් වසරට අදාලව ලබා ගත් නිවාඩු, වැටුප් රහිත නිවාඩු පිළිබඳ පූර්ණ වාර්තාවක් හා පෙත්සම්කරු සම්බන්ධව ඔහුගේ අධීක්ෂණ නිලධාරියා විසින් අදාළ බලධාරීන් වෙත ලබා දී ඇති වාර්තාවල පිටපත් ද කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අතර අදාළ ලේඛන නිරීක්ෂණයෙන් පසුව මෙම පෙත්සම සම්බන්ධව නිර්දේශයක් ලබා දෙනු ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | දිනයක් ලෙස සඳහන් කරමින් ඉතිරි කරගත් නිවාඩු තිබියදී වැරදි ලේඛන ඉදිරිපත් කර පරිවාස කාලය වසරකින් දිර්ඝ කළ බවටත්, එමඟින් අසාධාරණයක් සිදු වූ බවටත් වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය | |
| 56 | ඩී.එම්. ජයසිංහ මහතා COM/PP/2025/220 ගරු සුජීව දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.25 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/4/58/1/8/173/ 61 දිනය : 2023.06.16<br><br>*(අංක COM/PP/2023/1108 යටතේ එච්.පී.එස්. ගුණවර්ධන මහත්මිය විසින් නව වැනි පාර්ලිමේන්තුවේ කාරක සභාව වෙත පළමු වරට මෙම පෙත්සම ඉදිරිපත් කර තිබූ අතර ඇය මේ වන විට අසනීප තත්ත්වයේ පසුවන බැවින් මෙම පෙත්සමෙහි කටයුතු ඉදිරියට ගෙනයාම පිණිස වත්මන් පෙත්සම්කරු ලෙස ඩී.එම්. ජයසිංහ මහතා ඉදිරිපත්ව ඇත). | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ (සීමිත 2010) තරඟ විභාගයට පෙනී සිට සමත් වූ නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උක්ත තනතුරට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් පෙත්සම්කරු හැර වෙනත් කොටසකට පමණක් අදාළ තනතුර ලැබුණු බවත්, මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කළ බවත්, එහි තීන්දුව අනුව නැවත සම්මුඛ පරීක්ෂණයක් කැඳවූ බවත්, එසේ තිබියදී තාක්ෂණික දෝෂයක් හේතුවෙන් පෙත්සම්කරු ඇතුළු පිරිසකගේ නම්, නඩු පැවරූ පාර්ශ්වයන් අඩංගු ලැයිස්තුවේ සඳහන්ව නොතිබූ බැවින් වෙනත් 24 දෙනෙකු පමණක් සේවයට බඳවාගන්නා ලද බවත්, පෙත්සම්කාරිය ගත් ලකුණු වන 183 සමාන සහ ඊට වඩා අඩු ලකුණු ලබා ගත් පිරිස ද අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අදාළ තනතුරුවලට බඳවාගෙන ඇති බවත්, 2015/08/21 දින සංශෝධනය කළ පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව තමා ඇතුළු 20 දෙනෙකු | (අ) සාමාන්‍ය හා විශේෂ ශ්‍රේණිය (ශාරීරික අධ්‍යාපන) යන ක්ෂේත්‍රයන් සඳහා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අවම ලකුණු සංඛ්‍යාව ලෙස සඳහන් කර ඇත්තේ 207 හා 186 වන අතර පළමු පෙත්සම්කාරිය වන එච්.පී.එස්. ගුණවර්ධන මහත්මිය* ලබා ඇත්තේ මුළු ලකුණු 183ක් බැවින් එබැවින් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා ඇය සුසුසුකම් ලබා නොතිබූ බව<br><br>(ආ) පෙත්සම්කරු සඳහන් කරන අන්දමට තාක්ෂණික දෝෂයක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් නොවන බව<br><br>(ඇ) පෙත්සම්කරු විසින් සඳහන් කරන ලද 2015.08.21 දිනැතිව නිකුත් කරන ලද අංක 1928/28 දරණ සේවා ව්‍යවස්ථාව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය | අංක 1928/28 දරණ නව සේවා ව්‍යවස්ථාව පිළිබඳ අර්ථ නිරූපනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතින් ලබා ගැනීමෙන් අනතුරුව, අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් යුතුව ඉදිරි දිනයක දී මෙම පෙත්සම, කාරක සභාවේ දී නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය නිකුත් කරනු ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | පමණ පිරිස අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව අදාළ සංශෝධන සිදු කර නිකුත් කරන ලද්දක් දැයි පිළිබඳව අර්ථ නිරූපනයක් ලබා ගැනීම සඳහා එම ගැසට් නිවේදනය නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මෙම කරුණ ඉදිරිපත් කිරීම වඩාත් සුදුසු බව | |
| **නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය** | | | | |
| 57 | යූ.ආර්. ගාම්භීරආරච්චි මහතා COM/PP/2025/47 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MU/DH/GA/PP/P3/ PPC-Vol III දිනය: 2025.03.27 | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගිණුම් කටයුතු සම්බන්ධ අනියම් නුපුහුණු සේවකයෙකු ලෙස සේවයේ යෙදී සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 අනුව 2019.09.01 දින සිට සේවය ස්ථිර කළ බවත්, සංස්ථාවේ කළමණාකාරීත්වය විසින් 2020 වසරේදී සේවය අන් අයගේ උවමනාවන් සහ පළිගැනීම් මත අහිමි කළ බවත්, මේ සම්බන්ධව අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩුවකින් පසුව නැවත සේවයේ පිහිටුවූ බවත් සඳහන් කර ඇති පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවීම සඳහා නිවැරදි දින සහිත විධිමත් ලිපියක් ලබා දී එම දින ගණන සඳහා හිඟ වැටුප් ද, 2019.09.01 දින සිට සේවය ස්ථිර කළ බවට ලිපියක් සහ එදින සිට මේ දක්වා හිඟ වැටුප් වර්ධක ද, සේවය අතහැර යාමට සිදු කරනු ලබන පෙළඹවීම් නවත්වන | (අ) 2016.03.07 දින සේවයට බැඳී ඇති පෙත්සම්කරු 2019.09.01 දින සේවයේ ස්ථිර කරනු ලැබ ඇත්තේ වසරක පරිවාස කාලයකට යටත්වන පරිදි බවත්, ඔහු බැහැර සේවා පත්‍රයක් මගින් 2020.07.16 දින සිට දංකොටුව වැඩබිමට ස්ථාන මාරු කර ඇති බවත්, ස්ථාන මාරුවෙන් පසු ඔහු සේවයට වාර්තා කර නොමැති හෙයින් ඔහු සේවයේ ස්ථිර කර නොතිබූ බවත්, නැවත සේවයේ පිහිටවූ පසු 2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ මේ වන තෙක් අදාළ කාල සීමාව තුළ දී ද ඔහු විසින් වැටුප් රහිත නිවාඩු ලබා ඇති බව<br><br>(ආ) පෙත්සම්කරු | පෙත්සම්කරු විසින් ඉල්ලා සිටින සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් සහ මෙම සිද්ධියට අදාළ සියලු කාරණා ද ඇතුළත් කර සවිස්තරාත්මක වාර්තාවක් ලද පසු ඉදිරි දිනකදී නැවත විභාගයෙන් පසු නිර්දේශ ලබා දෙනු ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ලෙස ද, 2024.07.11 දිනැතිව ලබා දුන් අසාධාරණ රාජකාරි ලැයිස්තුව වෙනුවට පෙර කළ කාර්යයන් අනුමත කරන ලෙස ද, 2020 ජූලි මස සිට 2023 අගෝස්තු මස දක්වා ගෙවිය යුතු හිඟ වැටුප් ගෙවන ලෙසට ද ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | බඳවාගෙන ඇත්තේ පුහුණු කම්කරු තනතුරකට බවත්, එම තනතුරට කාර්යාලීය කටයුතු අදාළ වන්නේද නැත්ද යන්න පිළිබඳ පැහැදිලිතාවයක් නොමැති බවත්, ආයතනය විසින් අධිකරණ සමථයට එකඟව කටයුතු කළ යුතු බවත්, එහෙයින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අධ්‍යනය කර කරුණු දැක්වීමක් සිදු කිරීමට කාලය ලබාදෙන ලෙසත් අමාත්‍යාංශ අතිරේක ලේකම් විසින් කරනු ලැබූ ඉල්ලීම<br><br>(ඇ) ආයතනය විසින් අනුගමනය කරනු ලැබ ඇති ක්‍රියා පිළිවෙළ මගින් පෙත්සම්කරු අසාධාරණයට ලක්ව ඇති බවත්, ආයතනය කටයුතු කළ යුත්තේ අධිකරණයේදී එළැඹි සමථය ප්‍රකාරව වන බව | |
| **කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** | | | | |
| 58 | ජී.පී.ටී.පී. වීරසේකර මහත්මිය COM/PP/2025/110 ගරු රුවන් මාපලගම මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.06.19 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පීන් ලෙස කටයුතු කළ පෙත්සම්කාරිය ඇතුළු කණ්ඩායමට 1994.07.01 සිට 1996.12.31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියට උසස් වීම් ලැබීමේදී සිදු වූ වැටුප් | (අ) මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවාව වෙනුවට ශ්‍රී ලංකා තාක්ෂණ සේවය ඇති කිරීමේදී එදිනට සේවයේ යෙදී සිටි නිලධාරීන්ගේ I වන පන්තියට සහ විශේෂ පන්තියට | මේ සම්බන්ධව පූර්ණ අධ්‍යයනයක් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන), අධ්‍යක්ෂ (පාලන), සහ මීට අදාළ අනෙකුත් |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | MOI/AD/05/04/ම. පෙ.(01-2023) දිනය : 2024.04.02 | විෂමතාවය විසඳීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත අභියාචනයක් සිදු කළ බවත්, එලෙස විෂමතාවයට ලක් වූ නිලධාරියෙකු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත සිය ගැටලුව යොමුකිරීමෙන් අනතුරුව කාරක සභාවේ නිර්දේශ අනුව නිවැරදි කිරීම් සිදු කළ බවත්, කෙසේ නමුත් පාලන අංශ 02 විසින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය සිදු කරන ලද නමුත් වැටුප් ගෙවීමට ආසන්න අවස්ථාවේ දී වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් එය තාවකාලිකව අත්හිටුවන ලද බැවින් එම වැටුප් විෂමතාවය තවදුරටත් එලෙසම පවතින බවත් සඳහන් කරන පෙත්සම්කාරිය ඇතුළු පිරිස මේ අනුව එකම විෂමතාවට ලක් වූ පිරිසකගෙන් කොටසකට පමණක් එකී වැටුප් විෂමතාවය ඉවත්කිරීම තුළින් තමන් ඇතුළු කණ්ඩායම අසාධාරණයකට ලක්ව සිටින බැවින් අදාළ වැටුප් පරිවර්තනය බලාත්මක කර වැටුප් විෂමතාවය ඉවත් කරන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම 30/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කර ඇති බව<br><br>(ආ) පෙත්සමට අදාළ ගැටලුව දැඩිවම තාක්ෂණික කරුණු හා බැඳී ඇති බවත්, පෙත්සම්කාරිය ඇතුළු පිරිසට අසාධරණයක් වී ඇති බව නිරීක්ෂණය වන බව<br><br>(ඇ) පෙත්සමට අදාළ කරුණ සම්බන්ධව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කිරීමක් කර නිගමනයකට එළඹිය යුතු වන බව | නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර, ඒ තුළින් සාධාරණ තීරණයකට එළඹ, එම තීරණය සහිත වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙස ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දුන් අතර, අදාළ වාර්තාව ලද පසු ඉදිරි දිනක නැවත විභාගයෙන් අනතුරුව නිර්දේශ නිකුත් කරනු ඇත. |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 59 | ඩබ්ලිව්.ආර්.පී. දිසානායක මහතා COM/PP/2025/229 ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. | 1999 මාර්තු 30 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ (ස්වේච්ඡා අංශයේ) වැඩ බලන උප ලුතිනන් තනතුරට පත් වූ බවත්, 2002 වසරේ දී ලුතිනන් තනතුරට උසස් වූ බවත්, 2006 ජූලි 14 වන දින නිවාඩු ලබා නිවසට යන | (අ) පෙත්සම්කරු සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධ නඩුවකින් සියලු චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කර ඇති බව | මේ සම්බන්ධව නීතිපතිගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ගත හැකි ක්‍රියාමාර්ගය පිළිබඳව නීතිපති විසින් කාරක සභාවට වාර්තා කිරීමෙන් |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | 2025.07.09 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/PAC/05/PPC/ 2023/06 දිනය : 2023.09.18 | අතරතුර සිදුවූ සිදුවීමක් හේතුවෙන් 2006 නොවැම්බර් 08 වන දින එවකට නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි දින නියමයකින් තොරව වැටුප් රහිත අනිවාර්ය නිවාඩු යැවූ බවත්, 2010 දී මාතර මහාධිකරණයේ නඩු පැවරූ බවත්, එහෙත් 2017 මැයි 03 වන දින පැමිණිල්ල ප්‍රතික්ෂේප කර තමන් නිදොස් කොට නිදහස් කළ බවත්, නැවත තමන් සිදු කළ අභියාචනයකට අනුව 2018 අගෝස්තු 07 වන දින සිට හමුදා සක්‍රිය සේවයේ පිහිට වූ නමුත් 2020 මැයි 03 වන දින සිට විශ්‍රාම වැටුප් නොමැතිව වැටුප් රහිත නිවාඩු යැවූ බවත් සඳහන් කරන පෙත්සම්කරු ඉහත අපරාධ නඩුව හේතුවෙන් තමාට අහිමි වූ ලුතිනන් කමාන්ඩර් (ස්වේච්ඡා) තනතුර 2010 මාර්තු 30 දින සිට බලපැවැත්වෙන පරිදිත්, කමාන්ඩර් (ස්වේච්ඡා) තනතුර 2015 මාර්තු 30 දින සිට බලපැවැත්වෙන පරිදි සහ කපිතාන් (ස්වේච්ඡා) තනතුර 2019 මාර්තු 30 දින සිට බලපැවැත්වෙන පරිදි ලබා දෙන ලෙසත්, නාවික හමුදා විශ්‍රාම වැටුප සහ 2006 නොවැම්බර් සිට 2018 ජූලි තෙක් හිඟ වැටුප් ලබා දෙන ලෙසත්, විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දෙන ලෙසත්, නාවික හමුදා නිලධාරියකු විශ්‍රාම යාමේ දී නාවික හමුදාවෙන් ලබාදෙන අනෙකුත් සියලුම වරප්‍රසාද ලබා දෙන ලෙසත් පෙත්සමෙන් ඉල්ලා ඇත. | (ආ) පසුව පෙත්සම්කරු විසින් කරන ලද ඉල්ලීම අනුව සේවා අවශ්‍යතාවය සලකා බලා 2018.08.07 වන දින සිට නැවත ස්වේච්ඡා නාවික උප සේවයේ සක්‍රිය සේවයට කැඳවා ඇති බව<br>(ඇ) සාමාන්‍යයෙන් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය පිළිබඳ චෝදනාවන්ට ලක්වන නාවික පුද්ගලයෙකුගේ නාවික සේවය 1982 නාවික හමුදා වැටුප් සංග්‍රහයේ 22 (4) (ආ) (III) වගන්තිය ප්‍රකාරව අත්හිටුවීමට කටයුතු කරන නමුත්, පෙත්සම්කරු ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරියෙකු බැවින් ඔහු වැටුප් රහිත අනිවාර්යය නිවාඩු යවා ඇති බව<br>(ඇ) ස්වේච්ඡා නාවික නිලධාරීන් සහ නිත්‍ය නාවික හමුදා නිලයන් සඳහා බලපවත්නා නීතීන් අතර පවතින වෙනස්කම් හේතුවෙන් මෙම අවස්ථාවේ දී පෙත්සම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බව | අනතුරුව නීතිපති දෙපාර්තමේන්තු නිලධාරින්ගේ සහභාගීත්වයෙන් නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය නිකුත් කරනු ඇත. |
| **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 60 | කේ.ජ්.එස්.උදේශානි මහත්මිය | 2009 වර්ෂයේ සිට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ, බැංකු සහකාර තනතුරෙහි | | කම්කරු විනිශ්චය සභාවේ විභාග වන |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | COM/PP/2025/39 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/04/NSB/ COPP දිනය : 2025.04.11 | සේවය කළ බවත්, 2023 වර්ෂයේ හක්මන ශාඛාවේ සේවයේ නිරතව සිටියදී අසත්‍ය චෝදනා මත පදනම්ව චෝදනා පත්‍රයක් ලබා දී අසාධාරණ අයුරින් සේවයෙන් පහ කළ බවත් සඳහන් කරන පෙත්සම්කාරිය සිය අහිමිවූ රැකියාව නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | | කරුණක් බව අනිවරණය වීම හේතුවෙන් කාරක සභාව පෙත්සම විභාග කිරීම්/නිර්දේශ නිකුත් කිරීම් අත්හිටුවන ලදී. |
| **පරිසර අමාත්‍යාංශය** | | | | |
| 61 | ඒ.ඒ.ඩී. නිහාල් කිත්සිරි මහතා COM/PP/2025/251 ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.07.22 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MWFRC/Dev/11/F R/LA/2022/10 දිනය : 2025.05.08 | කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පෙත්සම්කරුට අයත් අක්කර 50 ක ඉඩමෙහි, පුද්ගලයකු විසින් අනවසර වගාවක් පවත්වා ගෙන යන අතර ගහලගමුව බීට්ටු වන නිලධාරී, ගහලගමුව ග්‍රාම නිලධාරී හා කලවාන අඩවි වන නිලධාරී යන අය එක්ව එම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට යෝජනා කර ඇති බව සඳහන් කරන පෙත්සම්කරු, එම පවරා ගැනීම අවලංගු කර දෙන ලෙස හා ඉඩමට යෝජිත ප්‍රවේශ මාර්ගය ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුණි. | (අ) මෙම ඉඩම "රජය විසින් අයිතිවාසිකම් නොකියන ඉඩමක්" ලෙස සටහන් වී ඇති බවටත් එහෙත් කිසිවකු නිවැරදිව හිමිකම තහවුරු කිරීමට සමත් වී නොමැති බවටත්, එබැවින් අත්පත් යෝජනා සකස් කර ඇති බව (ආ) මෙම ඉඩම ආසන්නයේම පවතින කැබලි අංක 761 හා 762 යන ඉඩම් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන ලෙස හිමිකරුවන් විසින් ඉල්ලා ඇති බැවින් ඒ සඳහා අත්පත් යෝජනා සකස් කර නොමැති බව (ඇ) මේ පිළිබඳ ඉදිරි විභාග කිරීම් සිදු කිරීමට, අක්කර 50ක විශාලත්වයෙන් යුතු | වාර්තා කැඳවා ඇති අතර එම වාර්තා ලද පසු මෙම පෙත්සම කාරක සභාවේ දී නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය නිකුත් කරනු ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පෙත්සම්කරු විසින් තහවුරු කළ යුතු බවටත්, වන සංරක්ෂණ වාර්තාවක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින්ද, ඉඩම පිළිබඳ පරිසර වාර්තාවක් සහ අදාළ ඉඩම රජයට පවරා ගත යුතු ද එසේ නොමැති ද යන වගට නිශ්චිත පැහැදිලි කිරීමක් පරිසර අමාත්‍යාංශය වෙතින්ද ලබා ගත යුතු බව | |
| **සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය** | | | | |
| 62 | අජිත් ජයසේන මහතා COM/PP/2025/135 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MH/AD/01/03/PP/05/2025 දිනය : 2025.06.05 | 2021 වසරේ සිට කුරුණෑගල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය අංශයේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු ලෙස සේවය කරන බවත්, 2025 වසර සඳහා අවසන් සේවා ස්ථාන තනතුරක් ඉල්ලුම් කළ ද සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02-161-2024 හා 2024.11.07 දිනැති චක්‍රලේඛයෙන් එම තනතුර ලබා නොදුන් අතර ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ද සිදු කළ බවත්, අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්ගේ අංක 02-161/2024 හා 2024.12.03 දිනැති චක්‍රලේඛයෙන් නව අවසන් සේවා ස්ථාන තනතුරු සියල්ල අවලංගු කර පුරප්පාඩු තනතුරු සඳහා පමණක් අයදුම්පත් කැඳවන ලද බවත්, රාජ්‍ය සේවා | (අ) අවසන් සේවා තනතුරු ඇති කිරීම සේවා අවශ්‍යතාව මත සෞඛ්‍ය අමාත්‍යාංශයේ විද්වත් කමිටුවක් හරහා සිදු කරනු ලබන බවටත්, 2025 වසර සඳහා යෝජිත පුරප්පාඩු ලේඛනය සාධාරණීකරණ වාර්තාවක් රහිතව යොමු කර තිබූ බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව එය අනුමත නොකරන ලද බව<br>(ආ) උක්ත විද්වත් කමිටුව විසින් 2025 වසර සඳහා නව තනතුරු ඇති කර නොමැති බවත්, පවතින ස්ථාන මාරු | 2025 වසරට අදාළව අවසන් සේවා ස්ථාන තනතුරු ඇති කිරීම සම්බන්ධයෙන් වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ විද්වත් කමිටු වාර්තාව හා කුරුණෑගල ශික්ෂණ රෝහල ඇතුළු වෙනත් ශික්ෂණ රෝහල්වල ඇති කිරීමට හැකියාව පවතින බවට හඳුනාගත් අවසන් සේවා තනතුරුවල පුරප්පාඩු ඇතුළත් ලේඛනයක් කාරක සභාව වෙත යොමු කරන ලෙස දැනුම් දුන් අතර අදාළ වාර්තා ලද පසු ඉදිරි දිනයක දී මෙම පෙත්සම කාරක සභාවේ දී නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | කොමිෂන් සභාවේ සෞඛ්‍ය අනුකමිටුවේ උපදෙස් මත එසේ වෙනස් කරන ලද බව උක්ත චක්‍රලේඛයට අදාළ ආවරණ ලිපියේ සඳහන් කර ඇති බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 1617 හා 1994.02.02 දිනැති චක්‍රලේඛය අනුව ශික්‍ෂණ රෝහල්වල සේවය කරන අධිකරණ වෛද්‍ය විශේෂඥවරුන් අවසන් සේවා ස්ථාන දරන වෛද්‍යවරුන් ලෙස සලකන බව සැලකිල්ලට ගෙන අවසන් සේවා ස්ථාන තනතුරක් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු විසින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | තනතුරු අවසන් සේවා තනතුරු බවට පත්කිරීම පමණක් සිදු කර ඇති බවත්, අවසන් සේවා ස්ථාන තනතුරු ඇති කිරීමෙන් පසුව ස්ථාන මාරු සහිත තනතුරුවල පුරප්පාඩු සලකා බැලීම පිළිගත් ක්‍රමවේදය වන බැවින් 2025 වසරට අදාළ වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුව සැදීමේදී ඇති විය හැකිව තිබූ ප්‍රමාදය වළකා ගැනීම පිණිස නව තනතුරු ඇති නොකිරිමට තීරණය කරන ලද බවත්, එසේ වුව ද ඉදිරි වර්ෂවලදී සේවා අවශ්‍යතාව මත අලුතින් ශික්ෂණ රෝහල් බවට පත් කළ රෝහල්වල ද අවසන් සේවා ස්ථාන තනතුරු ඇති කිරිමට කටයුතු කරන බව<br>(ඇ) 2025 වර්ෂයට අදාළ නව සේවා තනතුරු ඇති නොකිරීම හේතුවෙන් පෙත්සම්කරුගේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවත්, මෑතකදී ඇති කළ වෙනත් ශික්ෂණ රෝහල්වල සහ කුරුණෑගල ශික්ෂණ රෝහලේ වෙනත් උප විශේෂඥ අංශ දෙකක් සඳහා මේ වන විටත් අවසන් සේවා තනතුරු | නිකුත් කරනු ඇත. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | ඇති කරන ලද බවත්, කුරුණෑගල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය අංශය සඳහා අවසන් සේවා තනතුරක් ඇති කිරීම සඳහා පෙත්සම්කරු සිදු කළ ඉල්ලීමට එම රෝහලේ අධ්‍යක්ෂගේ අනුමැතිය හිමි වී ඇති බවත්, පෙත්සම්කරු අවසන් සේවා ස්ථාන තනතුරක් ලැබීමට සුදුස්සෙකු වන බව | |
| **මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 63 | කේ.එම්. අජිත දසනායක මහතා COM/PP/2025/64 ගරු නන්ද බණ්ඩාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.05 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/48/2021 දිනය : 2022.02.18 | 1995.07.01 දින ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායේ උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස සේවයට බැඳුණු බවත්, 2005 වර්ෂයේ මාර්තු මාසයේදී කෑගල්ල පොලිස් කොට්ඨාසයේ මූලස්ථාන පොලිස් දූෂණ මර්ධන ඒකකයේ සේවය කරමින් සිටියදී එවකට සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් වැටලීමකට අදාළව පෙත්සම්කරුට විරුද්ධව පුද්ගල කණ්ඩායමක් මගින් පැමිණිල්ලක් ගොනු කරනු ලැබ ඇති බවත්, ඒ අනුව පෙත්සම්කරු ඇතුලු පස් දෙනෙකුට එරෙහිව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර තිබූ නඩුව අවසානයේදී වැරදිකරුවන් ලෙස තීන්දු කර, ගරු අධිකරණය විසින් අත්හිටුවූ සිරදඬුවම් ලබා දුන් බවත්, නඩුවට සමගාමීව සිදු කළ විනය පරීක්ෂණයේදී පෙත්සම්කරු ඇතුළු පිරිස නිදොස් කොට නිදහස් කරන ලෙස විනය පරීක්ෂණ නිලධාරියා විසින් යෝජනා | (අ) පෙත්සම්කරු කෑගල්ල දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති ලෙස සේවයේ යෙදී සිටියදී සිදු වූ සිද්ධියක් සම්බන්ධව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදුව සියලු චෝදනාවලට වරදකරු කර අත්හිටවූ සිර දඬුවම් නියම කර ඇති බවටත්, එම සිද්ධිය සම්බන්ධයෙන් පොලිසිය මූලික විමර්ශනයක් හා විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරන ලදුව පෙත්සම්කරු ඇතුලු සියලු චූදිත නිලධාරීන් නිදොස් කොට නිදහස් කර ඇති බව<br>(ආ) අංක 1449/12 හා 2006.06.15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ජාතික | පෙත්සම්කරුට එරෙහි වෙනත් චෝදනා ඔහුගේ සේවා වාර්තාවේ සඳහන් වේ නම්, අදාළ ලේඛන සහ අත්හිටවූ සිර දඬුවම් ලබා තිබීම හේතුවෙන් විනය නියෝග ප්‍රකාරව පෙත්සම්කරු සේවයෙන් පහ කර ඇති නමුත් එසේ අත්හිටවූ සිරදඬුවම් සහිතව දැනට සේවයේ යෙදී සිටින හෝ විනය නියෝග ප්‍රකාරව යම් දණ්ඩනයකට යටත් නොකළ නිලධාරීන් පිළිබඳ තොරතුරු ඔහු සතු වේ නම් එහි වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙස දැනුම් දෙන ලද අතර අදාළ වාර්තා ලද පසු ඉදිරි දිනයක දී මෙම පෙත්සම කාරක |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | කර තිබූ නමුත් පොලිස්පතිවරයා එය සැලකිල්ලට ලක් නොකරමින් සිය අභිමතය පරිදි සේවයෙන් නෙරපා දැමූ බවත්, සේවයෙන් පහ කිරීමේ නියෝගය අහෝසි කර නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | පොලිස් කොමිෂන් සභාව විසින් පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණයේ චූදිතයන් කරන ලද නිලධාරීන් සේවයෙන් පහ කිරීමට හෝ වෙනත් දඬුවම් ලබා දීමට හැකියාවක් පවතින බැවින් 2011.05.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති කල්ක්‍රියා විසින් පෙත්සම්කරු සේවයෙන් පහ කර ඇති බව<br>(ඇ) 1999 අංක 47 දරන (සංශෝධිත) අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි ධුරයක් සඳහා නුසුදුසුකමක් වීම හා ධුරය අහිමිවීම සඳහා නැතහොත් විශ්‍රාම වැටුප හෝ වෙනත් ප්‍රතිලාභයක් අහිමි කිරීම හෝ අත්හිටුවීම සඳහා අත්හිටවූ සිර දඬුවමක් බල නොපාන බවට වූ පෙත්සම්කරුගේ ප්‍රකාශය | සභාවේ දී නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය නිකුත් කරනු ඇත. |
| **විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය** | | | | |
| 64 | ජේ.ඒ.යූ.ඒ. පෙරේරා මහතා<br>COM/PP/2025/112<br>ගරු රුවන් මාපලගම මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.21 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව : FA/A13/Admin/ | 2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරියෙකු ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවයට බැඳී අභ්‍යන්තර අනුයුක්ත කිරීම් මත එහි විවිධ අංශවල සේවය කළ අතර, 2016.05.20 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පුරප්පාඩු වී පැවති විධායක සහකාර (සන්ධාන) තනතුරු | (අ) පෙත්සම්කරු විසින් පාර්ලිමේන්තු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත මෙම පෙත්සම ඉදිරිපත් කිරීමෙන් පසු අවස්ථාවක මේ පිළිබඳව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙතද | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ විභාග වන කරුණක් බැවින් කාරක සභාව පෙත්සම විභාග කිරීම/නිර්දේශ නිකුත් කිරීම අත්හිටුවන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | 2024 දිනය : 2025.04.09 | හතරක් සඳහා බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව සංවර්ධන නිලධාරි සේවයෙන් අයදුම්පත් කැඳවා, විවෘත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පෙත්සම්කරු ඇතුළු තවත් නිලධාරින් තිදෙනෙක් තෝරාගත් බවත්, එහිදී ආයතන සංග්‍රහයේ දක්වා නොමැති ආකාරයට තනතුරු නාමය පමණක් ලබා දෙමින් පත්වීම් ලිපි ලබා දුන් බවත්, පසුව අවස්ථා ගණනාවකදීම නිත්‍ය තනතුරට අන්තර්ග්‍රහණය කරන ලෙසට විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලීම් සිදු කළත් දේශපාලන මැදිහත් වීමක් මත වෙනත් දෙදෙනෙකුට පමණක් දෙපාර්තමේන්තුගත ස්ථිර පත්වීම් ලබා දීම හේතුවෙන් අගතියක් සිදු වී ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු මේ සම්බන්ධයෙන් සාධාරණ විභාගයක් කර ලබා දී ඇති පත්වීම, දෙපාර්තමේන්තුගත විධිමත් පත්වීමක් ලෙස ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | අභියාචනයක් ඉදිරිපත් කරන ලදුව එය මේ වන විට විභාග වෙමින් පවතින බව | |
| **කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 65 | පී.ආර්. ප්‍රදීපිකා විතාන මහත්මිය COM/PP/2025/165 ගරු කේ.සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.08.07 දින විභාග කරන ලදි. අමාත්‍යාංශ යොමුව MWCA/02/01/24/03 දිනය : 2024.01.08 | ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින කතරගම "නැණ සරණ" ළමා මධ්‍යස්ථානය වසා දැමීමට කටයුතු කළ බවත්, "නැණ සරණ" ළමා මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ සංවර්ධන කටයුතු මාස 03කට අත්හිටුවා පෙර පැවති ගොඩනැගිල්ලෙහිම පෙර සේවක මණ්ඩලයද සමඟ ළමා මධ්‍යස්ථානයේ කටයුතු | (අ) කතරගම ප්‍රදේශයේ වීදි දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ආරම්භ කර 2013 වසරේ ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතට පවරාගෙන මෙම ළමා සංවර්ධන මධ්‍යස්ථානය භෞතිකව මෙන්ම | රජයේ නව ප්‍රතිපත්තීන්වලට අනුකූල වන පරිදි සහ පවත්නා ළමා නීති සංශෝධනයන් අනුව පැන නැඟිය හැකි නව ළමා සංවර්ධන මධ්‍යස්ථානවල අවශ්‍යතා සැලකිල්ලට ගෙන දැනට වසා දමා ඇති "නැණ සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය නැවත ස්ථාපනය කිරීම |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | නැවත ආරම්භ කර මාස 03ක කාලයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලෙසට නවවැනි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශය අදාළ නිලධාරින් විසින් ක්‍රියාත්මක කර නොමැති බවත් සඳහන් කර ඇති පෙත්සම්කාරිය, අදාළ නිලධාරින් කැඳවා නැවත විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | ගුණාත්මකව ඉහළ ප්‍රගතියක් අත්කර ගත් නමුත්, 2017 වසරෙන් පසු "නැණ සරණ" ළමා සංවර්ධන මධ්‍යස්ථානය විශාල ගැටලු රාශියකට මුහුණ දී 2023 වසරේ වසා දමා ඇති බව<br>(ආ) නිලධාරී සහ සේවක හිඟය රජයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑමේදී ප්‍රධාන ගැටලුවක් වී ඇති බව<br>(ඇ) පරිවාස ගතවන දරුවන් ලෙස වින්දිත දරුවන්, ළමා සැකකරුවන් සහ ළමා වැරදිකරුවන් එකම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක රැඳවීම තුළින් ඔවුන්ට රැකවරණය දීමේදී සහ පුනරුත්ථාපනය කිරීමේදී ගැටලු රාශියක් පැන නඟින බවට හඳුනාගෙන ඇති බව | පිළිබඳව තක්සේරුවක් සිදු කර මේ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. අදාළ වාර්තාව ලද පසු ඉදිරි දිනයක දී මෙම පෙත්සම කාරක සභාවේ දී නැවත විභාගයෙන් අනතුරුව අවසන් නිර්දේශය නිකුත් කරනු ඇත. |

# ආදර්ශ පෙත්සමක ආකෘතිය

"ගරු කථානායකතුමනි,
මෙම පෙත්සම ඉදිරිපත් කරමි."

------------------------------------------

ඉදිරිපත් කරන මන්ත්‍රීතුමාගේ අත්සන, දිනය හා නිල මුද්‍රාව

පෙත්සම්කරුගේ සම්පූර්ණ නම :
පදිංචි ලිපිනය : ( සාමාන්‍ය පදිංචි ලිපිනය සඳහන් කරන්න)
ජාතික හැඳුනුම්පත් අංකය :
ස්ථාවර දුරකථන අංකය :
ජංගම දුරකථන අංකය :
අත්සන :
දිනය :

ගරු කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

ගරු කථානායකතුමනි,

(හිසිය) සිදුවී ඇති අසාධාරණය, බලාපොරොත්තු වන විසඳුම හැඳින්වෙන මාතෘකාවක් කෙටියෙන් විය යුතුය)

(සිදුවී ඇති අසාධාරණය)

සිදුවීමට අදාළ කරුණු පැහැදිලිව දින වකවානු සහිතව, එම සිදුවීම සහ අගතියට පත් පුද්ගලයා පිළිබඳව අදාළ ආයතනයට හෝ අමාත්‍යාංශයට සන්නිවේදනය කළ කරුණු ගත හැකි වන ආකාරයට අනුපිළිවෙළ හා වැදගත් කරුණු සමඟින් සංක්ෂිප්ත භාෂාවෙන් ඉදිරිපත් කළ යුතුය. අදාළ ලේඛන ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතු අතර, එයට සම්බන්ධ නොවූ ලිපි, ලේඛන හෝ ඒවායේ පිටපත් අමුණා නොතිබිය යුතුය.

(අපේක්ෂිත සහනය)

ඉල්ලා සිටින සහනය කුමක් ද යන්න නිශ්චිතව සඳහන් කළ යුතුය.

(පෙත්සම්කරුගේ අත්සන )------------------------------------

පෙත්සම්කරුගේ අත්සන/ ඇඟිලි සලකුණ (ලිවීමට නොහැකි අයෙකු විසින් සාක්ෂිකරුවකු ඉදිරියේ තම ඇඟිලි සලකුණ තැබිය යුතුය)

**Comment 1:** මෙම සටහන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් පෙත්සමේ ම ඉහළින් පැහැදිලිව අත්සන් තැබිය යුතුය. (පෙත්සම මන්ත්‍රීතුමාගේ ආවරණ ලිපියක් සහිතව ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නොවේ)

**Comment 2:** උදා - දිසානායක මුදියන්සේලාගේ පද්මා කුමාරි

**Comment 3:** උදා - 10/3, පිලියන්දල පාර, මහරගම

**Comment 4:** මෙම පෙත්සමෙන් ඉල්ලා සිටින සහනයට අදාළව, මීට පෙර පෙත්සමක් ඉදිරිපත් කර තිබේ නම් එම පෙත්සමේ අංකය සඳහන් කිරීම වඩාත් සුදුසුය

**Comment 5:** වැරදි ලෙස නිවාඩු ලබා සිටිය දී අහිමි කළ මාගේ රැකියාව නැවත ලබා ගැනීම

**Comment 6:** උදා - දිසානායක මුදියන්සේලාගේ පද්මා කුමාරි වන මම 2015.01.0 දින අනුමැතිය ලත් පොලිස් කොස්තාපල්වරයකු වශයෙන්(පො.කො. 14734) ශ්‍රී ලංකා පොලිසියට බැඳී මහරගම පොලිසියේ සේවය කරමින් සිටිය දී 2018.05.30 දින හදිසි ලෙස අසනීප වීම නිසා වෛද්‍ය ලෙස දින 02 කට නිවාඩු අනුමත කර සේවා ස්ථානයෙන් ඉවත් වූයෙමි. එහෙත් සහතික කළ වීම නිසා කාර්යාලීය නිලධාරීන් සේවය ලබා ගැනීමට සිදු විය. මම පොලිසියට පැමිණ මහ විදුලි පරිපූර්ණ වටින් 2018.06.02 වන දින සේවා ස්ථානය දැනුම් කළෙමි. එහෙත් 2018.06.15 දිනැති ලිපියෙන් 2018.06.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මා සේවය අත්හැර ගිය සේවයට වාර්තා නොකළ බව සඳහන් කර සේවය හැර යෑමේ නියෝගය නිකුත් කර ඇත. විදුලි පරිපූර්ණයේ ලදුපත, වෛද්‍ය වාර්තාව පිටපත් හා අනෙකුත් අදාළ ලිපි ලේඛන අමුණා පිටපත් දී ඉදිරිපත් කළ හැක.

**Comment 7:** ගරු කථානායකතුමනි, මේ පිළිබඳව සොයා බලා මා හට නැවත රැකියාව ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. (මෙහි දී සාධාරණය ඉටු කර දෙන ලෙස හෝ සහනයක් ලබාදෙන ලෙස පමණක් සඳහන් නොකර බලාපොරොත්තු වන සහනය හෝ උදාහරණය දැක්වීම සහිත නිශ්චිතව සඳහන් කළ යුතුය)